# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## ශ්‍රී ලංකාව

## හතලිස්වැනි වාර්ෂික වාර්තාව

# 2018

# පටුන


| | | පිටුඅංකය |
|---|---|---|
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම සහ මෙහෙවර | ii |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව(UGC) | iv |
| | හැඳින්වීම | iv |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය | iv |
| | විධායක සාරාංශය | v |
| | වගු ලැයිස්තුව | xiv |
| 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කළමනාකාරිත්වය | 1 |
| 02 | විශ්වවිද්‍යාල කළමනාකරණය | 2 |
| 03 | ආයතන | 6 |
| 04 | විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම | 8 |
| 05 | අධ්‍යයන සංවර්ධනය සහ අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම | 18 |
| 06 | මූල්‍ය පරිපාලනය | 27 |
| 07 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව | 33 |
| 08 | මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය | 35 |
| 09 | විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට උසස් අධ්‍යාපනය සඳහා සහාය ලබා දීම | 38 |
| 10 | යටිතල පහසුකම් සංවර්ධනය | 44 |
| 11 | තොරතුරු තාක්ෂණ සහාය | 46 |
| 12 | විශ්වවිද්‍යාල සිසුන් සඳහා මූල්‍ය ආධාර | 48 |
| 13 | කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ සංවර්ධන ක්‍රියාකාරකම් | 50 |
| 14 | ජාතික යහපත වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද විශේෂ පැවරුම් | 51 |
| 15 | නීති කටයුතු | 51 |
| 16 | විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය (USAB) | 54 |
| 17 | මධ්‍යම අභ්‍යන්තර විගණනයේ කටයුතු | 54 |
| 18 | ප්‍රකාශන සහ වාර්තා | 56 |
| 19 | තත්ත්ව රක්ෂණ කවුන්සිලයේ කාර්යභාරය සහ කටයුතු (QAC) | 56 |
| 20 | ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාතාව/සාධාරණත්වය | 62 |
| 21 | 2018වර්ෂය තුළ දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ ලිපි | 66 |
| 22 | වඩාත් හොඳ සේවාවක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පහසුකම් වැඩි දියුණු කිරීම | 68 |
| 23 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2018දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | 69 |
| 24 | විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | 92 |
| 25 | විශ්වවිද්‍යාල අර්ථසාදක අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන | 106 |

26 ඇමුණුම්

(a).2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා සාමාන්‍ය ප්‍රවේශය යටතේ දිස්ත්‍රික්ක වශයෙන් හා අධ්‍යයන පාඨමාලා වශයෙන් විවිධ අධ්‍යයන පාඨමාලා සඳහා තෝරා ගත් සිසුන් සංඛ්‍යාව 118

*(ඇමුණුම i)*

(b). 2017/2018 අධ්‍යන වර්ෂය සඳහා සාමාන්‍ය ප්‍රවේශය හා විශේෂ ප්‍රවේශය යටතේ විවිධ අධ්‍යයන පාඨමාලා සඳහා තෝරාගත් සිසුන් සංඛ්‍යාව 123

*(ඇමුණුම ii)*

# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම සහ මෙහෙවර

## දැක්ම

2020 වන විට ශ්‍රී ලංකාව කලාපය තුළ දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට සහ ආසියාව තුළ උසස් අධ්‍යාපනයෙහි නියමවකු බවට පත් කරලීම.

## මෙහෙවර

ජාතික සංවර්ධනය හා සමගාමීව,ගුණාත්මක ඉගැන්වීම් ඉගෙනුම්, ඉහළ ප්‍රතිඵලදායී පර්යේෂණ, නවෝත්පාදන ව්‍යවසාය,නිර්මාණාත්මක ප්‍රජා දායකත්වය, සාමය හා සමගිය සහ ක්‍රමෝපායික ජාත්‍යන්තර සහයෝගය සඳහා කැපවූ තිරසාර, පුළුල් ලෙස පිළිගනු ලබන, ප්‍රවේශ්‍ය උසස් අධ්‍යාපන පද්ධතියක් සඳහා යහපාලනය සහ කළමනාකාරීත්වය තුළින් මග පෙන්වීමට , ස්ථාපනය කිරීමට සහ සංවර්ධනය කිරීම.

# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC)

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ මග පෙන්වීම හා සම්බන්ධීකරණය සඳහා කටයුතු කරන ප්‍රධානතම ආයතනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) 1978 දෙසැම්බර් 22 වන දින අංක 16 විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන වගකීම් අතරට උසස් අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය, උසස් අධ්‍යාපන ආයතනවලට මුදල් වෙන් කිරීම, උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම, උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම නියාමනය හා රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනය නියාමනය කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් සියලුම රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රගතිය සහ සංවර්ධනය සඳහා සහාය වීම අයත් වේ.

සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වන අතර කොමිෂන් සභාවේ කටයුතු දෛනිකව පරිපාලනය කිරීම හා කොමිෂන් සභා රැස්වීම්වල සභාපතිත්වය දැරීම සිදු කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධීකරණය හා අනුකූලනය පිණිස වෙන් කරන ලද රාජකාරී හා කාර්යයන් සහිත දෙපාර්තමේන්තු, අංශ හා ඒකක ඇත. විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන අතරට විශ්වවිද්‍යාල 15ක්, පශ්චාත් උපාධි ආයතන 11ක් හා ආයතන 7ක් ඇතුළත් වේ. පාලක සභාව එක් එක් විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය වන අතර සනාතන සභාව අධ්‍යයන කටයුතු සම්බන්ධ උත්තරීතර සභාව වේ.විශ්වවිද්‍යාලයක සහ ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියා අනුපිළිවෙළින් උපකුලපති හා අධ්‍යක්ෂ වේ.

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධානයන් ප්‍රකාරව කොමිෂන් සභාව පහත අරමුණු සමඟ ස්ථාපනය කොට ඇත:

1. ජාතික ප්‍රතිපත්තිය හා අනුකූලව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
2. විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා අදාළව පාර්ලිමේන්තුව මඟින් වෙන් කරන ලද අරමුදල් උසස් අධ්‍යාපන ආයතන අතර බෙදා දීම, සහ එවැනි එක් එක් උසස් අධ්‍යාපන ආයතනය මඟින් සිදු කරන වියදම් පාලනය කිරීම.
3. උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගැනීම.
4. උසස් අධ්‍යාපන ආයතනයන්හි පරිපාලනය නියාමනය කිරීම.
5. එක් එක් උසස් අධ්‍යාපන ආයතනය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම නියාමනය කිරීම, සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් හෝ යටතේ කොමිෂන් සභාව වෙත පැවරූ,
6. ආරෝපිත හෝ වෙන් කරන ලද එවැනි බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

# විධායක සාරාංශය

මෙම වාර්ෂික වාර්තාව, 2018 වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ක්‍රියාවට නංවන ලද කාර්යයන් සමාලෝචනය කරයි. සමාලෝචිත වර්ෂයේ මූලික වැදගත් අවස්ථා සහ ජයග්‍රහණයන්, විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම, අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය, කාර්ය මණ්ඩල සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, තොරතුරු තාක්ෂණ සංවර්ධනය, තත්ත්ව සහතිකකරණය, මූල්‍යමය පරිපාලනය හා කළමනාකරණය සහ විදේශ විශ්වවිද්‍යාල සමඟ අධ්‍යයන සහයෝගීත්වය හා පර්යේෂණ සහයෝගීත්වය යන ක්ෂේත්‍රයන් යටතේ සාරාංශගත කර ඇත.

2013-2017 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ක්‍රමෝපාය සැලැස්ම 2018 වර්ෂය දක්වා දීර්ඝ කිරීමත් සමඟ 2018 වාර්ෂික වාර්තාවෙහි දක්වා ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී, 2013-2017 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ක්‍රමෝපාය සැලසුමෙහි ඉලක්ක, අරමුණු, සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI), රට තුළ පැන නගින අපේක්ෂා හා අවශ්‍යතා, යෝජිත දැනුම පදනම් කර ගත් ආර්ථිකයෙහි මානව අවශ්‍යතා, සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සැලකිල්ලට ගන්නා ලදි.

**2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල /රාජ්‍ය උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම**

2018 ජනවාරි මාසයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, 2017 වර්ෂයේ පවත්වන ලද අ.පො.ස උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව, 2017/2018 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවන ලදි. ඒ අනුව සාමාන්‍ය ප්‍රවේශය යටතේ එක් එක් උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම අවසන් කරන ලද අතර කඩඉම් ලකුණු 2018 ජූලි මාසයේ දී නිකුත් කරන ලදි. එසේම, විශේෂ විධිවිධාන යටතේ සිසුන් තෝරා ගැනීම ද සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ දී අවසන් කරන ලදි.

2017/2018 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ ප්‍රධාන තොරතුරු පහත සාරාංශ ගත කර ඇත;

| | |
|---|---|
| 2017 අගෝස්තු අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂකයින් සංඛ්‍යාව | **253,357** |
| නිකුත් කරන ලද අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව 2017/2018 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබූ සිසුන් සංඛ්‍යාව | **163,160** |
| තෝරාගත් / ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව:<br>(1) සාමාන්‍ය<br>(2) විශේෂ ප්‍රවේශය[(1)] | <br>**30,141**<br>**409** |
| **තෝරාගත් / ඇතුළත් කර ගත් මුළු සිසුන් සංඛ්‍යාව** | **30,550** |

**සටහන** : [(1)] **විශේෂ ප්‍රවේශය**: මෙමගින්, නියෝජනය වන්නේ, විශේෂ විධිවිධාන යටතේ එනම්, ජාතික/අන්තර්ජාතික මට්ටමින් අධ්‍යයන හැර වෙනත් ක්ෂේත්‍රවල විශිෂ්ට දක්ෂතා දැක්වූ සිසුන්, සන්නද්ධ සේවා හා පොලිස් සේවය, අන්ධ හා ශාරීරික අශක්නුතාවන් ඇති සිසුන්, ගුරුවරුන් හා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ අභියාචනා යටතේ විශ්වවිද්‍යාල වලට ඇතුලත් කර ගන්න ලද සිසුන් වේ. කෙසේ වෙතත්, **2017/2018** අධ්‍යයන වර්ෂට අදාලව විශේෂ විෂයයන් සඳහා අතිරේක බඳවා ගැනීම් යටතේ ඇතුළත් කර ගන්නා සිසුන් මෙහි ඇතුළත් කර නොමැති අතර එම කටයුතු තවමත් අවසන් කර නොමැත.

විශ්වවිද්‍යාල ප්‍රවේශය වැඩි කිරීමේ අරමුණින්, **2018** වර්ෂයේ දී විශ්වවිද්‍යාල පද්ධතියේ ඇති අධ්‍යයන පාඨමාලා ලැයිස්තුවට නව අධ්‍යයන පාඨමාලාවක් එක් කරන ලද අතර **2017/2018** අධ්‍යයන වර්ෂය සඳහා පහත පරිදි ක්‍රියාත්මක කරන ලදි;

අධ්‍යයන පාඨමාලාව: මූල්‍ය ඉංජිනේරු විද්‍යාව
විශ්වවිද්‍යාලය: මොරටුව විශ්වවිද්‍යාල
ප්‍රවේශ සංඛ්‍යාව: **50**

අධ්‍යයන සහ පර්යේෂණ සංවර්ධන

පුළුල් සහභාගීත්වය සහ උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා දේශීය හා ගෝලීය වශයෙන් පිළිගත් නව පාඨමාලා සහ උපාධි වැඩසටහන් හඳුන්වා දීමට විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන දිරිමත් කරන ලදි. මෙම උත්සාහයට සහය දැක්වීම සඳහා, 2018 වර්ෂය තුළ පහත සඳහන් දෑ සඳහා අනුමැතිය ලබා දෙන ලදි;

- යාපනය විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ලංකාවේ සබරගමුව විශ්වවිද්‍යාලයේ නව පීඨ දෙකක් (02)
- නව අධ්‍යයනාංශ විසි හතක් (27)
- නව අධ්‍යයන පාඨමාලා එකක් (01)
- නව උපාධි අපේක්ෂක වැඩසටහන් දොළහක් (12)
- නව බාහිර උපාධි වැඩසටහන් එකක් (01)
- නව පශ්චාත් උපාධි වැඩසටහන් හතක් (07)

තවද සිසුන්ට වැඩි අවස්ථාවන් ප්‍රමාණයක් දීම සඳහා, රටේ වර්තමාන අවශ්‍යතාවන්ට අදාළ වන පරිදි නව දැනුම හා කුසලතා හඳුන්වා දෙමින් පවත්නා උපාධි වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීමට පියවර ගන්නා ලදි. ඒ අනුව 2018 වර්ෂයේ දී අධ්‍යයනාංශ දෙකක (02) නම් වෙනස් කිරීමක් සහ උපාධි අපේක්ෂක පාඨමාලා හතළිස් හයක (46) නම් වෙනස් කිරීමක් සිදු කරන ලදි.

2018 වර්ෂයේ දී විවිධ විෂයන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ ස්ථාවර කමිටු දහඅටක් (18) සහ තවත් එක් (01) කමිටුවක් ක්‍රියාත්මක වූ අතර එමගින් අදාළ විෂය ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනයට සම්බන්ධ කරුණු පිළිබඳව කොමිෂන් සභාවට කරුණු වාර්තා කිරීම සහ නිර්දේශ කිරීම සිදු කරන ලදි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සිය සමාරම්භක 'ජාතික නීති ගුරු සමුළුව', 2018 ජනවාරි 26 වන දින පැවැත්වූ අතර ඒ සඳහා අගවිනිසුරුවරයා ද සහභාගී වූ අතර එය මෙරට අගවිනිසුරුවරයෙකු විසින් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ ඉහළම ආයතනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පැමිණි පළමු අවස්ථාව ලෙස ද සනිටුහන් විය. රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ නීති ගුරුවරුන් සඳහා ශ්‍රී ලංකාව තුළ මෙවැනි සමුළුවක් සංවිධානය කළ පළමු අවස්ථාව මෙය වන අතර සම්මන්ත්‍රණ තේමාව වූයේ "නීති අධ්‍යාපනයේ අදාළත්වය ඇගයීම" යන්නයි. මෙය ජාතික වැදගත්කම පිළිබඳ වැඩමුළුවක් ලෙස සැලකිය හැකි අතර, සහභාගිවන්නන් විසින් ලබා දී ඇති තේමාව යටතේ ප්‍රධාන අංශ නවයක් ගවේෂණය කළ අතර සවිස්තරාත්මක සාකච්ඡා තුළින් නිර්දේශ දහයක් ඉදිරිපත් කරන ලදි.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල සිටින උපාධි අපේක්ෂකයන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ පවත්වනු ලබන ජාතික මට්ටමේ පරීක්ෂණයක් වන ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL) පැවැත්වීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ " UTEL පරීක්ෂණ සේවා " නමින් මධ්‍යස්ථානයක් පිහිටුවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ දී මූලික පියවර ගන්න ලදි. ඒ අනුව, යෝජිත මධ්‍යස්ථානය හරහා දිගුකාලීනව ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය පිරිනැමීමේ ශක්‍යතාව පරීක්ෂා කිරීමේ අරමුණින් UTEL නියමු පරීක්ෂණය 2018 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී පවත්වන ලදි.

මූල්‍ය පරිපාලනය සහ කළමනාකරණය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉල්ලීම මත 2018 වර්ෂය සඳහා මිලියන 56,239.50ක මුදලක් මහා භාණ්ඩාගාරයේ අනුමැතියෙන් වෙන් කරන ලදි. මෙයින් රු.36,785.50 ක් පුනරාවර්තන වියදම් වන අතර ඉතිරි රු.19,454.00 ප්‍රාග්ධන ප්‍රදාන වේ. 2018 වර්ෂය අවසන් වන විට, වෙන් කරන ලද අරමුදල්වලින් 97.6% සහ 72.4% පිළිවෙලින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා යොදවා ඇති අතර එමගින් 88.9% ක් වන රු.මිලියන 50,033.00 ඒකාබද්ධ උපයෝජනයක් පෙන්නුම් කෙරේ.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, භාණ්ඩාගාරය විසින් හඳුන්වා දී ඇති යහපත් කළමනාකරණ පිළිවෙත් අනුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන් හි පරිපාලන හා මෙහෙයුම් කටයුතුවල සියලු වැදගත් අංශ අධීක්ෂණය කිරීමේ අරමුණින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පහක් (05) පවත්වන ලදි. තවද, පද්ධතිය තුළ නිසි පාලනයක් සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ

මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය, විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනයන් හි අභ්‍යන්තර විගණන අංශ සමඟ නිරන්තරයෙන් සම්බන්ධීකරණය විය.

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත මගින් පවරා ඇති බලතල, රාජකාරි සහ කාර්යයන් ප්‍රකාරව, 2018 වර්ෂයේ දී කොමිෂන් සභා චක්‍රලේඛ 26 ක් සහ ආයතන චක්‍රලේඛ ලිපි 18 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල සුමට ක්‍රියාකාරීත්වය සඳහා කොමිෂන් සභා රැස්වීම්වලදී ගත් තීරණ හා ප්‍රතිපත්තිවලට අදාළ උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දීම පිණිස මෙම චක්‍රලේඛ නිකුත් කරන ලදි.

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල කටයුතු කළමනාකරණය**

විධායක හා විධායක නොවන කාර්ය මණ්ඩලය ආවරණය වන පරිදි 2018 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 306 ක් විය. 2018 දෙසැම්බර් 31 වන විට පවත්නා කාර්ය මණ්ඩලය 250ක් වූ අතර පුරවා නොමැති පුරප්පාඩු 18% ක් පැවතුණි. 2018 වර්ෂය තුළදී නව පුද්ගලයින් 36 දෙනෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවයට එක් වූ අතර එයට නව පත්වීම් 33 ක් සහ උසස් අධ්‍යාපන ආයතනවලින් පැමිණි ස්ථාන මාරුවීම් 3 ක් ඇතුළත් විය. එමෙන්ම, උසස් අධ්‍යාපන ආයතන වෙත මාරුවීම්, උසස් අධ්‍යාපන ආයතන/ වෙනත් රජයේ ආයතන වෙත මුදා හැරීම්, විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම් මෙන්ම තනතුරේ නිවාඩු ගැනීම් සහ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීම හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවයෙන් ඉවත් වූ පුද්ගලයින් ගණන 30 කි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ 2018 වර්ෂයේ දී රැකියා උසස්වීම් 14 ක්, සේවා ස්ථිර කිරීම 12 ක්, සේවක ආපසු හැරවීම් 1 ක් සහ අභ්‍යන්තර ස්ථාන මාරුවීම් 15 ක් වාර්තා වූ අතර,විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වසර 25 කට වැඩි කාලයක් සිදු කළ දීර්ඝ සහ ප්‍රශංසනීය සේවය වෙනුවෙන් සේවකයින් පහළොස් දෙනෙකු පිළිගැනීමට ලක් වූ අතර ඔවුන්ට ත්‍යාග වශයෙන් මුදල් ප්‍රදාන ද හිමි විය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සිය කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කුසලතා සහ වෘත්තීය දැනුම වැඩි දියුණු කර ගැනීම සඳහා බොහෝ අවස්ථාවන් ලබා දෙන ලදි. සමාලෝචිත වර්ෂය තුළ විධායක කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 11 දෙනෙක් සහ විධායක නොවන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 43 දෙනෙක් දේශීයව පවත්වන ලද කෙටිකාලීන පුහුණු හා සංවර්ධන වැඩමුළු සඳහා සහභාගී වූ අතර විධායක කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 12 දෙනෙකුට කෙටිකාලීන විදේශ පුහුණුව ලබා දෙන ලදි. තවද, වැඩි දියුණු කළ වැඩ දැනුම හා නිරාවරණය තුළින් සේවකයන්ගේ වෘත්තීය සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා විධායක කාර්ය මණ්ඩලයේ සේවකයින් තිදෙනෙකුගේ MBA පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා මූල්‍ය ආධාර ලබා දෙන ලදි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ සහයෝගයෙන්, 2018 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සියලුම ස්ථිර සේවකයින් සඳහා ආකර්ශනීය හා සාධාරණ ගාස්තුවකට ලබා දෙන පුද්ගලික ගිණුම් පවුල් ආවරණයක් සමඟ වැඩි දියුණු කළ ප්‍රතිලාභ සහිත සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා දෙන ලදි.

**විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා මානව සම්පත් සහාය**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) විසින් 2018 වර්ෂයේ දී විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා නව සේවක තනතුරු 958 ක් අනුමත කරන ලදි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශ මත පදනම්ව සිදුකරන ලද මෙම වැඩිවීම පසුගිය වසර 5 තුළ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ඉහළම නව සේවක සංඛ්‍යාවන් ලෙස සටහන් විය.

2018 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, සිය ආයතනයට හිමි වගකීම යටතේ විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවලට පරිපාලන ශ්‍රේණියේ පත්වීම්/උසස්වීම්, එනම් පත්වීම් 139 ක් සහ උසස්වීම් 23 ක් ලබා දී ඇත. මීට අමතරව, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ස්ථාන මාරුවීම් 218 ක් සිදු කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වර්ෂය තුළදී වෙනත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම් 7 ක් සහ උසස්වීම් 8 ක් ලබා දී ඇත.

2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාස 12 ක කාලය තුළ සහනදායි කොන්දේසි මත මෝටර් වාහන බලපත්‍ර ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවලින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අයදුම්පත් 2102 ක් ලැබී ඇති අතර එය නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා නියමිත වේලාවට ක්‍රියාත්මක කරනු ඇත.

**විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සඳහා සහාය සහ ආධාර ලබා දීම**

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අධ්‍යයන කාර්ය මණ්ඩලයට, විශේෂයෙන්ම තරුණ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ උසස් අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීමට අවස්ථා නිර්මාණය කිරීමට කටයුතු කළේය. මෙම කටයුතු මූලික වශයෙන් පර්යේෂණ හා ජාත්‍යන්තර සහයෝගීතා අංශය (DRIC) හරහා සිදු කරන ලද අතර ඒවා පහත පරිදි වේ;

- රාජ්‍ය විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතනවල කථිකාචාර්යවරුන් 18 දෙනෙකුට (පළමු වටයේ අයදුම්කරුවන් 2018 දෙනෙකුගෙන් තෝරා ගත්) තම ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන (ජීවන වියදම් ද ඇතුළුව උපරිම වශයෙන් වසරකට මිලියන 3.5 ක් දක්වා) ලබා දුන් අතර දෙවන වටය සඳහා තේරීම් තවමත් සිදු වෙමින් පවතී.
- කුවීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ (QUT) පශ්චාත් උපාධි යෝජනා ක්‍රමය වැඩි දියුණු කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ කුවීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය අතර නව අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ අතර එමගින් කුවීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාල විසින් විශ්වවිද්‍යාල ශාස්ත්‍රඥන්ගේ ආචාර්ය උපාධිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා වාර්ෂිකව පර්යේෂණ පුහුණු වැඩසටහන් හිලව් ගාස්තු (ජාත්‍යන්තර) අනුග්‍රාහකත්වයන් 12ක් දක්වා ලබා දෙනු ඇත.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - ජපාන ජාත්‍යන්තර විශ්වවිද්‍යාල (IUJ) පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ආචාර්ය උපාධිය සඳහා අයදුම්කරුවන් 3 දෙනෙකු සහ ශාස්ත්‍රපති උපාධිය සඳහා සඳහා අයදුම්කරුවන් දෙදෙනෙක් තෝරා ගැනීම.
- ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය (GUQ) සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර අවබෝධතා ගිවිසුමක් සකස් කර එය 2019 වර්ෂයේ මුල් භාගයේ දී කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. එය අත්සන් කළ පසුව එමගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ඔවුන්ගේ ආචාර්ය උපාධි අවශ්‍යතා (Ph.D.) ක්වීන්ස්ලන්ත ග්‍රිෆිත් විශ්වවිද්‍යාලයේ සම්පූර්ණ කිරීමට පහසුකම් සපයයි.
- ජර්මනියේ හයිඩෙල්බර්ග් විශ්වවිද්‍යාලයේ දකුණු ආසියානු ආයතනයේ (SAI) ශ්‍රී ලංකා මූලාසනය පවත්වා ගෙන යාම සඳහා ආධාර සැපයීමෙන් ශ්‍රී ලංකා රජය සහ ජර්මනියේ හයිඩෙල්බර්ග් විශ්වවිද්‍යාලය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම.
- එක්සත් රාජධානියේ පොදුරාජ්‍ය මණ්ඩලීය වෛද්‍ය ශිෂ්‍යත්ව - 2018 සඳහා අපේක්ෂකයින් 4 දෙනෙකු කෙටි ලැයිස්තුගත කිරීම හා නම් කිරීම.
- "උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීම" (AHEAD) වැඩසටහන පිළිබඳ හඳුන්වාදීමේ වැඩමුළුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශ්‍රවණාගාරයේ පැවැත්වීම. ලෝක බැංකු නිලධාරීන්ගේ සහයෝගයෙන් මෙය සංවිධානය කරන ලද අතර, විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් සහ සියලුම විශ්වවිද්‍යාලවල ජ්‍යෙෂ්ඨ ශාස්ත්‍රඥයින් කිහිපදෙනෙක්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අදාළ නිලධාරීන් සමඟ මෙයට සහභාගී විය.
- 2019 වර්ෂයේ දී රාජ්‍ය විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට වැඩි උසස් අධ්‍යාපන අවස්ථා ප්‍රමාණයක් ලබා දීමේ අරමුණින් එරාස්මස් + වැඩසටහන සහ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අංශය අතර සහයෝගීතාවයක් සඳහා සාකච්ඡා ආරම්භ කිරීම.
- විවිධ වර්ගයේ ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් පිළිබඳව විවිධ ආයතනයන්ගෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබුණු දැනුම්දීම් 26 ක් පිළිබඳව සියලුම / අදාළ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වෙත නිසි ලෙස සන්නිවේදනය කිරීම.

**උසස් අධ්‍යාපන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධන කටයුතු**

අලුතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාලවල නව ඉදිකිරීම්, සිදු කෙරෙමින් පවතින ව්‍යාපෘති, පුනරුත්ථාපන ව්‍යාපෘති, අත්කර ගැනීම් සහ යටිතල පහසුකම් සඳහාත් දැනට පවත්නා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල ධාරිතා වර්ධනය සඳහාත් සමාලෝචිත වර්ෂය තුළ වෙන් කර ඇති මුළු මුදල රු.මිලියන 19,469කි. කෙසේ වෙතත්, අරමුදල් නිදහස් කිරීමේදී භාණ්ඩාගාරය විසින් පනවා ඇති විවිධ සීමා කිරීම් හේතුවෙන් වසර අවසානය වන විට විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වෙත ලැබී ඇත්තේ රු. මිලියන 14,098 ක මුදලකි.

විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවලින් නව ව්‍යාපෘති යෝජනා 48 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී ඇති අතර, ඉන් ව්‍යාපෘති 26 ක් අනුමත කර ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට (NPD) ඉදිරිපත් කරන ලදි. නව ව්‍යාපෘති 14 ක් සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇති අතර, පෙර වර්ෂවල ක්‍රියාවට නංවන ලද ව්‍යාපෘති යෝජනා ඇතුළු ව්‍යාපෘති 19 ක් අමාත්‍ය මණ්ඩලය විසින් වර්ෂය තුළ අනුමත කරන ලදි. ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 30,248 ක් වූ ව්‍යාපෘති 98ක් සම්පූර්ණ කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දෙන ලද අතර නව ව්‍යාපෘති 11 ක් 2018 වර්ෂයේ දී භෞතිකව ආරම්භ කරන ලදි. රු.මිලියන 47,783 ක ඉදිකිරීම් ව්‍යාපෘති 90 ක් වර්ෂය අවසාන වන විට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ විවිධ සැලසුම් හා ඉදිකිරීම් අදියරයන් හි ක්‍රියාත්මක වෙමින් පවතී.

පහත දැක්වෙන්නේ 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක වෙමින් පැවති විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ය;

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ බහුකාර්ය ගොඩනැගිල්ල - රු.මිලියන 1,364
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ්‍යය පීඨයේ බහුකාර්ය ගොඩනැගිල්ල - රු.මිලියන 1,761
- තාක්ෂණ පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය - රු.මිලියන 2,087
- තාක්ෂණ පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - රු.මිලියන 2,640
- ද්‍රව්‍ය විද්‍යා හා ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශයේ ගොඩනැගිල්ල, මොරටුව විශ්වවිද්‍යාලය - රු. මිලියන 439
- යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා ගොඩනැගිල්ල, මොරටුව විශ්වවිද්‍යාලය - රු.මිලියන 247
- පරිගණක විද්‍යා අධ්‍යයනාංශයේ ගොඩනැගිල්ල, යාපනය විශ්වවිද්‍යාලය - රු.මිලියන 240
- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ගොඩනැගිලි සංකීර්ණය, යාපනය විශ්වවිද්‍යාලය - රු.මිලියන 1,125
- වෛද්‍ය පීඨයේ 12 මහල් ගොඩනැගිල්ල, රුහුණ විශ්වවිද්‍යාලය - රු. මිලියන1,179
- වෛද්‍ය පීඨයේ මහල් 10 කින් යුත් වාට්ටු සංකීර්ණය, රුහුණ විශ්වවිද්‍යාලය - රු. මිලියන1,300
- වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා පීඨ සඳහා පූර්ව සායනික ගොඩනැගිල්ල, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - රු. මිලියන 896
- අපජල හා මළාපවහන පවිත්‍රාගාරය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - රු. මිලියන 200
- වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - රු.මිලියන 3,229.4

**තොරතුරු තාක්ෂණ සහය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ යහපත් හා අඛණ්ඩ පරිගණක පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා තොරතුරු තාක්ෂණ අංශය විසින් අඛණ්ඩ කළමනාකරණ සහාය ලබා දෙන ලදි. සම්මත, නිතිපතා සිදු කරන දෛනික වැඩවලට අමතරව, පවත්නා ව්‍යාපාරික යෙදුම් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම මෙන්ම පවත්නා

වෙබ් අඩවි පරිපාලනය හා නඩත්තුව හා ඉ-පාලන යෙදුම්, සහ මාර්ගගත ගෙවීම් බිහිදොර ආදිය තොරතුරු තාක්ෂණ අංශය විසින් හසුරුවනු ලබයි.

2019 වර්ෂයේ දී උසස් අධ්‍යාපනයේ තත්ත්ව ආරක්ෂණය සඳහා වන නියෝජිතයන්ගේ ජාත්‍යන්තර ජාලය (INQAAHE) සඳහා වන ද්විවාර්ෂික සම්මන්ත්‍රණය සහ ආසියා පැසිෆික් තත්ත්ව ජාලයේ (APQN) වාර්ෂික අධ්‍යාපන සම්මන්ත්‍රණ පැවැත්වීමට සැලසුම් කර ඇති අතර ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ / උත්සවවලට සහභාගී වීමට කැමති විදේශීය නියෝජිතයින්ට විදේශ මුදල් ගෙවීම පහසු කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා නව ගෙවීම් බිහිදොර මොඩියුලයක් 2018 වර්ෂයේ දී නිර්මාණය කරන ලදි. තවද, INQAAHE සම්මන්ත්‍රණය 2019 සහ APQN සම්මන්ත්‍රණය 2019 සඳහා සම්මන්ත්‍රණ වෙබ් අඩවි 2018 වර්ෂයේ දී දියත් කරන ලදි.

යෝජනා කළමනාකරණ පද්ධතියේ (PMS) මාර්ගගත යෙදුම (online application), 2018 වර්ෂයේ දී, අවසන් සංවර්ධන අදියරේ දී සිදු කරන සමහර පරීක්ෂණවලට ලක් කළ අතර 2018 වර්ෂයේ දී මානව සම්පත් අංශයේ කාර්යයන් සඳහා සහාය වන සේවක සංඛ්‍යා කළමනාකරණ පද්ධති (CMS) මෘදුකාංගයේ වැඩ ආරම්භ කළ අතර එය සංවර්ධන ක්‍රියාවලියේ පවතී.

### විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා මූල්‍ය අනුග්‍රහය

2018 වර්ෂය තුළ වෙන් කළ /ලැබුණු රු.මිලියන1,803 මුදලක්, විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍යාධාර ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගෙවනු ලැබූ අතර එහිදී රු.මිලියන 1,268 ක මුදලක් මහපොළ ශිෂ්‍යත්ව ලෙස ද රු.මිලියන 535 ක මුදලක් ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ ද ලබා දෙන ලදි.
ඉහත කරුණු වලට අමතරව එක් වසරක් සඳහා සිසුන් 30 දෙනෙකුට මිට්සුබිෂි සමාගමේ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලද අතර තවත් සිසුන් 3 දෙනෙකු පොලිස් මධ්‍යම ශුභසාධක මණ්ඩලයේ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා තෝරා ගන්නා ලදි.

### කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ කාර්යයන් සහ සහාය

2018 වර්ෂයේ දී, 2017 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන, 2017 අධ්‍යයන වැඩසටහන්වල උපාධි අපේක්ෂකයෙකු සඳහා ඒකක පුනරාවර්තන පිරිවැය විශ්ලේෂණය කිරීම සහ 2017 දෙසැම්බර් 31 දින වන විට උසස් අධ්‍යාපන ආයතනයන් හි බැඳුම්කර ගිවිසුම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට ගත් ක්‍රියාමාර්ගවල ප්‍රගතියට අදාලව කළමනාකරණ තොරතුරු පද්ධති අංශය විසින් වැදගත් ප්‍රකාශන / වාර්තා තුනක් නිකුත් කළේය. සමාලෝචිත වර්ෂය තුළ, ජාතික වැදගත්කමක් ඇති හා ප්‍රතිලාභ සහිත ව්‍යාපෘති තුනක් සම්පූර්ණ කිරීම මඟින් කළමනාකරණ තොරතුරු පද්ධති අංශය හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ජාතික විද්‍යා පදනමට හා සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා දෙන සහාය දීර්ඝ කරන ලදි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා මධ්‍යගත කළමණාකරණ තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය විශ්ලේෂණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ කොරියානු අත්දැකීම්වලින් ඉගෙනීමේ අරමුණ ඇතිව, 2018 වර්ෂය තුළ කළමණාකරණ තොරතුරු පද්ධති අංශය, කොරියාවේ අධ්‍යාපන සංවර්ධන ආයතනය (KEDI) සමඟ සම්බන්ධතාවයක් ආරම්භ කරන ලදි.

### නීති කටයුතු

සමාලෝචිත වර්ෂය තුළ නියමයන් 13 ක් සහ නියමාවලින් 3 ක් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නා ලදි. කොමිෂන් සභාවට එරෙහිව විවිධ පාර්ශවයන් විසින් අධිකරණ හා විනිශ්චය සභාවලට ඉදිරිපත් කරන ලද නඩු 96 ක් 2018 දී නීති අංශය විසින් මෙහෙයවන ලදි. විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ (USAB) ගොනු කර ඇති නඩු 31 ක් මෙයට ඇතුළත් ය. වර්ෂය තුළදී, නීති අංශය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ සහ ඉන් පිටත වෙනත් ක්‍රියාකාරකම් සඳහා සහයෝගය සහ දායකත්වය ලබා දෙන ලදි.

### තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ (QAC) කටයුතු

කොමිෂන් සභා තීරණයකට අනුව, රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ වගකීම ඇතිව

2005 දී පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික හා ප්‍රතීතන කවුන්සිලය (QAAC), 2018 අප්‍රේල් මාසයේ දී තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය (QAC) ලෙස එහි නාමය වෙනස් කරන ලදි.

2018 වර්ෂයේ දී තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයේ (QAC) සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කළේය;

- අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකවල (IQAU) කාර්තුමය ප්‍රගති වාර්තා ලබා ගැනීම සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා කාර්ය සාධන ලකුණු වාර්තා අධීක්ෂණය කිරීම.

- රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන් සිතියම් ගත කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (SLQF) සිතියම්කරණ යාන්ත්‍රණය සංවර්ධනය කිරීමේ කටයුතු සිදු කිරීම හා සහතික, ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා ඇතුළුව රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන SLQF 05 මට්ටමට වඩා පහළින් ඇති වැඩසටහන් පිළිබඳ විස්තර ලබා ගැනීම.

- සමාලෝචන ක්‍රියාවලියට අදාළව මිණුම් ලකුණු සංවර්ධනය කිරීමේ විෂය පථය හා පරමාර්ථය හඳුනා ගැනීම සඳහා අනුකමිටුවක් පිහිටුවීම සහ විෂය මිණුම් ලකුණු ප්‍රකාශ සඳහා පොදු ආකෘතියක් සංවර්ධනය කිරීම.

- 2017 වර්ෂයේ දී පවත්වන ලද ආයතනික සමාලෝචන 4න් 3ක වාර්තා සම්පූර්ණ කිරීම සහ වෙබ් අඩවියේ පල කිරීම හා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සහ යාපනය විශ්වවිද්‍යාලයේ 2018 වර්ෂයේ දී සැලසුම් කළ ආයතනික සමාලෝචන සමඟ ඉදිරියට යමින්, 2019 දී විශ්වවිද්‍යාල හතරක් සඳහා සැලසුම් කර ඇති ආයතනික සමාලෝචන සඳහා ආරම්භක කටයුතු ආරම්භ කිරීම.

- 2017 දී පවත්වන ලද වැඩසටහන් සමාලෝචන (PR) වාර්තා 41 ක් සම්පූර්ණ කිරීම සහ වෙබ් අඩවියේ පල කිරීම, ව්‍යාපාර හා මූල්‍ය, කළමනාකරණය, වාණිජ්‍යය, අධ්‍යාපන, නීතිය සහ ලලිත කලා පීඨවල 2018 දී පවත්වන ලද වැඩසටහන් සමාලෝචන 58ක් ඉදිරියට සිදු කරගෙන යාම සහ 2019 වර්ෂය සඳහා සැලසුම් කර ඇති වැඩසටහන් සමාලෝචන කටයුතු ආරම්භ කිරීම සහ 2020 දී වැඩසටහන් සමාලෝචන පැවැත්විය යුතු පීඨ නිර්දේශ කිරීම.

- නව පීඨ සහ ආයතන අනුමත කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු අංශය විසින් භාවිතා කරන අයදුම් පත්‍ර ආකෘතිය නැවත ආකෘතිකරණය කිරීම සඳහා සංශෝධන නිර්දේශ කිරීම.

- පිළිගැනීම සඳහා ලැබුණු අයිතම 69 සඳහා පිළිගැනීමේ කමිටුව හරහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

- උපාධි වැඩසටහන් යෝජනා 119 ක් සහ නව පීඨ / ආයතන යෝජනා 2 ක් ඇගයීම.

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ (OUSL) වැඩසටහන් සමාලෝචනය සහ ආයතනික සමාලෝචනය සඳහා සංස්කරණය කරන ලද අත්පොත් සකස් කිරීම.

- තත්ත්ව සහතිකකරණ ක්‍රියාකාරකම් සඳහා තානාපතිවරුන් ලෙස සුවිශේෂ දක්ෂතා ඇති සිසුන්ගේ සහභාගීත්වය ලබා ගැනීම සඳහා එම සිසුන්ව හඳුනා ගැනීමට මාර්ගෝපදේශ ලේඛනය සම්පූර්ණ කිරීම.

- 'AHEAD' වැඩසටහන සඳහා 2018 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම් යෝජනා කිරීම සහ එහි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම.

- විශ්වවිද්‍යාල විසින් අධ්‍යයන වගවීම සඳහා අනුකූල වීමට යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ සකස් කිරීම සහ වගවීමේ ආකෘති සැකසීම සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල 12 කින් තොරතුරු ලබා ගැනීම.

2019 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සත්කාරකත්වය යටතේ පැවැත්වීමට නියමිත අන්තර්ජාතික සම්මන්ත්‍රණ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන පහත සඳහන් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ දෙක 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දී පැවැත්වේ.

(1) INQAAHE (උසස් අධ්‍යාපනයේ තත්ත්ව ආරක්ෂණය සඳහා වන නියෝජිතයන්ගේ ජාත්‍යන්තර ජාලය) සමුළුව 2019, මාර්තු 25 සිට 28 දක්වා 'ගෝලීයකරණය වූ ලෝකයක තත්ත්ව සහතික කිරීම, සුදුසුකම් සහ පිළිගැනීම විශ්වාසනීයත්වය ඇති කිරීම' යන ප්‍රධාන සම්මන්ත්‍රණ තේමාව යටතේ පැවැත්වීමට නියමිතය. මෙම සම්මන්ත්‍රණය සංවිධානය කිරීම හා සැලසුම් කිරීම සඳහා, 2018 වර්ෂයේ මැයි මස මොරිෂස් හි පැවති INQAAHE 11වන ද්විවාර්ෂික සංසදයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත පිරිසක් සහභාගී වූහ. INQAAHE ලේකම් කාර්යාලය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා අතර ගිවිසුමක් 2018 අගෝස්තු මාසයේ අත්සන් කරන ලදි. INQAAHE ලේකම් කාර්යාලය සමඟ කළ සාකච්ඡා මත පදනම්ව, 2019 වර්ෂයේ පවත්වන්නට නියමිත සම්මන්ත්‍රණයට අදාළව, 2018 වර්ෂය තුළ සිදු කිරීමට නියමිත ක්‍රියාකාරකම් හඳුනාගෙන විධිමත් කරන ලදි. ඒ අනුව ප්‍රාදේශීය සංවිධායක කමිටුවක් පිහිටුවන ලද අතර 2018 වර්ෂයේ එහි මඟ පෙන්වීම යටතේ, සාර්ථක සමුළුවක් පැවැත්වීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී හා සංවිධානය කිරීමේ දී සැලකිය යුතු සහයෝගයක් ලබා දෙන ලදි.

(2) 2018 වර්ෂයේ ඉන්දියාවේ, නාග්පූර් හි දී පැවති ආසියා පැසිෆික් තත්ත්ව ජාලයේ සම්මන්ත්‍රණයට සහභාගී වෙමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් අත්සන් කරන ලද ආසියා පැසිෆික් තත්ත්ව ජාලයේ අධ්‍යයන සම්මන්ත්‍රණය 2019 ගිවිසුමට අනුව, ආසියා පැසිෆික් තත්ත්ව ජාලයේ අධ්‍යයන සම්මන්ත්‍රණය (APQN AAC) සහ වාර්ෂික මහ සභා රැස්වීම -2019 , 2019 වර්ෂයේ මාර්තු 28-31 දක්වා පැවැත්වීමට සැලසුම් කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද ප්‍රාදේශීය සංවිධායක කමිටුව යටතේ මෙම සමුළුව සැලසුම් කිරීමේ දී හා සංවිධානය කිරීමේ දී 2018 වර්ෂයේ දී ස්ථාවර ප්‍රගතියක් ලබා ඇත. 2019 - ආසියා පැසිෆික් තත්ත්ව ජාලයේ සමුළුව සඳහා ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන ඇගයීම සඳහා මණ්ඩලයක් තීරණය කිරීමේ වගකීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය වෙත පැවරී ඇත.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව/සාධාරණත්වය (GEE), විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳුණු ප්‍රචණ්ඩත්වය සහ නවකවදය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල සියළුම සාමාජිකයින්ට හිතකර, ස්ත්‍රී පුරුෂ සමානතාවෙන් වැඩ කටයුතු කරන සහ ඉගෙනීමේ පරිසරයක් සහතික කිරීම සඳහා, ආයතනික හැකියාවක් ඇති බව සහතික කිරීම සඳහා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව/සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය (CGEE) හරහා සමාලෝචිත වර්ෂය තුළ වැදගත් ක්‍රියාකාරකම් බොහෝ ප්‍රමාණයක් සිදු කරන ලදි. ඒවා පහත දැක්වේ;

- ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳුණු ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමේ මාර්ගගත බිහිදොර, නවකවදය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමේ මාර්ගගත බිහිදොර (www.ugc.ac.lk/rag) සහ 24/7 ඇමතුම් මධ්‍යස්ථානය හා නවකවදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳුණු ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දත්ත සමුදාය ඇතුළත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මධ්‍යගත දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම. 2018 කාලය තුළ පැමිණිලි 250 කට අධික සංඛ්‍යාවක් ලැබී ඇති අතර, ඒ සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

- විශ්වවිද්‍යාල සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට හදිසි අවස්ථාවකදී උපකාර ලබා ගැනීමට හැකිවන පරිදි, 2018 ජූනි මාසයේදී හදිසි ආරක්ෂිත ජංගම යෙදුමක් දියත් කිරීම සහ 2018 අගෝස්තු - දෙසැම්බර් කාලය තුළ එය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම.

- මුද්‍රිත/විද්‍යුත් මාධ්‍ය භාවිතා කරමින් නවකවදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳුණු ප්‍රචණ්ඩත්වය පිළිබඳව විශ්වවිද්‍යාල පද්ධතිය තුළ දැනුවත්භාවය ඇති කිරීම සහ ප්‍රචාරය කිරීම.

- විශ්වවිද්‍යාල තුළ නවකවද හිංසනය වැළැක්වීමේ සහ තුරන් කිරීමේ නිශ්චිත හා පැහැදිලි අරමුණින් යුතුව 2017 දී පිහිටුවන ලද නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා පොලිස් නිලධාරීන් ඇතුළු පිරිසක් සහිත බහු - අංශ කාර්ය බලකායේ උත්සාහයන් සහ මැදිහත්වීම අඛණ්ඩ පවත්වාගෙන් යාම.

- ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාජිකයන් ප්‍රධානත්වය දරණ මධ්‍යස්ථාන, කුටි, කමිටු ආදියෙන් සමන්විත විශේෂිත ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කේන්ද්‍රීය ස්ථාන ජාලයක් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඇති කිරීම.

- දැනුවත් කිරීමේ සහ සංවේදීකරණ වැඩසටහන්, පුහුණු වැඩමුළු, පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්, නව්‍ය නායකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතා ප්‍රවර්ධන වැඩසටහන් සහ පර්යේෂණ අධ්‍යයන සිදු කිරීම මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී කිරීම සහ සවිබල ගැන්වීම සහතික කිරීම.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව/සාධාරණත්වය, නවකවදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳුණු ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමට විශ්වවිද්‍යාල දිරිගැන්වීම සහ සහාය දීම.

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පහසුකම් වැඩිදියුණු කිරීම**

වැඩිදියුණු කළ සන්නිවේදන සහ ඇමතුම් සේවා සැපයීම සඳහා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2018 වර්ෂයේ දී ඇනලොග් දුරකථන පද්ධතිය ඩිජිටල් දුරකථන පද්ධතියක් බවට පරිවර්තනය කරන ලදි. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පැමිණෙන ජනතාවගේ පහසුව සහතික කිරීම සඳහා ඔවුන්ට රැඳී සිටීමට ස්ථානයක් සහ මහජන සම්බන්ධතා කාර්යාලය (PRO) සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම 2018 දී ආරම්භ කරන ලදි.

මීට අමතරව, වර්ෂය තුළ ජාතික ඩිජිටල් පුස්තකාල සම්මේලනයක් පිහිටුවන ලද අතර සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියේ සියලුම පාර්ශවකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා රචනා චෞරත්ව විරෝධී මෘදුකාංගයක් (Anti-Plagiarism software ) මිලදී ගන්නා ලදි.

# වගු ලැයිස්තුව


| වගුව | | පිටු අංකය |
|---|---|---|
| වගුව 4.1 | සාමාන්‍ය හා විශේෂ විධිවිධාන යටතේ තෝරාගත් මුළු සිසුන් සංඛ්‍යාව | 9 |
| වගුව 4.2 | 2017/2018 අධ්‍යයන වර්ෂය: ජාතික/අන්තර්ජාතික මට්ටමින් අධ්‍යයන හැර වෙනත් ක්ෂේත්‍රවල විශිෂ්ඨ දක්ෂතා දැක්වූ සිසුන් | 13 |
| වගුව 4.3 | 2017/2018 අධ්‍යයන වර්ෂය : ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සඳහා විදේශීය සුදුසුකම් සහිත සිසුන් ඇතුළත් කර ගැනීම | 15 |
| වගුව 4.4 | 2017/2018 අධ්‍යයන වර්ෂය: අනුමත වූ අභියාචනා /පැමිණිලි මගින් සිදු කළ ඇතුළත් කිරීම් ගණන | 17 |
| වගුව 5.1 | ස්ථාවර කමිටු සහ 2018 දී පවත්වන ලද රැස්වීම් ගණන | 18 |
| වගුව 5.2 | 2018 වර්ෂයේදී අනුමත කරන ලද පීඨ | 19 |
| වගුව 5.3 | 2018 වර්ෂයේ අනුමත කරන ලද අධ්‍යයනාංශ | 19 |
| වගුව 5.4 | 2018 වර්ෂයේ දී අනුමත කරන ලද ප්‍රථම උපාධි පාඨමාලා | 20 |
| වගුව 5.5 | 2018 වර්ෂයේ දී අනුමත කරන ලද බාහිර උපාධි පාඨමාලා | 21 |
| වගුව 5.6 | 2018 වර්ෂයේ දී අනුමත කරන ලද පශ්චාත් උපාධි පාඨමාලා | 21 |
| වගුව 5.7 | 2018 වර්ෂය තුළ අනුමත කරන ලද අධ්‍යයනාංශ නාම වෙනස් කිරීම් | 21 |
| වගුව 5.8 | 2018 වර්ෂය තුළ අනුමත කරන ලද ප්‍රථම උපාධි පාඨමාලා නාම වෙනස් කිරීම් | 22 |
| වගුව 5.9 | 2018 වර්ෂයේදී දේශීය / විදේශීය විශ්වවිද්‍යාල පිළිගැනීමේ ලිපි නිකුත් කිරීම | 27 |
| වගුව 6.1 | 2017 සහ 2018 වර්ෂවල ලද මුළු අරමුදල් (රු. මිලියන) | 28 |
| වගුව 6.2 | අරමුදල් වෙන් කිරීම / භාවිතා කිරීම පිළිබඳ සාරාංශය: 2017 සහ 2018 | 30 |
| වගුව 6.3 | රජයේ අරමුදල් වෙන් කිරීම, වියදම් සහ ශිෂ්‍ය මූල්‍ය ආධාර (2013 සිට 2018 වර්ෂය දක්වා) | 31 |
| වගුව 6.4 | පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම - 2016 සිට 2017 දක්වා | 31 |
| වගුව 7.1 | 2018 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත හා දැනට සිටින සේවක සංඛ්‍යාව | 33 |
| වගුව 8.1 | 2018 දී විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා අනුමත කරන ලද නව සේවක තනතුරු සංඛ්‍යාව | 35 |
| වගුව 8.2 | විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා අනුමත සේවක සංඛ්‍යා තොරතුරු (2014 සිට 2018 වර්ෂය දක්වා) | 36 |
| වගුව 8.3 | 2018 වර්ෂයේ පරිපාලන ශ්‍රේණි පත්වීම් | 36 |
| වගුව 8.4 | 2018 වර්ෂයේ පරිපාලන ශ්‍රේණි සඳහා උසස්වීම් | 36 |
| වගුව 8.5 | අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද පත්වීම් - 2018 | 37 |
| වගුව 8.6 | අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද උසස්වීම් - 2018 | 37 |

වගුව 10.1 යටිතල පහසුකම් සංවර්ධන යෝජනා / ව්‍යාපෘතිවල ප්‍රගතිය (2016 සිට 2018 දක්වා) 45

වගුව 12.1 2018 වසරේ දී විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතනවල මහපොල ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර 48

වගුව 21.1 2018 දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි 66

වගුව 21.2 2018 දී නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ ලිපි 67

# 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමස්ත කළමනාකරණය සඳහා වගකිව යුතු කොමිෂන් සභාව 2018 දී පහත ආකාරයෙන් සමන්විත විය;

සභාපති
මහාචාර්ය මොහාන් ද සිල්වා
එම්.එස්, එෆ්.ආර්.සී.එස් එඩින්, එෆ්.සී.එස්.එස්.එල්
ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගෞරව විශේෂඥ ශල්‍ය වෛද්‍ය, දකුණු කොළඹ ශික්ෂණ රෝහල

උප-සභාපති
මහාචාර්ය පී එස් එම් ගුණරත්න
බී.එස්.සී (ව්‍යා.අධ.) (ජ.පුර), එම්.බී.ඒ (කොළඹ), එම්.එස්.සී හා පී.එච්.ඩී (සුකුබා, ජපානය)
පොදු රාජ්‍ය මණ්ඩල අධිශිෂ්‍ය (මැන්චෙස්ටර්,එ.රා), ජේ.එස්.පී.එස් අධිශිෂ්‍ය (යොකොහාමා, ජපානය)
මූල්‍යකරණය පිළිබඳ මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය

සාමාජිකයන්
මහාචාර්ය මලික් රණසිංහ
බී.එස්.සී ඉංජිනේරු (ගෞරව), එම්.ඒ.එස්සී (යූ.බී.සී), පී.එච්.ඩී.(යූ.බී.සී), සී ඉංජි, Int PE, එෆ්.අයි.ඊ (ශ්‍රී.ල), එෆ්.එන්.ඒ.එස් (ශ්‍රී.ල)

මහාචාර්ය ආර්.කුමාරවඩිවේල්
බී.එස්.සී (ගෞරව), පී.එච්.ඩී (බ්‍රිස්ටල්)

මහාචාර්ය හේමන්ත සේනානායක
එම්.බී.බී.එස් එම්.එස් (ප්‍රසව හා නාරිවේදය), එෆ්.ආර්.සී.ඕ.ජී,එෆ්.එස්.එල්.ඕ.ජී, එෆ්.ආර්.සී.එස්.ඊ.ඩී

වෛද්‍ය රුවයිස් හනීෆා
එම්.බී.බී.එස්, ඩී.එෆ්.එම්, පශ්චාත් උපාධි ඩිප්ලෝමා.,එම්.එස්.සී, එම්.ඩී, එෆ්.සී.ජී.පී, එම්.ආර්.සී.ජී.පී

ආචාර්ය වික්‍රම වීරසූරිය (2018.11.08 දක්වා සහ 2018.12.04 දින අභාවප්‍රාප්ත විය)
එල්.එල්.බී (ලංකා), පී.එච්.ඩී (ලන්ඩන්), නීතිඥ

මහාචාර්ය පූජ්‍ය කෝ. මහින්ද සංඝරක්ඛිත හිමි (2018.11.09 දින සිට)
පී.එච්.ඩී, එම්.ඒ. (දිල්ලි), බී.ඒ.(විශේෂවේදී)(ශ්‍රී ලංකාව)

මහා භාණ්ඩාගාර නියෝජිත

ආචාර්ය පී.කේ.ජී. හරිස්චන්ද්‍ර (2018.10.31 දක්වා)
පී.එච්.ඩී ආර්ථික විද්‍යාව මැන්චෙස්ට් විශ්වවිද්‍යාලය, එ.රා, එම්.එස්.සී ආර්ථික විද්‍යාව මැන්චෙස්ට් විශ්වවිද්‍යාලය, එ.රා එම්.බී.ඒ කොළඹ විශ්වවිද්‍යාලය, බී.කොම් කැලණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය කපිල සේනානායක (2018.11.30 දින සිට)
පී.එච්.ඩී ආර්ථික විද්‍යාව (යූ.එන්.එස්.ඩබ්ලිව්. ඕස්ට්‍රේලියාව), රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (හිටොසුබාෂි විශ්වවිද්‍යාලය, ජපානය), පී.ජී.ඩී.(කළමනාකරණය සහ පරිපාලනය), වාණිජවේදී (විශේෂ), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ලේකම්
ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර
බී.එස්.සී (ගෞරව), එම්.බී.ඒ (කොළඹ), පී.එච්.ඩී. (වුහුම්)

## 2. විශ්වවිද්‍යාල කළමනාකරණය

### 2.1 කොළඹ විශ්වවිද්‍යාලය

කුලපති
අති උතුම් පූජ්‍ය ආචාර්ය ඔස්වල්ඩ් ගෝමිස් කොළඹ විශ්‍රාමික අගරදගුරු හිමිපාණෝ

උපකුලපති
මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක (2018.08.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත පත් කරන ලදි)

නියෝජ්‍ය උපකුලපති
පුරප්පාඩු වී ඇත

ලේඛකාධිකාරී
කේ.ජී.එස්. එඩ්වඩ්. මහතා

### 2.2 පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය කේ. එම්. ද සිල්වා

උපකුලපති
මහාචාර්ය යූ.බී. දිසානායක
මහාචාර්ය යූ.බී. දිසානායක (2018.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත පත් කරන ලදි)

නියෝජ්‍ය උපකුලපති
මහාචාර්ය එස්. එච්. පී. පරාක්‍රම කරුණාරත්න

ලේඛකාධිකාරී
යූ.ඩී. දොඩන්වල මහතා (2018.04.01 දින දක්වා)
කේ.ඒ.බී.දමුණුපොල (2018.04. 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි)
සමන් රාජපක්ෂ (2018.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

### 2.3 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

කුලපති
පූජ්‍ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමි (2018.02.03 දින දක්වා)
මහාචාර්ය පූජ්‍ය ඉත්තෑපානේ ධම්මාලම්කාරාභිධාන හිමි (2018.02.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි )

උපකුලපති
මහාචාර්ය සම්පත් අමරතුංග

ලේඛකාධිකාරී
කේ.ජී. බ්‍රිටෝ මහතා

### 2.4 කැලණිය විශ්වවිද්‍යාලය

කුලපති

මහෝපාධ්‍යාය, පූජ්‍ය වැලමිටියාවේ ධර්මකීර්ති ශ්‍රී කුසලධම්ම හිමි
උපකුලපති
මහාචාර්ය ඩී.එම් සේමසිංහ

නියෝජ්‍ය උපකුලපති
මහාචාර්ය එල්. සෙනෙවිරත්න

ලේඛකාධිකාරී
ඩබ්.එම්. කරුණාරත්න මහතා

2.5 මොරටුව විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය කේ.කේ.වයි.ඩබ්ලිව්. පෙරේරා

උපකුලපති
මහාචාර්ය කේ.කේ.සී.කේ. පෙරේරා

නියෝජ්‍ය උපකුලපති
මහාචාර්ය ආර්.ඒ. අත්තලගේ (2018.03.07 දින දක්වා)
මහාචාර්ය පී.කේ.එස්.මහානාම (2018.03.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

ලේඛකාධිකාරී
එම්.ඒ.එල්.ජවුෆර් සාදික් මහතා (2018.11. 21 දක්වා)
විශාකා කුලසේකර (2018.11.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

2.6 යාපනය විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය එස් පද්මනාදන්

උපකුලපති
මහාචාර්ය ආර්. විග්නේෂ්වරන්

ලේඛකාධිකාරී
වී. කන්දීපන් මහතා

2.7 රුහුණ විශ්වවිද්‍යාලය

කුලපති
පූජ්‍ය පල්ලත්තර සුමනජෝති හිමි

උපකුලපති
මහාචාර්ය ගාමිණී සේනානායක

නියෝජ්‍ය උපකුලපති
ආචාර්ය ඒ.එම්.එන් අලගියවන්න

ලේඛකාධිකාරී
පී.එස්. කළුගම මිය

2.8 ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

කුලපති
ආචාර්ය වී.විවේකානන්ද රාජා

උපකුලපති
මහාචාර්ය ටී. ජයසිංහම්

නියෝජ්‍ය උපකුලපති
ආචාර්ය කේ.ඊ.කරුණාකරන්

ලේඛකාධිකාරී
ඒ. පගිරදන් මහතා

**2.9** ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය අච්. එම්. ඉෂාක්

උපකුලපති
මහාචාර්ය එම්.එම්.එම්. නජීම් ((2018.06. 17 දින දක්වා)
මහාචාර්ය එම්.එම්.එම්. නජීම් (2018.08.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත පත් කරන ලදි)

නිසි බලධාරියා
මහාචාර්ය උමා කුමාරස්වාමි (2018.06.18 දින සිට 2018.08.08 දක්වා)

ලේඛකාධිකාරී
එච්. අබ්දුල් සත්තාර් මහතා

**2.10** ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය ලීල් ගුණසේකර

උපකුලපති
මහාචාර්ය කේ.එච්. රංජිත් විජයවර්ධන

ලේඛකාධිකාරී
ඒ.එම්.ජී.බී. අබේසිංහ මහතා

**2.11** ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය පූජ්‍ය කඹුරුගමුවේ වජිර හිමි

උපකුලපති
මහාචාර්ය සුනිල් ශාන්ත

ලේඛකාධිකාරී
වී.ඩී.කිත්සිරි

**2.12** ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය කේ.ටී ද සිල්වා

උපකුලපති
මහාචාර්ය ඊ.එම්.පී. ඒකනායක

ලේඛකාධිකාරී
ඩබ්ලිව්. ඒ.ඩී. චිත්‍රානන්ද මයා

**2.13** ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

කුලපති
පූජ්‍ය බෙන්ගමුවේ ශ්‍රී ධම්මදින්න නායක හිමි

උපකුලපති
ආචාර්ය ජේ.එල් රත්නසේකර

ලේඛකාධිකාරී
එම්.එෆ්.එච්.කරීම් මහතා

**2.14** ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය කොල්වින් ගුණරත්න

උපකුලපති
මහාචාර්ය එස්.ඒ. ආරියදූරෙයි

නියෝජ්‍ය උපකුලපති
මහාචාර්ය කමල් බී ගුණහේරත්

ලේඛකාධිකාරී
ඩබ්ලිව්.එල්.වී. ජයසේන මිය

**2.15** සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය සංගීත් නිපුන් සනත් නන්දසිරි

උපකුලපති
මහාචාර්ය සරත් චන්ද්‍රජීව

ලේඛකාධිකාරී
ආර්.ටී.එම් රණතුංග මිය (2018.01.31 දින දක්වා වැඩ බලන ලදී)
බී.එම්.දයාවංස මහතා (2018.02.01 දින සිට)

## 3. ආයතන

### 3.1 කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය සී .එම්.බී දෙමටවැව

### 3.2 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය පී.ගුණවර්ධන ( නිසි බලධාරියා වශයෙන් 2018.06. 30 දින දක්වා)
මහාචාර්ය ටී.ආර්. ප්‍රේමතිලක (2018 .07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන)

### 3.3 කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය අජන්ත ධර්මසිරි

### 3.4 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එච්.ජානක ද සිල්වා

### 3.5 පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි

### 3.6 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටිවල (2018.01.0 2 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

### 3.7 ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය එච් රඹුක්වැල්ල

### 3.8 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය ආනන්ද ජයවික්‍රම

### 3.9 දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

අධ්‍යක්ෂ
වෛද්‍ය එස්.ඩී. හපුආරච්චි මිය (2018.02.09 දින දක්වා)
මහාචාර්ය පී.ඒ.පරණගම (2018.02. 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

### 3.10 මානව සම්පත් අභිවර්ධන ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි

**3.11** කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක විද්‍යායතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය කේ.පී. හේවාගමගේ

**3.12** ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

අධ්‍යක්ෂ
ආචාර්ය එස්.ඩී.පිලපිටිය (2018 .10.18 දින දක්වා)
ලේඛකාධිකාරී, කැලණිය විශ්වවිද්‍යාලය (2018 .10.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**3.13** ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

අධ්‍යක්ෂ
ආර්. ප්‍රසන්න රණවීර මහතා

**3.14** තොරතුරු තාක්ෂණ ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ
ආචාර්ය ප්‍රියංගනී සමරසේකර මිය

**3.15** ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති

**3.16** මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

අධ්‍යක්ෂ
මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න (2018.05.31 දින දක්වා වැඩ බලන)
මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි (2018.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන)

**3.17** සෞන්දර්යය අධ්‍යයන පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය එස්.ජයසංකර්(2018.12.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ බලන)

**3.18** කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා සඳහා වන අධ්‍යාපන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ
මහාචාර්ය එස්. සුබසිංහ

## 4. විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොත ප්‍රකාශයට පත් කරන ලදි. එහි මග පෙන්වීම මත පදනම්ව, 2017 අගෝස්තු මාසයේ දී පැවැත්වූ අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටි අපේක්ෂකයින්ගෙන් 2017/2018 අධ්‍යයන වර්ෂයට අදාලව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා 2018 ජනවාරි මාසයේදී අයදුම්පත් කැඳවනු ලැබිය. ඒ අනුව, එක් එක් උපාධි පාඨමාලා සඳහා සාමාන්‍ය ප්‍රවේශය බඳවා ගැනීම් යටතේ සිසුන් තෝරා ගැනීම අවසන් කරන ලද අතර කඩඉම් ලකුණු 2018 ජූලි මාසයේ දී නිකුත් කරන ලදි. තවද, විශේෂ විධිවිධාන යටතේ සිසුන් තෝරා ගැනීම ද සමාලෝචිත වර්ෂය තුළ දී අවසන් කරන ලදි.

2017 අගෝස්තු මාසයේ දී පවත්වන ලද අ.පො.ස. උසස් පෙළ විභාග ප්‍රතිඵල මත පදනම්ව, 2017/2018 අධ්‍යයන වර්ෂයට අදාලව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අපේක්ෂකයින් 163,160 ක් සුදුසුකම් ලබා තිබුණි. 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා සාමාන්‍ය ප්‍රතිපාදන යටතේ යෝජිත බඳවා ගැනීම් සංඛ්‍යාව 30,513 ක් වූ අතර, එයින් සිසුන් 30,141 ක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා ලදි.

මීට අමතරව, විවිධ කාණ්ඩවල විශේෂ විධිවිධාන යටතේ සිසුන් 409 දෙනෙකු ඇතුළත් කර ඇති අතර, 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාලවලට බඳවා ගත් මුළු සංඛ්‍යාව 30,550 කි.

### 4.1 අධ්‍යයන වර්ෂය 2017/2018 - සාමාන්‍ය විධිවිධාන යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය

සාමාන්‍ය විධිවිධාන යටතේ රාජ්‍ය විශ්වවිද්‍යාල 15 ට ඇතුළත් කර ගත් සිසුන් 30,141 දෙනෙකු තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී පහත සඳහන් ප්‍රවේශ ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදි.

4.1.1. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගැනීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වර්ෂ 2017 දී පැවති අ.පො.ස.(උසස් පෙළ)විභාගයේ දී අයදුම්කරුවන් ලබාගත් ඉසෙඩ් ලකුණුවල සාමාන්‍ය අනුව පෙළගැස්වූ කුසලතා අනුපිළිවෙල මත පදනම්ව සිදු කරනු ලැබේ.

4.1.2. [කලා,කලා (SP), කලා (SAB), සන්නිවේදන අධ්‍යයන, සාමය හා ගැටුම් නිරාකරණය, ඉස්ලාම් අධ්‍යයන, අරාබි භාෂාව සහ ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම (TESL)] වැනි කලා පාඨමාලා සඳහා දී ඇති දිස්ත්‍රික්කයකින් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත් මුළු සංඛ්‍යාව, 1993/1994 හෝ 2002/2003 අධ්‍යයන වර්ෂයේ දී යම් දිස්ත්‍රික්කයකින් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත් මුළු සංඛ්‍යාවට වඩා අඩු නොවිය යුතුය යන කොන්දේසියට යටත්ව දීප ව්‍යාප්ත කුසලතා පදනම මත සිසුන් ඇතුළත් කිරීම් සිදු කරන ලදි.

4.1.3. ඉහත 4.1.2 හි සඳහන් පාඨමාලා හැරුණු විට අනෙකුත් සියලුම පාඨමාලා සඳහා ද්විත්ව නිර්ණායක මත ඇතුළත් කිරීම් සිදු කරන ලදි:

- දීප ව්‍යාප්ත කුසලතා පදනම
- දිස්ත්‍රික් කුසලතා පදනම

4.1.4. යම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා ඇති මුළු ස්ථානවලින් 40% ක් දක්වා දීප ව්‍යාප්ත කුසලතා පදනම මත පෙල ගැසූ ඉසෙඩ් ලකුණු අනුව සිසුන් තෝරා ගැනීම සිදු කෙරේ.

4.1.5. ඉතිරි 60% න් 55%ක් දක්වා දිස්ත්‍රික් කුසලතා පදනම මත සිසුන් තෝරා ගැනේ. යම් දිස්ත්‍රික්කයකින් දීප ව්‍යාප්ත කුසලතා පදනම් මත කිසියම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා සිසුන්ට (40%) අමතරව, දිස්ත්‍රික් කුසලතා පදනම යටතේ තවත් 55% ක් දක්වාද අමතර සිසුන් සංඛ්‍යාවක් තෝරා ගැනේ. ඒ අනුව, එක් එක් පාඨමාලාවේ ඇති ස්ථාන සංඛ්‍යාවෙන් 55%ක් දක්වා, පරිපාලන දිස්ත්‍රික්ක 25 අතර එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනයට සමානුපාතිකව එනම්, ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යා අනුපාතය අනුව බෙදා හැරේ.

4.1.6. එක් එක් පාඨමාලාවේ පවතින 5%ක් දක්වා වූ ඉතිරි ස්ථාන සිසුන් අතර බෙදා හැරීමේදී, අධ්‍යාපන පහසුකම් අතින් දුෂ්කර යැයි හඳුනාගෙන ඇති පහත දැක්වෙන දිස්ත්‍රික්ක 16 සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදි. ඒ අනුව එම ස්ථාන සංඛ්‍යාව දිස්ත්‍රික්ක 16 හි මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයේ ජනසංඛ්‍යා අනුපාතය අනුව බෙදා වෙන් කරනු ලැබේ.

1. නුවරඑළිය
2. හම්බන්තොට
3. යාපනය
4. කිලිනොච්චිය
5. මන්නාරම
6. මුලතිව්
7. වව්නියා
8. ත්‍රිකුණාමලය
9. මඩකලපුව
10. අම්පාර
11. පුත්තලම
12. අනුරාධපුරය
13. පොලොන්නරුව
14. බදුල්ල
15. මොණරාගල
16. රත්නපුර

4.1.7. තවද, කලා පාඨමාලාවලදී මෙන්ම, කිසියම් අධ්‍යයන පාඨමාලාවක් සඳහා ඕනෑම දිස්ත්‍රික්කයකට වෙන් කර ඇති දිස්ත්‍රික් පංගු ප්‍රමාණය, 1993/1994 හෝ 2002/2003, අධ්‍යයන වර්ෂයන්වලදී එම එක් එක් පාඨමාලාව සඳහා ඒ ඒ දිස්ත්‍රික්කයට වෙන් කර තිබූ දිස්ත්‍රික් පංගු ප්‍රමාණයේ උපරිමයට වඩා අඩු නොවන අයුරින් සිදු කෙරිණි.

සංසන්දනය කිරීමේ අරමුණු සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත් සිසුන්ගේ තොරතුරු, 2016/2017 අධ්‍යයන වර්ෂයේ අනුරූප සංඛ්‍යා සමඟ 4.1 වගුවේ සාරාංශ කොට ඇත.

| | අධ්‍යයන පාඨමාලාව | **2017/2018** අධ්‍යයන වර්ෂයේ දී තෝරා ගත් සංඛ්‍යාව | **2016/2017** අධ්‍යයන වර්ෂයේ දී තෝරා ගත් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | වෛද්‍ය විද්‍යාව | 1449 | 1290 |
| 2. | දන්ත ශල්‍ය විද්‍යාව | 77 | 78 |
| 3. | පශු වෛද්‍ය විද්‍යාව | 78 | 79 |
| 4. | කෘෂිකර්මය | 625 | 599 |
| 5. | ආහාර විද්‍යාව හා පෝෂණය | 108 | 108 |
| 6. | ජෛවීය විද්‍යාව | 1283 | 1501 |
| 7. | ව්‍යවහාරික විද්‍යාව(ජෛවීය විද්‍යාව) | 293 | 293 |

| | | | |
|---|---|---|---|
| 8. | ඉංජිනේරු විද්‍යාව | 1731 | 1681 |
| 9. | ඉංජිනේරු විද්‍යාව - (EM) | 49 | 48 |
| 10. | ඉංජිනේරු විද්‍යාව - (TM) | 58 | 58 |
| 11. | ප්‍රමාණ සමීක්ෂණය | 123 | 124 |
| 12. | පරිගණක විද්‍යාව | 446 | 427 |
| 13. | භෞතීය විද්‍යාව | 1880 | 2148 |
| 14. | මැනුම් විද්‍යාව | 98 | 78 |
| 15. | ව්‍යවහාරික විද්‍යාව (භෞතීය විද්‍යාව) | 559 | 550 |
| 16. | කළමනාකරණය | 4386 | 4200 |
| 17. | දේපල කළමනාකරණය හා තක්සේරුකරණය | 58 | 58 |
| 18. | වාණිජ්‍යය | 642 | 641 |
| 19. | කලා | 5866 | 5850 |
| 20. | කලා (SP)- ජනමාධ්‍ය | 78 | 78 |
| 21. | කලා (SAB) | 221 | 223 |
| 22. | කළමනාකරණ අධ්‍යයන - (TV) –A | 136 | 101 |
| 23. | වාස්තු විද්‍යාව | 58 | 58 |
| 24. | නිර්මාණවේදය | 58 | 58 |
| 25. | නීතිය | 366 | 346 |
| 26. | තොරතුරු තාක්ෂණය | 198 | 198 |
| 27. | කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය | 98 | 98 |
| 28. | කළමනාකරණය (රාජ්‍ය) (විශේෂ) | 83 | 73 |
| 29. | සන්නිවේදන අධ්‍යයනය | 148 | 98 |
| 30. | නගර හා ග්‍රාම නිර්මාණය | 48 | 48 |
| 31. | සාමය හා ගැටුම් නිරාකරණය | 33 | 33 |
| 32. | ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 296 | 296 |
| 33. | යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 58 | 58 |
| 34. | විලාසිතා නිර්මාණය හා නිපැයුම් ප්‍රවර්ධනය | 48 | 48 |
| 35. | ආහාර විද්‍යාව හා තාක්ෂණය | 169 | 178 |
| 36. | සිද්ධ වෛද්‍ය විද්‍යාව | 149 | 139 |
| 37. | භෙද | 342 | 377 |
| 38. | තොරුතුරු සහ සන්නිවේදන තාක්ෂණය | 158 | 148 |
| 39. | කෘෂිකර්ම තාක්ෂණය සහ කළමනාකරණය | 199 | 198 |
| 40. | කළමනාකරණ අධ්‍යයන - (TV) –B | 137 | 100 |
| 41. | කලා (විශේෂ) / ප්‍රසාංගික කලා | 78 | 78 |
| 42. | සෞඛ්‍ය ප්‍රවර්ධන | 49 | 48 |
| 43. | ඖෂධ විද්‍යාව | 143 | 158 |
| 44. | වෛද්‍ය රසායනාගාර විද්‍යාව | 138 | 153 |
| 45. | විකිරණ ශිල්පය | 43 | 43 |
| 46. | භෞත චිකිත්ස | 63 | 59 |
| 47. | පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය | 58 | 59 |
| 48. | පහසුකම් කළමනාකරණය | 48 | 48 |
| 49. | ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය | 59 | 59 |
| 50. | අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව | 58 | 58 |

| | | | |
|---|---|---|---|
| 51. | කර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය මූල්‍ය | 88 | 88 |
| 52. | සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ | 48 | 68 |
| 53. | පරිගණනය හා කළමනාකරණය | 48 | 48 |
| 54. | ධීවර සහ සාගර විද්‍යාව | 58 | 58 |
| 55. | ඉස්ලාම් අධ්‍යයන | 248 | 248 |
| 56. | විද්‍යාව සහ තාක්‍ෂණය | 59 | 63 |
| 57. | පරිගණක විද්‍යාව සහ තාක්‍ෂණය | 58 | 58 |
| 58. | ව්‍යවසායකත්වය හා කළමනාකරණය | 63 | 63 |
| 59. | සත්ත්ව පාලන විද්‍යාව | 64 | 58 |
| 60. | සංගීතය | 415 | 398 |
| 61. | නැටුම් | 360 | 344 |
| 62. | චිත්‍ර සහ නිර්මාණ | 33 | 33 |
| 63. | නාට්‍ය හා රංග කලා | 96 | 86 |
| 64. | දෘශ්‍ය සහ තාක්ෂණික කලා | 48 | 48 |
| 65. | අපනයන කෘෂිකර්මය | 63 | 59 |
| 66. | තේ තාක්‍ෂණය සහ අගය වැඩිකිරීම | 64 | 58 |
| 67. | කාර්මික තොරතුරු තාක්‍ෂණය | 59 | 58 |
| 68. | ඛනිජ සම්පත් සහ තාක්‍ෂණය | 58 | 63 |
| 69. | ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ) | 48 | 48 |
| 70. | කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (අග්නිදිග වි.වි) | 118 | 119 |
| 71. | ආගනණය සහ තොරතුරු පද්ධති | 98 | 99 |
| 72. | ශාරීරික අධ්‍යාපනය | 48 | 48 |
| 73. | ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය | 103 | 93 |
| 74. | කථන හා ශ්‍රවන විද්‍යාව | 48 | 48 |
| 75. | අරාබි භාෂාව | 198 | 198 |
| 76. | දෘශ්‍ය කලා | 95 | 96 |
| 77. | සත්ත්ව පාලන සහ මත්ස්‍ය විද්‍යාව | 48 | 49 |
| 78. | ආහාර නිෂ්පාදනය සහ තාක්‍ෂණ කළමනාකරණය | 83 | 84 |
| 79. | ජලජ සම්පත් තාක්‍ෂණය | 63 | 58 |
| 80. | තාල හා ක්‍ෂීර තාක්‍ෂණය සහ අගය වැඩි කිරීම | 60 | 58 |
| 81. | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමනාකරණය | 63 | 63 |
| 82. | තොරතුරු තාක්‍ෂණය හා කළමනාකරණය | 98 | 98 |
| 83. | සංචාරක හා සත්කාරක කළමනාකරණය | 118 | 118 |
| 84. | කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය | 149 | 149 |
| 85. | කෘෂි ව්‍යාපාර කළමනාකරණය | 54 | 49 |
| 86. | හරිත තාක්ෂණය | 48 | 48 |
| 87. | තොරතුරු පද්ධති | 98 | 98 |
| 88. | භූ දර්ශන වාස්තු විද්‍යාව | 46 | 46 |
| 89. | පරිවර්තන අධ්‍යයන | 74 | 73 |
| 90. | මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | 48 | 48 |
| 91. | සිනමා හා රූපවාහිනී අධ්‍යයනය | 48 | 48 |

| | | | |
|---|---|---|---|
| 92. | ව්‍යාපෘති කළමනාකරණය | 58 | 48 |
| 93. | ඉංජිනේරු තාක්ෂණය | 931 | 857 |
| 94. | ජෛව පද්ධති තාක්ෂණය | 842 | 717 |
| 95. | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | 461 | 436 |
| 96. | දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (TESL) | 48 | 48 |
| 97. | සාගර හා මිරිදිය විද්‍යා | 48 | 48 |
| 98. | ආහාර ව්‍යාපාර කළමනාකරණය | 78 | 78 |
| 99. | භෞතික විද්‍යාව - තො.ස.තා | 118 | 103 |
| 100. | ව්‍යාපාර විද්‍යාව | 98 | 98 |
| 101. | මූල්‍ය ඉංජිනේරු විද්‍යාව | 48 | - |
| අධ්‍යයන වර්ෂය සඳහා තෝරා ගත් මුළු සංඛ්‍යාව | | **30,141** | **29,696** |
| යෝජිත මුළු සංඛ්‍යාව | | **30,513** | **29,333** |
| විශේෂ විධිවිධාන යටතේ තෝරා ගත් මුළු සංඛ්‍යාව | | | |
| අ. | ජාතික/අන්තර්ජාතික මට්ටමින් අධ්‍යයන හැර වෙනත් ක්ෂේත්‍රවල විශිෂ්ඨ දක්ෂතා දැක්වූ සිසුන් | 179<br>26 | 170<br>05 |
| ආ. | විදේශ සුදුසුකම් සහිත සිසුන් ඇතුළත් කිරීම | 17 | 17 |
| ඇ. | සන්නද්ධ හමුදා,පොලිස් සේවයේ හා විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන් | - | 573 |
| ඈ. | විශේෂ විෂයන් සඳහා අතිරේක ප්‍රවේශය යටතේ ඇතුළත් කිරීම | 105 | 105 |
| ඉ. | අන්ධ හා කායික අශක්නුතාවයක් ඇති අපේක්ෂකයන් | 10 | 01 |
| ඊ. | ගුරුවරුන් ඇතුළත් කිරීම | 72 | 101 |
| එ. | අභියාචනා | | |
| සාමාන්‍ය හා විශේෂ විධිවිධාන යටතේ තෝරා ගත් මුළු සිසුන් ගණන | | **30,550** | **30,668** |

වගුව **4.1** සාමාන්‍ය හා විශේෂ විධිවිධාන යටතේ තෝරාගත් මුළු සිසුන් සංඛ්‍යාව

## 4.2 2018 වර්ෂයේ දී හඳුන්වාදෙන ලද නව අධ්‍යයන පාඨමාලා

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ හැදෑරිය හැකි අධ්‍යයන පාඨමාලා ලැයිස්තුවට 2018 වර්ෂයේ දී එක් නව අධ්‍යයන පාඨමාලාවක් එක් කරන ලද අතර එය 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා ක්‍රියාත්මක කරන ලදි.එක් කරන ලද නව අධ්‍යයන පාඨමාලාවේ විස්තර පහත පරිදි වේ;

| | | |
|---|---|---|
| අධ්‍යයන පාඨමාලාව | : | මූල්‍ය ඉංජිනේරු විද්‍යාව |
| විශ්වවිද්‍යාලය | : | කැලණිය විශ්වවිද්‍යාලය |
| ප්‍රවේශ සංඛ්‍යාව | : | 50 |

## 4.3 2017/2018 අධ්‍යයන වර්ෂය - විශේෂ විධිවිධාන යටතේ විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම

අ. ජාතික/අන්තර්ජාතික මට්ටමින් අධ්‍යයන හැර වෙනත් ක්ෂේත්‍රවල විශිෂ්ඨ දක්ෂතා දැක්වූ සිසුන්

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙන් පිරිනමනු ලබන පාඨමාලා හැර විශ්වවිද්‍යාල මගින් පිරිනමනු ලබන සියලු පාඨමාලාවලට අදාළ ස්ථාන සංඛ්‍යාවෙන් 0.5% ක් හෝ එක් ස්ථානයක් යන දෙකින් ඉහළ අගයක් ගන්නා ස්ථාන සංඛ්‍යාවක්, සුළු ඉසෙඩ් ලකුණු සංඛ්‍යාවක අඩුවක් නිසා සාමාන්‍ය ප්‍රවේශය යටතේ යම්කිසි පාඨමාලාවකට නොතේරුණු, එහෙත් ක්‍රීඩා, සෞන්දර්ය සහ සංස්කෘතික කටයුතු (උදා : සංගීතය, නැටුම්, චිත්‍ර,කලා සහ සාහිත්‍ය) , බාල දක්ෂ සහ ශිෂ්‍යභට, සමාජ කටයුතු හා වෙනත් බාහිර ක්‍රියාකාරකම්වලින් ජාතික මට්ටමේ ප්‍රථම,දෙවන හෝ තෙවන ස්ථාන හෝ ජාත්‍යන්තර මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන ඇති සිසුන් සඳහා වෙන් කොට ඇත.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන පාඨමාලා සඳහා එකතව් ඇති ස්ථාන වලින් 4% දක්වා මෙම ප්‍රවේශය සඳහා වෙන් කරනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු ලබා දීමේ ක්‍රමවේදයකට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද තේරීම් කමිටුවක් මගින් තෝරා ගැනීම් සිදු කරන ලදී.

තෝරාගත් සංඛ්‍යාව 4.2 වගුවේ දක්වා ඇත.

| **2017/2018** අධ්‍යයන වර්ෂය | |
|---|---|
| අධ්‍යයන පාඨමාලාව | තෝරාගත් සංඛ්‍යාව |
| වෛද්‍ය විද්‍යාව | 7 |
| දන්ත ශල්‍ය විද්‍යාව | 1 |
| පශු වෛද්‍ය විද්‍යාව | 1 |
| කෘෂිකර්මය | 3 |
| ආහාර විද්‍යාව හා පෝෂණය | 1 |
| ජෛවීය විද්‍යාව | 6 |
| ව්‍යවහාරික විද්‍යාව(ජෛවීය විද්‍යාව) | 1 |
| ඉංජිනේරු විද්‍යාව | 9 |
| ඉංජිනේරු විද්‍යාව - (EM) | 1 |
| ඉංජිනේරු විද්‍යාව - (TM) | 1 |
| ප්‍රමාණ සමීක්ෂණය | 1 |
| පරිගණක විද්‍යාව | 2 |
| භෞතීය විද්‍යාව | 10 |
| මැනුම් විද්‍යාව | 1 |
| ව්‍යවහාරික විද්‍යාව (භෞතීය විද්‍යාව) | 2 |
| කළමනාකරණය | 21 |
| දේපල කළමනාකරණය හා තක්සේරුකරණය | 1 |
| වාණිජ්‍යය | 3 |
| කලා | 29 |
| කලා (SP)- ජනමාධ්‍ය | 1 |
| කලා (SAB)-A | 1 |
| කළමනාකරණ අධ්‍යයන - (TV) - A | 1 |
| නීතිය | 2 |
| තොරතුරු තාක්ෂණය | 1 |

| | |
|---|---|
| කළමනාකරණය හා තොරතුරු තාක්‍ෂණය | 1 |
| කළමනාකරණය (රාජ්‍ය) (විශේෂ) | 1 |
| සන්නිවේදන අධ්‍යයනය | 1 |
| නගර හා ග්‍රාම නිර්මාණය | 1 |
| සාමය හා ගැටුම් නිරාකරණය | 1 |
| ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 2 |
| ආහාර විද්‍යාව හා තාක්‍ෂණය | 1 |
| සිද්ධ වෛද්‍ය විද්‍යාව | 1 |
| හෙද | 1 |
| කෘෂිකර්ම තාක්‍ෂණය සහ කළමනාකරණය | 1 |
| කළමනාකරණ අධ්‍යයනය (TV) -B | 1 |
| කලා (විශේෂ) / ප්‍රසාංගික කලා | 1 |
| කලා (SAB)- B | 1 |
| ඖෂධ විද්‍යාව | 1 |
| වෛද්‍ය රසායනාගාර විද්‍යාව | 1 |
| විකිරණ ශිල්පය | 1 |
| භෞත චිකිත්ස | 1 |
| පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය | 1 |
| ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය | 1 |
| අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව | 1 |
| කර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය මූල්‍ය | 1 |
| සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ | 1 |
| පරිගණනය හා කළමනාකරණය | 1 |
| ඉස්ලාම් අධ්‍යයන | 1 |
| ව්‍යවසායකත්වය හා කළමනාකරණය | 1 |
| සත්ත්ව විද්‍යාව | 1 |
| නැටුම් (රාමනාදන්) | 1 |
| සංගීතය (සෞ.ක.වි) | 10 |
| නැටුම් (සෞ.ක.වි) | 10 |
| නාට්‍ය හා රංග කලා (සෞ.ක.වි) | 2 |
| දෘශ්‍ය කලා (සෞ.ක.වි) | 2 |
| තේ තාක්‍ෂණය සහ අගය වැඩිකිරීම | 1 |
| ඛනිජ සම්පත් සහ තාක්‍ෂණය | 1 |
| කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය (අග්නිදිග වි.වි) | 1 |
| ආගනණය සහ තොරතුරු පද්ධති | 1 |
| ශාරීරික අධ්‍යාපනය | 1 |
| ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය | 1 |
| ජලජ සම්පත් තාක්‍ෂණය | 1 |
| ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිලිබඳ කළමනාකරණය | 1 |
| තොරතුරු තාක්‍ෂණය හා කළමනාකරණය | 1 |
| සංචාරක හා සත්කාරක කළමනාකරණය | 1 |
| කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය | 1 |
| හරිත තාක්ෂණය | 1 |
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | 1 |
| සිනමා හා රූපවාහිනී අධ්‍යයනය | 1 |
| ව්‍යාපෘති කළමනාකරණය | 1 |
| ඉංජිනේරු තාක්ෂණය | 1 |

| | |
|---|---|
| ආහාර ව්‍යාපාර කළමනාකරණය | 1 |
| ව්‍යාපාර විද්‍යාව | 1 |
| මූල්‍ය ඉංජිනේරු විද්‍යාව | 1 |
| **2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා තෝරාගත් මුළු සංඛ්‍යාව** | **179** |

වගුව **4.2 2017/2018** අධ්‍යයන වර්ෂය: ජාතික/අන්තර්ජාතික මට්ටමින් අධ්‍යයන හැර වෙනත් ක්ෂේත්‍රවල විශිෂ්ඨ දක්ෂතා දැක්වූ සිසුන්

ආ. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට විදේශ සුදුසුකම් සහිත සිසුන් ඇතුළත් කිරීම

පවත්නා නීතිරීති හා රෙගුලාසි වලට අනුව, සෑම අධ්‍යයන වර්ෂයකදීම ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සඳහා විදේශීය සුදුසුකම් ඇති සීමිත සිසුන් සංඛ්‍යාවක් ඇතුළත් කිරීමට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවෙන් පිටත විදේශ රටක දී ශ්‍රී ලංකාවේ අ.පො.ස (උසස්/පෙළ) විභාගයට සමාන විදේශීය සුදුසුකම් ලත් සිසුන්ට මෙම කාණ්ඩය යටතේ අයදුම් කළ හැකි වේ.

මෙම විධිවිධානය යටතේ සිසුන් තෝරා ගැනීමේදී පහත සඳහන් ප්‍රමුඛතා අනුපිළිවෙල අනුගමනය කරන ලදී;

i. විදේශීය රටවල දැනට සේවය කරන හෝ සේවය කර ඇති ශ්‍රී ලාංකික තානාපති නිලධාරීන්ගේ දරුවන්
ii. ශ්‍රී ලංකාවේ සිටින විදේශීය තානාපති සේවා නිලධාරීන්ගේ දරුවන්
iii. ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට අපේක්ෂා කරන සාර්ක් රටවල අයදුම්කරුවන්
iv. ඉහත (i) යටතේ ආවරණය නොවන ශ්‍රී ලාංකික සිසුන්
v. ඉහත (ii) සහ (iii) යටතේ ආවරණය නොවන අනෙකුත් විදේශීය සිසුන්

ඉහත (i) කාණ්ඩය යටතට ගැනෙන අපේක්ෂකයින් හැර අනෙකුත් තෝරාගත් අයදුම්කරුවන් ගාස්තු අය කිරීමේ පදනම මත ඇතුළත් කර ගන්නා ලදී.

ඒ අනුව, එක් එක් පාඨමාලාවේ ඇති මුළු ස්ථාන සංඛ්‍යාවෙන් 0.5% ක් දක්වා විදේශීය සුදුසුකම් ඇති සිසුන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව විදේශීය සුදුසුකම් ඇති සිසුන් සඳහා වෙන් කර ඇත.

මෙයට අමතරව, එක් එක් අධ්‍යයන පාඨමාලාවේ යෝජිත ඇතුළත් කර ගැනීමේ ස්ථාන සංඛ්‍යාවට වඩා වැඩිපුර 4.5%ක් දක්වා වන ප්‍රමාණයක් විදේශීය සුදුසුකම් සහිත සිසුන් (ශ්‍රී ලාංකික හෝ විදේශීය) වෙනුවෙන් ගාස්තු අයකර ගැනීමේ පදනම මත විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා වෙන් කොට ඇත.

ඒ අනුව, 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා පහත දැක්වෙන 4.3 වගුවේ දක්වා ඇති පරිදි මෙම විධිවිධාන යටතේ සිසුන් 26 දෙනෙකු ඇතුළත් කර ගන්නා ලදී.

| අධ්‍යයන පාඨමාලාව | **2017/2018** අධ්‍යයන වර්ෂයේ **0.5%** යටතේ තෝරා ගත් ගණන | **2017/2018** අධ්‍යයන වර්ෂයේ **4.5%** යටතේ තෝරා ගත් ගණන |
|---|---|---|
| 1. වෛද්‍ය විද්‍යාව | 07 | 13 |
| 2. ඉංජිනේරු විද්‍යාව | 02 | - |
| 3. කලා | 03 | - |

| | | |
|---|---|---|
| 4. නගර හා ග්‍රාම නිර්මාණය | 01 | - |
| එක් එක් කාණ්ඩය යටතේ එකතුව | **13** | **13** |
| **2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා තෝරාගත් මුළු සංඛ්‍යාව** | **26** | |

වගුව **4.3 2017/2018** අධ්‍යයන වර්ෂය **:** ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සඳහා විදේශීය සුදුසුකම් සහිත සිසුන් ඇතුළත් කර ගැනීම

ඇ. සන්නද්ධ සේවා, පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් ඇතුළත් කර ගැනීම.

මෙම විධිවිධාන යටතේ, ඉංජිනේරු විද්‍යාව, වෛද්‍ය හා දන්ත ශල්‍ය විද්‍යාව යන පාඨමාලාවල ඇති ස්ථාන සංඛ්‍යාවෙන් 0.5% ක ප්‍රමාණයක් දක්වා (එකඟ වූ මුළු සංඛ්‍යාවට යටත්ව) ස්ථිර සේවයේ නියුක්ත සන්නද්ධ සේවා නිලධාරීන් සහ මෙහෙයුම් ප්‍රදේශවල සේවය කරන පොලිස් සේවයේ හා විශේෂ කාර්ය බලකායේ නිත්‍ය පිරිස් සඳහා වෙන්කර ඇත.

ඈ. ගුරුවරුන් ඇතුළත් කිරීම

සෑම අධ්‍යයන වර්ෂයකදී ම පහත කාණ්ඩ දෙකට අයත් ගුරුවරුන් සීමිත සංඛ්‍යාවක් කලා, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, සහ ව්‍යවහාරික විද්‍යාව යන අධ්‍යයන පාඨමාලා සඳහා ඇතුළත් කිරීමට විධිවිධාන සලසා ඇත.

i. කලා අධ්‍යයන පාඨමාලාව - 2013 වර්ෂයේ හෝ අනතුරුව ඉංග්‍රීසි විෂයයක් වශයෙන් සාමාර්ථයක් සහිතව සාමාන්‍ය කලා යෝග්‍යතා (බාහිර) පරීක්ෂණය සමත් ගුරුවරු

ii. ජීව විද්‍යාව, භෞතික විද්‍යාව සහ ව්‍යවහාරික විද්‍යා අධ්‍යයන පාඨමාලා - 2013 වර්ෂයේ හෝ ඉන් අනතුරුව විද්‍යාවේදී (බාහිර) පළමු උපාධි පරීක්ෂණය සමත් ගුරුවරු

ඒ අනුව; 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා මෙම කාණ්ඩ යටතේ ගුරුවරුන් 10 දෙනෙකු තෝරා ගන්නා ලදී.

ඉ. විශ්වවිද්‍යාල ප්‍රවේශය හා අදාළ අභියාචනා

සෑම වර්ෂයකදී ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ අභියාචනා සළකා බැලීමටත් ලද පැමිණිලි පරීක්ෂා කර බැලීමටත් කමිටුවක් පත් කරනු ලබයි. ඒ අනුව, මහාචාර්ය මොහාන් ද සිල්වා (සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව) - කමිටු ප්‍රධානී, මහාචාර්ය පී.එස්.එම්.ගුණරත්න (උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව) - සාමාජික, මහාචාර්ය මලික් රණසිංහ (සාමාජික/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව) - සාමාජික, මහාචාර්ය එස්.ජී.ජේ.එන්.සේනානායක (උපකුලපති/ රුහුණ විශ්වවිද්‍යාලය, සභාපති/ උපකුලපති හා අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව) - සාමාජික, ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර (ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව) - සාමාජික, ඩිෂාන් ජයන්ත / අතිරේක ලේකම් (විශ්වවිද්‍යාල ප්‍රවේශ) - සාමාජික සහ නිශාන්තා කඹුරාදෙණිය මෙය / සහකාර ලේකම් (විශ්වවිද්‍යාල ප්‍රවේශ) - සාමාජික සහ ලේකම් යන නිලධාරීන් 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ අභියාචනා හා පැමිණිලි පරීක්ෂා කිරීමටත් වාර්තා කිරීමටත් සඳහා වන කමිටුවේ සාමාජිකයන් ලෙස පත් කරන ලදී.

ඒ අනුව, 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා කමිටුවට වෙත අභියාචනා හා පැමිණිලි 1,537 ක් ලැබී තිබුණි. ඒ අතරින්, පහත 4.4 වගුවේ දක්වා ඇති පරිදි පහත අධ්‍යයන පාඨමාලා හා අදාළව ඉදිරිපත් කරන ලද අභියාචනා 72ක් සඳහා අනුමැතිය ලබා දීමට කමිටුව විසින් තීරණය කරන ලදී.

| **2017/2018 අධ්‍යයන වර්ෂය** | |
|---|---|
| අනුමැතිය හිමි වූ ශිෂ්‍ය අභියාචනා / පැමිණිලි සංඛ්‍යාව | අනුමැතිය හිමි වූ ශිෂ්‍ය අභියාචනා / පැමිණිලි සංඛ්‍යාව |
| වෛද්‍ය විද්‍යාව | 1 |
| පශු වෛද්‍ය විද්‍යාව | 1 |
| කෘෂිකර්මය | 2 |
| කෘෂිකර්මය | 2 |
| කෘෂිකර්මය | 1 |
| ආහාර විද්‍යාව හා පෝෂණය | 1 |
| ජෛවීය විද්‍යාව | 1 |
| ජෛවීය විද්‍යාව | 1 |
| ජෛවීය විද්‍යාව | 2 |
| ජෛවීය විද්‍යාව | 1 |
| ව්‍යවහාරික විද්‍යාව (ජෛවීය විද්‍යාව) | 1 |
| ව්‍යවහාරික විද්‍යාව (ජෛවීය විද්‍යාව | 1 |
| ඉංජිනේරු විද්‍යාව | 1 |
| පරිගණක විද්‍යාව | 1 |
| පරිගණක විද්‍යාව | 1 |
| පරිගණක විද්‍යාව | 1 |
| භෞතිය විද්‍යාව | 2 |
| භෞතිය විද්‍යාව | 1 |
| භෞතිය විද්‍යාව | 1 |
| භෞතිය විද්‍යාව | 1 |
| භෞතිය විද්‍යාව | 1 |
| භෞතිය විද්‍යාව | 2 |
| ව්‍යවහාරික විද්‍යාව (භෞතිය විද්‍යාව) | 1 |
| ව්‍යවහාරික විද්‍යාව (භෞතිය විද්‍යාව) | 1 |
| ව්‍යවහාරික විද්‍යාව (භෞතිය විද්‍යාව) | 1 |
| කළමනාකරණය | 1 |
| කළමනාකරණය | 3 |
| වාණිජ්‍යය | 1 |
| කලා | 1 |
| කලා | 4 |
| කළමනාකරණ අධ්‍යයන (TV) | 1 |
| සන්නිවේදන අධ්‍යයනය | 1 |
| ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 1 |
| ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය | 2 |
| ආහාර විද්‍යාව හා තාක්ෂණය | 1 |
| ආහාර විද්‍යාව හා තාක්ෂණය | 1 |

| | |
|---|---|
| සිද්ධ වෛද්‍ය විද්‍යාව | 1 |
| හෙද | 1 |
| හෙද | 1 |
| කළමනාකරණ අධ්‍යයන (TV) | 1 |
| කලා (SAB) | 1 |
| සෞඛ්‍ය ප්‍රවර්ධන | 1 |
| ඖෂධ විද්‍යාව | 1 |
| අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව | 2 |
| ධීවර සහ සාගර විද්‍යාව | 2 |
| විද්‍යාව හා තාක්‍ෂණය | 1 |
| පරිගණක විද්‍යාව හා තාක්‍ෂණය | 1 |
| අපනයන කෘෂිකර්මය | 1 |
| ආගනණය සහ තොරතුරු පද්ධති | 1 |
| ශාරීරික අධ්‍යාපනය | 1 |
| ආහාර නිෂ්පාදනය සහ තාක්‍ෂණ කළමනාකරණය | 1 |
| කෘෂි සම්පත් කළමනාකරණය හා තාක්ෂණය | 1 |
| ඉංජිනේරු තාක්ෂණය | 1 |
| ජෛව පද්ධති තාක්ෂණය | 3 |
| දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම | 1 |
| සාගර හා මිරිදිය විද්‍යා | 1 |
| ආහාර ව්‍යාපාර කළමනාකරණය | 1 |
| **2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා එකතුව** | **72** |

වගුව **4.4 2017/2018** අධ්‍යයන වර්ෂය: අනුමත වූ අභියාචනා /පැමිණිලි මගින් සිදු කළ ඇතුළත් කිරීම් ගණන

# 5. අධ්‍යයන සංවර්ධනය හා අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම

## 5.1 ස්ථාවර කමිටු

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ (වරින් වර සංශෝධිත) 4 (2) ඡේදයේ විධිවිධාන යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ස්ථාවර කමිටු පිහිටුවා ඇත. එක් එක් ස්ථාවර කමිටුවේ වගකීම නම් අදාළ ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය හා සම්බන්ධ කරුණු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීමය. ඒ අනුව 2018 වර්ෂය තුළ විවිධ විෂය ක්ෂේත්‍ර සඳහා ස්ථාවර කමිටු දහඅටක් (18) හා වෙනත් එක් (1) කමිටුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ ස්ථාපනය කර ක්‍රියාත්මක විය. එම එක් එක් කමිටු හා ඒ යටතේ පැවැති රැස්වීම් වාර ගණන පහත 5.1 වගුවේ සඳහන් කර ඇත.

| අංකය | ස්ථාවර කමිටුවේ නම | 2018 වර්ෂයේදී පැවැති රැස්වීම් ගණන |
|---|---|---|
| 01. | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ස්ථාවර කමිටුව | 02 |
| 02. | වෛද්‍ය හා දන්ත වෛද්‍ය විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව | 06 |
| 03. | දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව | 05 |
| 04. | විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව | 05 |
| 05. | කෘෂිකර්ම, පශු වෛද්‍ය විද්‍යා හා සත්ත්ව පාලන විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව | 02 |

| | | |
|---|---|---|
| 06. | පශ්චාත් උපාධි අධ්‍යයනය හා පර්යේෂණය පිළිබඳ ස්ථාවර කමිටුව | 03 |
| 07. | ඉංජිනේරු හා වාස්තු විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුව | 05 |
| 08. | තාක්ෂණ විෂය ධාරාව පිළිබඳ ස්ථාවර කමිටුව | 05 |
| 09. | මානව ශාස්ත්‍ර සමාජ විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව | 03 |
| 10. | අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව | 03 |
| 11. | ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව | 04 |
| 12. | කළමනාකරණ අධ්‍යයන පිළිබඳ ස්ථාවර කමිටුව | 04 |
| 13. | බාහිර උපාධි පිළිබඳ ස්ථාවර කමිටුව | 05 |
| 14. | පරිගණනය පිළිබඳ ස්ථාවර කමිටුව | 05 |
| 15. | නීති අධ්‍යයන පිළිබඳ ස්ථාවර කමිටුව | 01 |
| 16. | පුස්තකාල හා තොරතුරු විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව | 04 |
| 17. | ලලිත කලා පිළිබඳ ස්ථාවර කමිටුව | 01 |
| 18. | සම සෞඛ්‍ය විද්‍යා පිළිබඳ ස්ථාවර කමිටුව | 02 |
| වෙනත් කමිටු | | 04 |
| 19. | සුදුසුකම් /උපාධි ප්‍රදාන ආයතන පිළිගනු ලැබීම සඳහා වූ අයදුම්පත් අධ්‍යයනය කිරීම සඳහා වූ කමිටුව | |

**වගුව 5.1 ස්ථාවර කමිටු සහ 2018 දී පවත්වන ලද රැස්වීම් ගණන**

## 5.2 2018 වර්ෂය තුළ අනුමත කරන ලද පීඨ / අධ්‍යයනාංශ / ප්‍රථම උපාධි පාඨමාලා, බාහිර හා පශ්චාත් උපාධි පාඨමාලා වැඩසටහන්

අවස්ථා ප්‍රමාණය වැඩි කිරීම සහ උසස් අධ්‍යාපනයට ඇති ප්‍රවේශ ගණන වැඩි කිරීමේ අභිප්‍රාය ඇතිව, 2018 වර්ෂය තුළ නව පීඨ 2 ක්, නව අධ්‍යයනාංශ 27 ක්, නව ප්‍රථම උපාධි පාඨමාලා 12 ක්, නව බාහිර උපාධි පාඨමාලා වැඩසටහන් 1 ක් සහ නව පශ්චාත් උපාධි පාඨමාලා වැඩසටහන් 7 ක් හඳුන්වා දී අනුමත කරන ලදී. මේවා පිළිබඳ විස්තර පහත වගු 5.2 සිට 5.6 තෙක් දක්වා ඇත;

| අංකය | පීඨයේ නම | විශ්වවිද්‍යාලය | කොමිෂන් සභා රැස්වීම් අංකය |
|---|---|---|---|
| 1. | හින්දු අධ්‍යයන පීඨය *(ගැසට් පත්‍රයේ පළ කිරීමට නියමිතය)* | යාපනය විශ්වවිද්‍යාලය | 996 |
| 2. | වෛද්‍ය පීඨය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |

**වගුව 5.2: 2018 වර්ෂයේදී අනුමත කරන ලද පීඨ**

| අංකය | අධ්‍යයනාංශයේ නම | විශ්වවිද්‍යාලය | කොමිෂන් සභා රැස්වීම් අංකය |
|---|---|---|---|
| 1. | පවුල් වෛද්‍ය අධ්‍යයනාංශය *(ගැසට් පත්‍රයේ පළ කිරීමට නියමිතය)* | කොළඹ විශ්වවිද්‍යාලය | 999 |
| 2. | බහු අවයවික විද්‍යා අධ්‍යයනාංශය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 992 |
| 3. | ජෛව සිද්ධාන්ත අධ්‍යයනාංශය *(ගැසට් පත්‍රයේ පළ කිරීමට නියමිතය)* | යාපනය විශ්වවිද්‍යාලය | 996 |
| 4. | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය *(ගැසට් පත්‍රයේ පළ කිරීමට නියමිතය)* | යාපනය විශ්වවිද්‍යාලය | 996 |
| 5. | මාධ්‍ය අධ්‍යයන අධ්‍යයනාංශය *(ගැසට් පත්‍රයේ පළ කිරීමට නියමිතය)* | යාපනය විශ්වවිද්‍යාලය | 997 |
| 6. | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය (DELT) | රුහුණ විශ්වවිද්‍යාලය | 984 |
| 7. | පරිගණක අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 983 |
| 8. | කාය ව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |

| | | | |
|---|---|---|---|
| 9. | ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 10. | කායික විද්‍යා අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 11. | පරපෝෂ විද්‍යා අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 12. | ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 13. | අධිකරණ වෛද්‍ය අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 14. | ව්‍යාධි නිධාන විද්‍යා අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 15. | ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 16. | පවුල් වෛද්‍ය අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 17. | භිෂග්වේද විද්‍යා අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 18. | ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 19. | වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 20. | ළමා රෝග වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 21. | ශෘක විද්‍යා හා නාරිවේද අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 22. | මනෝ වෛද්‍ය අධ්‍යයනාංශය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 23. | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය (DELT) | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 984 |
| 24. | භෞතික විද්‍යා අධ්‍යයනාංශය *(ගැසට් පත්‍රයේ පල කිරීමට නියමිතය)* | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 995 |
| 25. | රසායනික විද්‍යා අධ්‍යයනාංශය *(ගැසට් පත්‍රයේ පල කිරීමට නියමිතය)* | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 995 |
| 26. | සංචාරක අධ්‍යයන අධ්‍යයනාංශය *(ගැසට් පත්‍රයේ පල කිරීමට නියමිතය)* | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 998 |
| 27. | ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය *(ගැසට් පත්‍රයේ පල කිරීමට නියමිතය)* | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 998 |

වගුව **5.3: 2018** වර්ෂයේ අනුමත කරන ලද අධ්‍යයනාංශ

| අංකය | උපාධි වැඩසටහනේ නම | විශ්වවිද්‍යාලය | කොමිෂන් සභා රැස්වීම් අංකය |
|---|---|---|---|
| 1. | කොරියානු අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය ([ශාස්ත්‍රවේදී ගෞරව (කොරියානු අධ්‍යයනය)]) | කැලණිය විශ්වවිද්‍යාලය | 990 |
| 2. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 996 |
| 3. | සමුද්‍ර ඉංජිනේරු සහ නාවික ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය [ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව (ඉංජිනේරු)] | රුහුණ විශ්වවිද්‍යාලය | 984 |
| 4. | මනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 979 |
| 5. | ව්‍යවහාරික භෞතික විද්‍යාව හා ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය (ත්‍රිකුණාමල මණ්ඩපය) | 983 |
| 6. | භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 996 |
| 7. | වෛද්‍ය විද්‍යාවේදී සහ ශල්‍ය විද්‍යාවේදී උපාධිය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 988 |
| 8. | වෛද්‍ය විද්‍යාවේදී සහ ශල්‍ය විද්‍යාවේදී උපාධිය | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 995 |
| 9. | සාමය හා ගැටුම් නිරාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය [ශාස්ත්‍රවේදී ගෞරව (සාමය සහ ගැටුම් | කැලණිය විශ්වවිද්‍යාලය | 997 |

| | | | |
|---|---|---|---|
| | නිරාකරණය)] | | |
| 10. | විගණනය හා අධිකරණ ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 11. | සමාජ කටයුතු පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය [සමාජ කටයුතු පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව)] | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 998 |
| 12. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය (BICT) | කොළඹ විශ්වවිද්‍යාලය | 998 |

වගුව **5.4: 2018** වර්ෂයේ දී අනුමත කරන ලද ප්‍රථම උපාධි පාඨමාලා

| අංකය | උපාධි වැඩසටහනේ නම | විශ්වවිද්‍යාලය | කොමිෂන් සභා රැස්වීම් අංකය |
|---|---|---|---|
| 1. | ආහාර තත්ත්ව කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 998 |

වගුව **5.5: 2018** වර්ෂයේ දී අනුමත කරන ලද බාහිර උපාධි පාඨමාලා

| අංකය | උපාධි වැඩසටහනේ නම | විශ්වවිද්‍යාලය | කොමිෂන් සභා රැස්වීම් අංකය |
|---|---|---|---|
| **1.** | මාධ්‍ය පර්යේෂණ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය [ශාස්ත්‍රපති උපාධිය (මාධ්‍ය පර්යේෂණ)] | කොළඹ විශ්වවිද්‍යාලය | 984 |
| 2. | මුඛ වෛද්‍ය විද්‍යාව හා මුඛ විකිරණවේදය පිළිබඳ ශාස්ත්‍රපති | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 978 |
| 3. | මුඛ වෛද්‍ය විද්‍යාව හා මුඛ විකිරණවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 978 |
| 4. | ඉදිකිරීම් හා ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ඉංජිනේරු විද්‍යාපති උපාධිය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 989 |
| 5. | ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 996 |
| 6. | තිරසාර සංචාරක ව්‍යාපාරය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය [ශාස්ත්‍රපති උපාධිය (තිරසාර සංචාරක ව්‍යාපාරය)] | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 997 |
| 7. | තිරසාර සංචාරක ව්‍යාපාරය පිළිබඳ විද්‍යාපති උපාධිය [විද්‍යාපති උපාධිය (තිරසාර සංචාරක ව්‍යාපාරය)] | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 997 |

වගුව **5.6: 2018** වර්ෂයේ දී අනුමත කරන ලද පශ්චාත් උපාධි පාඨමාලා

## 5.3 2018 වර්ෂය තුළ අනුමත කරන ලද අධ්‍යයනාංශ හා ප්‍රථම උපාධි පාඨමාලාවල නම වෙනස් කිරීම්

2018 වර්ෂය තුළ පිළිවෙලින් 5.7 වගුවේ සහ 5.8 වගුවේ දක්වා ඇති විස්තර අනුව අධ්‍යයනාංශ නාම වෙනස් කිරීම් 2 ක් සහ ප්‍රථම උපාධි පාඨමාලා නාම වෙනස් කිරීම් 46 ක් යෝජනා කර අනුමත කරන ලදී.

| අංකය | අධ්‍යයනාංශයේ දැනට පවතින නම | අධ්‍යයනාංශයේ අනුමත නම | විශ්වවිද්‍යාලය | කොමිෂන් සභා රැස්වීම් අංකය |
|---|---|---|---|---|
| 1. | සංස්කෘත අධ්‍යයනාංශය | සංස්කෘත හා පෙරදිග අධ්‍යයන අධ්‍යයනාංශය | කැලණිය විශ්වවිද්‍යාලය | 978 |

| | | | | |
|---|---|---|---|---|
| 2. | භෞතික විද්‍යා අධ්‍යයනාංශය | භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රොනික අධ්‍යයනාංශය | කැලණිය විශ්වවිද්‍යාලය | 999 |

වගුව **5.7: 2018** වර්ෂය තුළ අනුමත කරන ලද අධ්‍යයනාංශ නාම වෙනස් කිරීම්

| අංකය | වැඩසටහනේ දැනට පවතින නම | වැඩසටහනේ අනුමත නම | විශ්වවිද්‍යාලය | කොමිෂන් සභා රැස්වීම් අංකය |
|---|---|---|---|---|
| 1. | බී.එස්සී | විද්‍යාවේදී | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 2. | විද්‍යාවේදී භෞතික විද්‍යාව හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (B.Sc. in Physics and ICT) | භෞතික විද්‍යාව හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 3. | විද්‍යාවේදී (විශේෂ) රසායන විද්‍යාව | රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 4. | විද්‍යාවේදී (විශේෂ) ශාක ජෛව තාක්ෂණය | ශාක ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 5. | විද්‍යාවේදී (විශේෂ) ක්ෂුද්‍රජීව විද්‍යාව | ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 6. | විද්‍යාවේදී (විශේෂ) ශාක ජීව විද්‍යාව | ශාක ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 7. | විද්‍යාවේදී (විශේෂ) සත්ත්ව විද්‍යාව | සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 8. | විද්‍යාවේදී (විශේෂ) ජලජ සම්පත් කළමනාකරණය | ජලජ සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 9. | විද්‍යාවේදී (විශේෂ) පාරිසරික කළමනාකරණය සහ වන විද්‍යාව | පාරිසරික කළමනාකරණය සහ වන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 10. | විද්‍යාවේදී (විශේෂ) ගණිතය | ගණිතය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 11. | විද්‍යාවේදී (විශේෂ) ව්‍යවහාරික ගණිතය | ව්‍යවහාරික ගණිතය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 12. | විද්‍යාවේදී (විශේෂ) භෞතික විද්‍යාව | භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 13. | විද්‍යාවේදී (විශේෂ) සංඛ්‍යානය | සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 14. | විද්‍යාවේදී (විශේෂ) පරිගණක විද්‍යාව | පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 15. | විද්‍යාවේදී (විශේෂ) ජීව විද්‍යාව | ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 16. | විද්‍යාවේදී (විශේෂ) කාර්මික රසායන විද්‍යාව | කාර්මික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 17. | විද්‍යාවේදී (විශේෂ) බහු අවයවික රසායන විද්‍යාව | බහු අවයවික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |

| | | | | |
|---|---|---|---|---|
| 18. | විද්‍යාවේදී (විශේෂ) ආහාර විද්‍යා හා තාක්ෂණය | ආහාර විද්‍යා හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 19. | විද්‍යාවේදී (විශේෂ) ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය | ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 20. | විද්‍යාවේදී (ගෞරව) ව්‍යවහාරික විද්‍යා | ව්‍යවහාරික විද්‍යා පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 998 |
| 21. | පරිගණක ජාල තාක්‍ෂණය පිළිබඳ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණවේදී උපාධිය | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණවේදී උපාධිය (BICT) | කැලණිය විශ්වවිද්‍යාලය | 996 |
| 22. | රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 23. | භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 24. | ගණිත භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | ගණිත භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 25. | සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 26. | උද්භිත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | උද්භිත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 27. | අණුක ජීව විද්‍යාව හා ශාක ජෛව තාක්‍ෂණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | අණුක ජීව විද්‍යාව හා ශාක ජෛව තාක්‍ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 28. | ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 29. | සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 30. | ගණිතය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | ගණිතය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 31. | දර්ශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය | දර්ශනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 32. | කථන හා ශ්‍රවණ විද්‍යා පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | කථන හා ශ්‍රවණ විද්‍යා පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 33. | මනෝවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය | මනෝවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |

| | | | | |
|---|---|---|---|---|
| 34. | භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි වැඩසටහන | භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 35. | සංවර්ධන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි වැඩසටහන | සංවර්ධන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 36. | දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය | දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 37. | ජාත්‍යන්තර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය | ජාත්‍යන්තර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 38. | ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය | ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 39. | සමාජ සංඛ්‍යානය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය | සමාජ සංඛ්‍යානය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 40. | ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි වැඩසටහන | පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 41. | ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි වැඩසටහන | සංචාරක හා සංස්කෘතික සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 42. | ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි වැඩසටහන | ක්‍රීඩා හා විනෝදාත්මක කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 43. | ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි වැඩසටහන | ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 44. | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | කැලණිය විශ්වවිද්‍යාලය | 998 |
| 45. | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය [BSc Hons (Agriculture)] | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 998 |
| 46. | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (B.Sc. (Agric.)) | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය [BSc Hons (Agriculture)] | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 998 |

වගුව **5.8: 2018** වර්ෂය තුළ අනුමත කරන ලද ප්‍රථම උපාධි පාඨමාලා නාම වෙනස් කිරීම්

## 5.4 'ජාතික නීති ගුරු සමුළුව 2018' - ජාතික වැදගත්කමකින් යුතු වැඩමුළුවක්

නීති අධ්‍යයන පිළිබඳ ස්ථාවර කමිටුවේ නිර්දේශයට අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද "ජාතික නීති ගුරු සමුළුව" 2018 ජනවාරි 26 දින පැවැත්විණි. රටේ අග්‍රවිනිශ්චයකාරවරයකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පැමිණි පළමු අවස්ථාව මෙය වන අතර, අගවිනිසුරු ජනාධිපති නීතිඥ ප්‍රියසාත් ඩෙප් මහතා විසින් "ජාතික නීති ගුරු සම්මේලනය 2018" හි ප්‍රධාන දේශනය පැවැත්විය.

සෙසු ආරාධිත කථිකයින් ලෙස ආචාර්ය හර්ෂ කබ්රාල් (ජනාධිපති නීතිඥ), ආචාර්ය දීපිකා උඩගම (සභාපති-මානව හිමිකම් කොමිෂන් සභාව), ආචාර්ය ජේ. එම්. ස්වාමිනාදන් (ජ්‍යෙෂ්ඨ

හවුල්කරු, ජුලියස් සහ ක්‍රීසි නීති සමාගම), අලි සැබ්රි මහතා (ජනාධිපති නීතීඥ සහ නියෝජ්‍ය සභාපති, ශ්‍රී ලංකා නීති නිතීඥ සංගමය) සහ ආචාර්ය වික්‍රම වීරසූරිය (කොමිෂන් සභා සාමාජික, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව) සහභාගී විය. මීට අමතරව, යූ.ආර් ද සිල්වා මහතා (ජනාධිපති උපදේශක සහ සභාපති, ශ්‍රී ලංකා නිතීඥ සංගමය), ජෙෆ්රි අලගරත්නම් මහතා (ජනාධිපති උපදේශක සහ හිටපු සභාපති, ශ්‍රී ලංකා නිතීඥ සංගමය) සහ ඉන්දිරා සමරසිංහ මහත්මිය (ජනාධිපති උපදේශක සහ විදුහල්පති, ලංකා නීති විද්‍යාලය) යන අය ද මෙම අවස්ථාවට ආරාධිත අමුත්තන් ලෙස සහභාගී විය.

රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ නීති ගුරුවරුන් සඳහා මෙවැනි සමුළුවක් ශ්‍රී ලංකාවේ සංවිධානය කළ පළමු අවස්ථාව මෙය වේ. එය ඉතා සාර්ථක වූ අතර සහභාගී වූ සියලු දෙනාගේ ඇගයීමට ද ලක්විය. මෙම එක්දින වැඩමුළුවට 80 දෙනෙකු සහභාගී වූ අතර විශේෂ ආරාධිතයින් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති, උප සභාපති සහ මහාචාර්ය උමා කුමාරස්වාමි (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති සහ අධ්‍යක්ෂ, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව) සහභාගී වූහ.

සම්මන්ත්‍රණයේ තේමාව වූයේ "නීති අධ්‍යාපනයේ අදාළත්වය ඇගයීම" යන්නයි. එය රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ නීති අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහතික කිරීමේ වැදගත්කම පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිළිගැනීම සංකේතවත් කරයි.

සම්මන්ත්‍රණය පහත සඳහන් ක්ෂේත්‍ර සාකච්ඡාවට ගන්නා ලදී :

- නීති අධ්‍යාපනය සම්බන්ධයෙන් අප නිවැරදි දිශාවට ගමන් කරමින් සිටිනවාද?
- රජයේ නීති පීඨවලින් පිටවන නීති උපාධිධාරීන් හොඳ තත්ත්වයේ සහ වර්තමාන අභියෝගයන්ට මුහුණ දීමට සූදානම්ද?
- නීතිඥයින් ලෙස හෝ අපේ රටට වාසිදායක වන වෙනත් රැකියා අංශවල නීති උපාධිධාරීන්ට අර්ථවත් රැකියාවක් සොයා ගත හැකිද?
- නීති සිසුන්ට උගන්වනු ලබන විෂයයන්ට අදාළ තත්වයක් හා ප්‍රායෝගික වටිනාකමක් තිබේද?
- විෂය නිර්දේශයන් පිළිබඳව සෑහීමකට පත්විය හැකිද? නැතහොත් ඒවාට සංශෝධන හා යාවත්කාලීන කිරීම් අවශ්‍යද?
- නීති ගුරුවරුන් / සිසුන් සඳහා ප්‍රමාණවත් පෙළපොත් සහ විෂයානුබද්ධ ලිපි තිබේද?
- ඉගැන්වීමේ මාධ්‍යය කුමක් විය යුතුද - ඉංග්‍රීසි / සිංහල / දෙමළ?
- විදේශීය එල්.එල්.බී උපාධි ලබා ඇති ශ්‍රී ලාංකික සිසුන්, දේශීය එල්.එල්.බී උපාධි ලබා ඇති ශ්‍රී ලාංකික සිසුන් සමඟ තරඟ කරන්නේද?
- විදේශීය එල්.එල්.බී උපාධි ලබා ඇති සිසුන් ගණන, දේශීය එල්.එල්.බී උපාධි ලබා ඇති සිසුන්ගේ ප්‍රමාණයට වඩා වැඩි ද?

ඉහත ක්ෂේත්‍ර සහ සවිස්තරාත්මක සාකච්ඡා මත පදනම්ව පහත සඳහන් නිර්දේශ දහය සමුළුවේදී ඉදිරිපත් කරන ලදී;

1. විෂයමාලා සංවර්ධන කමිටු විසින් නීතිය පිළිබඳ උපාධි පාඨමාලා සඳහා හඳුන්වා දිය යුතු නව හා අදාළ විෂයයන් පිළිබඳව කටයුතු කළ යුතුය.

2. නව ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් හඳුන්වා දිය යුතුය.

3. එල්එල්බී සඳහා ඉගැන්වීමේ මාධ්‍යය ලෙස ඉංග්‍රීසි හඳුන්වා දිය යුතුය.

4. රැකියා ක්ෂේත්‍රයේ නිසි පරිදි ස්ථානගත වී ඇත්දැයි බැලීමට රාජ්‍ය විශ්වවිද්‍යාල නීති උපාධිධාරීන්ගේ සහ නීති විද්‍යාලයෙන් සමත්වූවන්ගේ තත්ත්වය සොයා ගැනීම සඳහා රැකියා සමීක්ෂණය පැවැත්විය යුතුය.

5. නීති ආධාර වැඩසටහන් ශක්තිමත් කළ යුතුය.

6. නීති අධ්‍යාපනයේ නිරාවරණය ලබා ගැනීම සඳහා වෘත්තියෙහි නියුතු නීතිඥයන්ට ඇහුම්කන් දීමට පීඨ සහ දෙපාර්තමේන්තු සිසුන්ට වැඩි අවස්ථාවන් ලබා දිය යුතුය.

7. රාජ්‍ය විශ්වවිද්‍යාල සහ රාජ්‍ය නොවන නීති අධ්‍යයන හා උපාධි ප්‍රදානය කරන ආයතනවල නාමාවලියක් පවත්වාගෙන යා යුතුය.

8. නීතිය පිළිබඳ ස්ථාවර කාරක සභාව යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දත්ත ගබඩාවක් ලෙස සිද්ධි පොත හඳුන්වා දීමේ අවශ්‍යතාවයක් පවතී.

9. නීති සිසුන් සඳහා මෘදු නිපුණතා පුහුණු වැඩසටහන් සංවිධානය කර පැවැත්විය යුතුය.

10. ගෝලීය වශයෙන් සිදුවන වෙනස්කම්වලට අනුකූලව එල්එල්බී මඟින් පිරිනමන විෂයයන් ගණන සහ කාලසීමාව නැවත සලකා බලා සමාලෝචනය කළ යුතුය.

රාජ්‍ය විශ්වවිද්‍යාලවල නීති උපාධිධාරීන් උගන්වන සියලුම කථිකාචාර්යවරුන් මෙම එක්දින සමුළුවට සහභාගී වූ අතර ඔවුන්ට සහභාගී වීමේ සහතික ප්‍රදානය කරන ලදී.

## 5.5 'ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL)' ට අදාලව විශ්වවිද්‍යාල පද්ධති නියාමක පරීක්ෂණය 2018 වසරේ දී පැවැත්වීම.

ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය (UTEL) යනු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින් සඳහා පවත්වනු ලබන ජාතික මට්ටමේ පරීක්ෂණයකි. ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණයෙහි ප්‍රධාන පරමාර්ථය වනුයේ රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා පිළිගත් ජාතික මට්ටමේ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණ ක්‍රමයක් ලබා දීමයි. එමඟින් ඔවුන්ගේ උපාධි අපේක්ෂකයින්ට, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පිළිගත් සුදුසුකමක් සහිතව අනාගත රැකියා වෙළඳපොලවල වඩා හොඳ අවස්ථාවක් ලැබෙනු ඇත.

ලෝක බැංකුවේ අරමුදල් සපයන ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය ව්‍යාපෘතියේ අනුග්‍රහය ඇතිව 2013 සිට 2015 දක්වා ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය පරීක්ෂණ ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ ස්ථාවර කමිටුවේ නිර්දේශය මත, ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය විභාග පැවැත්වීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලය තුළ 'ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය පරීක්ෂණ සේවා' නමින් තිරසාර ආයතනයක් පිහිටුවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මූලික පියවර ගත් අතර මේ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අරමුදල් සපයනු ලබයි.

දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ ස්ථාවර කමිටුවේ උප කමිටුවක් වන ' පරීක්ෂණ සේවා පිහිටුවීමේ මෙහෙයුම් කමිටුව' 2018 නොවැම්බර් 26 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය හි පද්ධති නියාමක පරීක්ෂණය පවත්වන ලදී. මෙම ප්‍රයත්නයේ පරමාර්ථය වූයේ කොළඹ විශ්වවිද්‍යාලයේ, විද්‍යාලයීය මන්දිරයේ (College House) ස්ථාපිත කිරීමට යෝජිත ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණ සේවා මධ්‍යස්ථානය' හරහා දිගු කාලීනව ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණය පැවැත්වීමේ ශක්‍යතාව පරීක්ෂා කිරීමයි.

ඉහත සඳහන් කාල පරිච්ඡේදය තුළදී පවත්වන ලද පද්ධති නියාමක පරීක්ෂණය සෑම උසස් අධ්‍යාපන ආයතනයකින්ම (HEI) සිසුන් 100 ක් පරීක්ෂා කරන ලද අතර, එය සමස්ත පද්ධතියෙන් සිසුන් 1,500 ක් පමණ විය. මෙම සිසුන් තෝරාගනු ලැබුවේ නම් කරනු ලැබුවේ උසස් අධ්‍යාපන ආයතනයන් හි ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශ (DELTs) හෝ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකක (ELTUs) විසිනි. නියමු ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. මිලියන 2.88 ක් වන අතර ඉංග්‍රීසි භාෂා විශ්වවිද්‍යාල පරීක්ෂණ හි මාර්ගගත පරීක්ෂණවල කාර්යයන් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විසින් මෙහෙයවා පරිපාලනය කරන ලදී.

### 5.6 1992 මාර්තු 13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 16/92 ප්‍රකාරව දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල පිළිගැනීම

සමාලෝචිත වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු අංශය විසින් ශ්‍රී ලාංකික සිසුන් විසින් අධ්‍යයන සුදුසුකම් / විශිෂ්ටතා ලබාගෙන ඇති දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල පිළිගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ ඉල්ලීම් 3,500 කට අධික සංඛ්‍යාවක් සලකා බලන ලදී. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විශ්වවිද්‍යාල පිළිගැනීමේ ලිපි නිකුත් කිරීමේ තොරතුරු 5.9 වගුවේ සාරාංශ ගත කර දක්වා ඇත.

| ලැබුණු ඉල්ලීම් වර්ගය | නිකුත් කරන ලද ලිපි ගණන |
|---|---|
| විදේශ විශ්වවිද්‍යාල පිළිගැනීම | 2510 |
| දේශීය විශ්වවිද්‍යාල පිළිගැනීම | 1111 |
| විදේශීය විශ්වවිද්‍යාල පිළිගැනීම සඳහා UGC වෙබ් අඩවිය හරහා සිදු කරන ලද මාර්ගගත ඉල්ලීම් | 2 |
| දේශීය විශ්වවිද්‍යාල පිළිගැනීම සඳහා UGC වෙබ් අඩවිය හරහා සිදු කරන ලද මාර්ගගත ඉල්ලීම් | 8 |
| එකතුව | **3631** |

වගුව **5.9: 2018** වර්ෂයේදී දේශීය / විදේශීය විශ්වවිද්‍යාල පිළිගැනීමේ ලිපි නිකුත් කිරීම

## 6. මූල්‍ය පරිපාලනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013-2017 උපායමාර්ගික සැලැස්ම 2018 වර්ෂය දක්වා අඛණ්ඩව පවත්වාගෙන යාම අදාළ හා අවශ්‍ය යැයි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකාරිත්වය විසින් තීරණය කරන ලදී. එවැනි තත්වයන් යටතේ, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සාක්ෂාත් කර ගැනීම සඳහා, 2018 අයවැය මගින් පහත ලැයිස්තුගත කර ඇති එම උපායමාර්ගික සැලැස්මේ හඳුනාගෙන ඇති උපායමාර්ගික අරමුණු අටක් වෙනුවෙන් මුදල් යෙදවීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අපේක්ෂා කරන ලදී.

i. උසස් අධ්‍යාපනයට පුළුල් සහභාගීත්වයක් සහ සමාන ප්‍රවේශයක්.
ii. අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය හා අදාළත්වය වැඩි දියුණු කිරීම.
iii. පර්යේෂණ, නවෝත්පාදන, ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම.
iv. සමාජ-ආර්ථික සංවර්ධනය, සාමය හා සංහිඳියාව සඳහා උපායමාර්ගික හවුල්කරුවන් ලෙස උසස් අධ්‍යාපන ආයතනයන් හි භූමිකාව වැඩි දියුණු කිරීම.
v. ජාත්‍යන්තර සහයෝගීතාව සහ තරඟකාරිත්වය වැඩි කිරීම
vi. භෞතික හා සෞන්දර්යාත්මක පරිසරය සහ පාර්ශවකරුවන්ගේ තෘප්තිය වැඩි දියුණු කිරීම.
vii. වැඩිදියුණු කළ මූල්‍ය කළමනාකරණය සහ තිරසාර බව
viii. යහපාලනය වැඩි දියුණු කිරීම

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, 2018 අයවැය අනුමත කළ අතර ඒ අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව (NBD) විසින් 2018 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අයවැය නිකුත් කරන ලදී. තවද, සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරය විසින් රු.මිලියන 4,135.5 ක් සහ රු.මිලියන 3,254.0 ක් පිළිවෙලින් පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් අමතර ප්‍රතිපාදන ද ලබා දී ඇත.

6.1 වගුවේ දැක්වෙන්නේ අයවැය සහ අතිරේක ප්‍රදාන මෙන්ම අභ්‍යන්තර ආදායම් / වෙනත් ප්‍රදාන ද ඇතුළුව 2018 වර්ෂය සඳහා ලැබුණු මුළු අරමුදල්වල සාරාංශයකි. 2017 වර්ෂයේ අනුරූප අරමුදල් සංඛ්‍යා, සංසන්දනය කිරීමේ අරමුණු සඳහා එකම වගුවේ ඉදිරිපත් කරනු ලැබේ.

| වර්ගය / විෂය මාතෘකාව | 2017 වර්ෂය | 2018 වර්ෂය |
|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන<br>(අයවැය අනුමත මුදල + අතිරේක භාණ්ඩාගාර වෙන් කිරීම) | 30,597.05 | 36,785.50 |
| ප්‍රාග්ධන / සංවර්ධන ප්‍රදාන - සාමාන්‍ය<br>(අයවැය අනුමත මුදල + අතිරේක භාණ්ඩාගාර වෙන් කිරීම) | 11,540.06 | 19,454.00 |
| මුළු අරමුදල් වෙන් කිරීම | **42,137.11** | **56,239.50** |
| අභ්‍යන්තර ආදායම් / වෙනත් ප්‍රදාන | 4,015.48 | 4,604.97 |
| **මුළු අරමුදල්** | **46,152.59** | **60,844.47** |

වගුව **6.1 2017** සහ **2018** වර්ෂවල ලද මුළු අරමුදල් (රු. මිලියන)

## 6.1 පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අරමුදල් ප්‍රතිපත්තිය මත පදනම්ව 2018 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන, පුනරාවර්තන වාරක ප්‍රදාන (RBG) හා ප්‍රාග්ධන වාරක ප්‍රදාන (CBG) ලෙස වෙන් කරන ලදී.

## 6.2 පුනරාවර්තන වියදම් ප්‍රදාන (RBG)

විශ්වවිද්‍යාල /උසස් අධ්‍යාපන ආයතන විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු අනුව 2017 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් එකවර ප්‍රදානය, ජාතික අයවැය දෙපාර්තමේන්තුව

විසින් වෙන් කර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් යොදා ගන්නා මූල්‍යයන සූත්‍රය පහත දකවා ඇත.

| |
|---|
| *පුනරාවර්තන ප්‍රදාන = විකරණය කළ එක් ශිෂ්‍යයකු සඳහා වියදම (MCPS) X ශිෂ්‍ය ලියාපදිංචිය (SE)* |

විකරණය කළ එක් ශිෂ්‍යයකු සඳහා වියදම (MCPS) පහත ප්‍රතිපත්තිමය සාධක මත ගණනය කරන ලදී;

- සත්‍ය සේවක සංඛ්‍යාවේ වාර්ෂික වැටුප් වර්ධක
- වෙනත් පුනරාවර්තන වියදම් මත උද්ධමනය
- වෙනත් පුනරාවර්තන වියදම් මත ධාරිතා ප්‍රසාරණය
- ප්‍රතිපත්තිමය සාධක – (මූල්‍යන අනුපාතිකය ) - ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් තීරණය කරන ලද පරිදි

## 6.3 මූල්‍යයන ප්‍රතිපත්තිය - ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම (CG)

### 6.3.1. ප්‍රාග්ධන ප්‍රදාන (CBG)

අරමුදල් භාවිතා කිරීමේ ප්‍රගතිය සහ ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ රාජ්‍ය ආයෝජන වැඩසටහන සලකා බලා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන වෙත ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කරන ලදී. ඒ අනුව, විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා, පහත සඳහන් අනුමත කාණ්ඩ යටතේ අරමුදල් වෙන් කරන ලදී;

| | |
|---|---|
| අ) ඉදි කිරීම් ව්‍යාපෘති | - රු.මි. 5,656.1 |
| ආ) ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | - රු.මි. 1,710.2 |
| ඇ) ස්ථාවර වත්කම් අත් කර ගැනීම | - රු.මි. 2,529.6 |
| ඈ) මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති | - රු.මි. 414.0 |
| ඉ) පර්යේෂණ හා සංවර්ධන | - රු.මි. 439.9 |

පශ්චාත් උපාධි / ආචාර්ය උපාධි ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයන ලද්දේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය විසිනි. එය මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති යටතට ඇතුළත් වේ.

### 6.3.2 අයවැය යෝජනා

ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2018 අයවැය යෝජනා අනුව සහ මීට පෙර අයවැය යෝජනා අඛණ්ඩව පවත්වා ගෙන යාම මත පදනම්ව පහත සඳහන් දෑ ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් වෙන් කරන ලදී;

| | |
|---|---|
| අ) විශ්වවිද්‍යාලවල තාක්ෂණ පීඨ පිහිටුවීම | - රු.මි. 3,050 |
| ආ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයක් පිහිටු වීම | - රු.මි. 500 |
| ඇ) යාපනය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය ස්ථාපනය කිරීම | - රු.මි. 50 |
| ඈ) විශ්වවිද්‍යාලවල පීඨ කාර්ය මණ්ඩලයට නවාතැන් පහසුකම් සැලසීම | - රු.මි. 80 |
| ඉ) නව පාඨමාලාමාලා හඳුන්වාදීම සඳහා යටිතල පහසුකම්: වෛද්‍ය පීඨය | - රු.මි.1,200 |

(පළමු අදියර), ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

ඊ) ජාත්‍යන්තර කීර්තියක් ඇති වෘත්තීය ආයතන සමඟ ප්‍රතීතනය දිරිමත් කිරීම - රු.මි. 20

උ) කොළඹ විශ්වවිද්‍යාලයේ සංඛ්‍යානය අධ්‍යයනාංශය විසින් ආරම්භ කරන ලද කටයුතු - රු.මි. 250

ඌ) පාරිවේණික ව්‍යාපාර පාසැල් දියුණු කිරීමට සංගමයේ ප්‍රතීතනය ලබා ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට සහාය වීම - රු.මි. 100

එ) වව්නියා මණ්ඩපයේ නවීන පුස්තකාල පහසුකම සහ තොරතුරු තාක්ෂණ - මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම රු.මි.200

### 6.3.3 ප්‍රාග්ධන වියදම් සංයුතිය 2018




## 6.4 විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අරමුදල් වෙන් කිරීම / භාවිතා කිරීම

පහත 6.2 වගුවේ දැක්වෙන්නේ 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂය තුළ භාවිතා කරන ලද / මුදා හරින ලද මුදලට සාපේක්ෂව වෙන් කරන ලද මුළු අරමුදල්වල විස්තරය.

| ප්‍රදාන වර්ගය | 2017 වර්ෂය | | | 2018 වර්ෂය | | |
|---|---|---|---|---|---|---|
| | මුළු අරමුදල් වෙන් කිරීම (රු. මිලියන) | භාවිතා කළ / මුදා හරින ලද මුදල (රු. මිලියන) | වෙන් කළ අරමුදල් උපයෝගී කර ගැනීමේ ප්‍රතිශතය | මුළු අරමුදල් වෙන් කිරීම (රු. මිලියන) | භාවිතා කළ / නිදහස් කළ මුළු මුදල (රු. මිලියන) | වෙන් කළ අරමුදල් උපයෝගී කර ගැනීමේ ප්‍රතිශතය |
| පුනරාවර්තන | 30,597.05 | 29,873.70 | 97.6% | 36,785.50 | 35,935.00 | 97.6% |
| ප්‍රාග්ධනය | 11,540.06 | 10,477.91 | 90.8% | 19,454.00 | 14,098.00 | 72.4% |

| එකතුව | 42,137.11 | 40,351.61 | 95.7% | 56,239.50 | 50,033.00 | 88.9% |
|---|---|---|---|---|---|---|

වගුව 6.2 අරමුදල් වෙන් කිරීම / භාවිතා කිරීම පිළිබඳ සාරාංශය: 2017 සහ 2018

## 6.5 රජයේ අරමුදල් ප්‍රතිපාදන, වියදම් සහ ශිෂ්‍ය මූල්‍ය ආධාර පිළිබඳ ඓතිහාසික දත්ත (2013 සිට 2018 වසර දක්වා)

පහත 6.3 වගුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා සපයනු ලබන රජයේ අරමුදල් ප්‍රතිපාදන, වියදම් සහ ශිෂ්‍ය මූල්‍ය ආධාර පිළිබඳව දැක්වේ.

*සටහන: අයවැය යෝජනාව මගින් වෙන් කරන ලද අරමුදල් වාර්ෂික ප්‍රතිපාදන යටතේ ඇතුළත් කර ඇත*

| විස්තරය | රු.මිලියන | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| 1. රජයේ ප්‍රතිපාදන | | | | | | |
| පුනරාවර්තන | 18,317 | 20,841 | 25,898 | 29,029 | 30,597 | 36,786 |
| ප්‍රාග්ධන | 8,524 | 10,945 | 8,860 | 19,797 | 11,540 | 19,454 |
| 2. වියදම් | | | | | | |
| පුනරාවර්තන | 16,932 | 20,638 | 25,761 | 27,999 | 29,874 | 35,935 |
| ප්‍රාග්ධන | 5,820 | 10,000 | 8,735 | 15,162 | 10,478 | 14,098 |
| ශිෂ්‍ය මූල්‍ය ආධාර සහාය | | | | | | |
| මහපොළ | 94 | 109 | 576 | 912 | 859 | 1,268 |
| ශිෂ්‍යාධාර | 386 | 414 | 466 | 832 | 539 | 535 |

වගුව **6.3** රජයේ අරමුදල් වෙන් කිරීම, වියදම් සහ ශිෂ්‍ය මූල්‍ය ආධාර (**2013** සිට **2018** වර්ෂය දක්වා)

## 6.6 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් කිරීම

6.3 වගුව මගින් 2018 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, රාජ්‍ය විශ්වවිද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කර ඇති ආකාරයත්, සංසන්දනය කිරීමේ අවශ්‍යතා සඳහා පෙර වසර දෙකේ දී ප්‍රතිපාදන වෙන් කරන ලද ආකාරයත් සමඟ දක්වා ඇත.

| විශ්වවිද්‍යාල/ආයතන/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | පුනරාවර්තන ප්‍රදාන (රු.මිලියන) | | | ප්‍රාග්ධන ප්‍රදාන (රු.මිලියන) | | |
|---|---|---|---|---|---|---|
| | 2016 අයවැය | 2017 අයවැය | 2018 අයවැය | 2016 අයවැය | 2017 අයවැය | 2018 අයවැය |
| පේරාදෙණිය | 4,370.0 | 4,444.3 | 5,399.0 | 1,563.0 | 800.0 | 1,535.0 |
| කොළඹ | 2,472.0 | 2,568.3 | 3,360.0 | 637.0 | 815.8 | 1,825.0 |
| ශ්‍රී ජයවර්ධනපුර | 2,617.0 | 2,908.0 | 3,616.0 | 1,621.0 | 800.0 | 1,630.0 |
| කැලණිය | 2,430.0 | 2,578.6 | 3,078.0 | 1,081.0 | 751.4 | 1,070.0 |
| මොරටුව | 1,828.0 | 1,961.5 | 2,365.0 | 1,545.0 | 800.0 | 810.0 |
| රුහුණ | 2,284.0 | 2,431.0 | 2,956.0 | 1,176.0 | 700.0 | 660.0 |
| යාපනය | 2,056.0 | 2,233.9 | 2,580.0 | 1,367.0 | 840.0 | 965.0 |
| විවෘත | 1,000.0 | 1,112.6 | 1,320.0 | 230.0 | 150.0 | 105.0 |
| නැගෙනහිර | 994.0 | 1,066.8 | 1,240.0 | 628.0 | 400.0 | 515.0 |
| රජරට | 1,255.0 | 1,224.4 | 1,455.5 | 817.0 | 600.0 | 790.0 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සබරගමුව | 1,024.0 | 1,085.0 | 1,254.0 | 555.0 | 450.0 | 615.0 |
| අග්නිදිග | 830.0 | 907.4 | 1,070.0 | 567.0 | 400.0 | 345.0 |
| වයඹ | 949.0 | 947.8 | 1,094.0 | 786.0 | 500.0 | 500.0 |
| සෞන්දර්යය කලා | 717.0 | 710.2 | 790.0 | 421.0 | 400.0 | 406.0 |
| ඌව වෙල්ලස්ස | 538.0 | 619.4 | 705.0 | 600.0 | 400.0 | 435.0 |
| කෘෂි විද්‍යා පශ්චාත් උපාධි | 20.0 | 40.8 | 60.0 | 10.0 | 9.0 | 10.0 |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි | 80.0 | 101.1 | 120.0 | 285.0 | 200.0 | 545.0 |
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි | 66.0 | 70.5 | 75.0 | 10.0 | 10.0 | 15.0 |
| කළමනාකරණ පශ්චාත් උපාධි | - | - | - | - | - | - |
| විද්‍යා පශ්චාත් උපාධි | 12.0 | 12.4 | 15.0 | 38.0 | 50.0 | 60.0 |
| පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි | 25.0 | 33.6 | 45.0 | 10.0 | 158.6 | 50.0 |
| ඉංග්‍රීසි පශ්චාත් උපාධි | 13.0 | 20.5 | 23.5 | 37.5 | 5.7 | 5.0 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි | 8.0 | 25.1 | 30.0 | 8.0 | 10.0 | 10.0 |
| දේශීය වෛද්‍ය විද්‍යා | 299.0 | 339.7 | 415.0 | 157.0 | 50.0 | 55.0 |
| මානව සම්පත් අභිවර්ධන | 40.0 | 40.4 | 42.5 | 10.0 | 5.0 | 20.0 |
| කො.වි.වි.පරිගණක අධ්‍ය. | 160.0 | 171.1 | 200.0 | 245.0 | 110.0 | 125.0 |
| ගම්පහ වික්‍රමාරච්චි | 227.0 | 251.8 | 263.5 | 164.0 | 80.5 | 210.0 |
| මොරටුව තාක්ෂණ ආයතනය | 155.0 | 203.0 | 267.5 | 10.0 | 10.0 | 8.0 |
| ජාතික පුස්තකාල හා විඥාපන | 17.0 | 17.2 | 18.0 | 5.0 | - | 2.0 |
| ජෛව රසායන, අනුක ජීව | 60.0 | 65.3 | 70.0 | 20.0 | 20.0 | 18.0 |
| ස්වාමි විපුලානන්ද | 150.0 | 150.8 | 188.0 | 69.0 | 44.0 | 55.0 |
| මානව. සමාජ අධ්‍යයන ජාතික | 21.0 | 20.2 | 20.0 | 120.0 | 85.0 | 85.0 |
| ත්‍රිකුණාමල මණ්ඩපය | 203.0 | 211.2 | 265.0 | 535.5 | 300.0 | 310.0 |
| කෘෂි තාක්ෂණ ග්‍රාමීය විද්‍යා | 30.0 | 28.1 | 30.0 | 10.0 | 10.0 | 75.0 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 484.8 | 495.2 | 530.0 | 604.0 | 235.0 | 140.0 |
| එකතුව | **27,434.8** | **29,097.1** | **34,960.5** | **15,942.0** | **10,200.1** | **14,004.0** |
| කාර්යසාධන ප්‍රතිපාදන | 1,594.2 | 1,500.0 | 1,825.0 | - | - | - |
| අයවැය යෝජනා | - | - | - | 3,855.0 | 1,340.0 | 5,450.0 |
| මුළු එකතුව | **29,029.0** | **30,597.1** | **36,785.5** | **19,797.0** | **11,540.1** | **19,454.0** |

වගුව **6.4** පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම - **2016** සිට **2018** දක්වා

# 7. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව

2018 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලය සඳහා විවිධ සේවක කාණ්ඩ 6ක් යටතේ අනුමත කරන ලද සේවක සංඛ්‍යාව 306ක් වූ අතර 2018 දෙසැම්බර් 31 වන විට සේවයේ නියුක්ත සංඛ්‍යාව 250 ක් විය. පුරවා නොමැති පුරප්පාඩු ගණන 18% කි.තොරතුරු 7.1 වගුවේ දක්වා ඇත.

| වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව |
|---|---|---|
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 07 | 05 |
| විධායක කාර්ය මණ්ඩලය | 55 | 41 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | 09 | 06 |
| කළමනාකරණ සහකාර ශ්‍රේණි | 178 | 148 |
| ප්‍රාථමික කාර්ය මණ්ඩලය | 57 | 50 |
| එකතුව | **306** | **250** |

වගුව **7.1 2018** දෙසැම්බර් **31** දින වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත හා දැනට සිටින සේවක සංඛ්‍යාව

## 7.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයන්ගේ පත්වීම්, උසස් වීම්, සේවා ස්ථිරත්ව ලබා දීම්

2018 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නව පත්වීම් 33 ක් ලබා දී ඇති අතර එයට ස්ථිර සේවකයින් 23 ක්, කොන්ත්‍රාත් / තාවකාලික පදනම / පැවරුම් පදනම මත පත්වීම් 9ක් සහ අර්ධකාලීන කනතුරු 1 ක් ඇතුළත් විය.

තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයින්ට රැකියා උසස්වීම් 14 ක් සහ සේවා ස්ථිර කිරීම් 12 ක් ලබා දී ඇති අතර, 2018 දී සේවකයින් ආපසු හැරවීම් 1 ක් ද වාර්තා විය. විශ්වවිද්‍යාලවලින් ස්ථාන මාරුවීම් ලබාගත් සේවකයින් තිදෙනෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ එක්විය.

## 7.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයින්ගේ අභ්‍යන්තර මාරුවීම්, සේවා සම්මාන සහ විශේෂ අරමුණු නිවාඩු

2018 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විවිධ දෙපාර්තමේන්තු / අංශ අතර අභ්‍යන්තර මාරුවීම් 15 ක් වාර්තා විය. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 678, 696 සහ 893 හි විධිවිධාන යටතේ, අවුරුදු 25, 30 හෝ 35 ක් සම්පූර්ණ කළ සේවකයින් පහළොස් දෙනෙකු විශ්වවිද්‍යාල පද්ධතියට කරන ලද දීර්ඝ හා ප්‍රශංසනීය සේවාවන් වෙනුවෙන් පිළිගැනීමට ලක් කල අතර ඔවුන්ට මුදල් ප්‍රදානයන් ද ලබා දෙන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ, අධ්‍යාපන හා වෙනත් අරමුණු සඳහා සේවකයින්ට පෞද්ගලික පදනමින් විදෙස් ගත වීමට නිවාඩු ලබා දුන් අවස්ථා ගණන 20 ක් විය. එම අවස්ථාවලින් 15 ක් විධායක කාර්ය මණ්ඩලය සඳහා වූ අතර ඉතිරි 5 විධායක නොවන කාර්ය මණ්ඩලය සඳහා විය. සේවකයින් තිදෙනෙකුට විශ්‍රාම යාමට පෙර නිවාඩු ලබා දී

ඇත. ඉහත ඒවාට අමතරව, අදාළ විධිවිධාන යටතේ, සේවක අවශ්‍යතා මත පදනම්ව පහත සඳහන් විශේෂ නිවාඩු අනුමත කරන ලදී;

| | | |
|---|---|---|
| විභාගවලට පෙනී සිටීමට නිවාඩු | - | සේවකයින් 03 |
| පීතෘ නිවාඩු | - | සේවකයින් 03 |
| නිලධාරීන්ට අධ්‍යයන නිවාඩු | - | සේවකයින් 05 |
| මාතෘ නිවාඩු | - | සේවකයින් 08 |
| වැටුප් රහිත මාතෘ නිවාඩු | - | සේවකයින් 01 |
| ඉකුත් වූ නිවාඩු | - | සේවකයින් 08 |

## 7.3 සේවකයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලය හැරයාම්

2018 දී, පද්ධතිය තුළ විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන වෙත ස්ථාන මාරුවීම් ලබා ගනිමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කාර්යාලයෙන් ඉවත් වූ පුද්ගලයින් 12 දෙනෙකු සිටි අතර තවත් 2 දෙනෙකු විශ්වවිද්‍යාලවල නව පත්වීම් භාර ගැනීම සඳහා ඔවුන්ගේ උසස්වීම් මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිදහස් කරන ලදී. තවද, වෙනත් රාජ්‍ය ආයතනවල නව තනතුරු දැරීම සඳහා තවත් 10 දෙනෙකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිදහස් කරන ලදී.

වර්ෂය තුළ විශ්‍රාම ගැන්වීම් 4 ක්, ඉල්ලා අස්වීම් 1 ක් සහ තනතුරේ නිවාඩු ගැනීම් 1 ක් වාර්තා වූ අතර සේවා කාලය අවසන් වූ පසු එක් තාවකාලික පර්යේෂණ සහායකයකුගේ සේවය දීර්ඝ කර නොමැත.

## 7.4 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ලබා දෙන පුහුණු හා සංවර්ධන අවස්ථා

එහි සේවකයින්ගේ පෞද්ගලික හා වෘත්තීය සංවර්ධනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රධාන ක්ෂේත්‍රයක් ලෙස සලකනු ලබන අතර අනුග්‍රාහකත්වය තුළින් මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් වෙනම කාර්ය මණ්ඩල පුහුණු අරමුදලක් පවත්වාගෙන යනු ලැබේ. අතීතයේ දී මෙන්, 2018 වර්ෂය තුළ ද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සිය පිරිස් අංශය හරහා කාර්ය මණ්ඩලයට දේශීය හා විදේශීය වශයෙන් අදාළ හා සුදුසු කෙටිකාලීන වැඩමුළු සහ පුහුණු වැඩසටහන් වලට සහභාගී වීමෙන් ඔවුන්ගේ කුසලතා හා වැඩ කරන දැනුම වැඩි දියුණු කිරීමට බොහෝ අවස්ථාවන් ලබා දී ඇත. පුහුණු වැඩසටහන්වලට අමතරව, හඳුනාගත් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවලදී මූල්‍ය ආධාර ලබා දීමෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනයට ද සහාය විය.

සමාලෝචිත වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද විධායක කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 11 දෙනෙකු සහ විධායක නොවන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 43 දෙනෙකු දේශීය වශයෙන් පවත්වනු ලබන කෙටිකාලීන පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගී වූ අතර ඒවා ඔවුන්ගේ රාජකාරී කටයුතුවලට සෘජුවම අදාළ විය. මෙම වැඩසටහන් ශ්‍රී ලංකා පදනම් ආයතනය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), ජාතික කම්කරු අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, නිපුනතා සංවර්ධන අරමුදල, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය, ලංකා අධ්‍යාපන

හා පර්යේෂණ ජාලය, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය, ප්‍රාග් ආයතනය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, නිෂ්පාදන සංවර්ධන මධ්‍යස්ථානය, DMS මෘදුකාංග ඉංජිනේරු (පුද්ගලික) සමාගම වැනි ප්‍රකට හා පිළිගත් පුහුණු ආයතන විසින් පවත්වන ලදී.

තවද, විධායක කාර්ය මණ්ඩලයේ නම් කරන ලද සාමාජිකයින් 12 දෙනෙකුට කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා ලබා දී ඇති අතර ඒ සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම මගින් සහ ඉන්දියාව, තායිලන්තය, මොරිෂස්, බංග්ලාදේශය, ඉන්දුනීසියාව සහ දකුණු කොරියාව යන රටවල පැවැත්වෙන විවිධ පුහුණු වැඩමුළු සහ සංසදවලට සහභාගී වීමට රාජකාරි නිවාඩු ලබා දීමෙන් ඔවුන්ට ඒ සඳහා අවස්ථාව ලබා දී ඇත.

වැඩි දියුණු කළ වැඩ දැනුම හා නිරාවරණය තුළින් වෘත්තීය සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා විධායක කාර්ය මණ්ඩලයේ තෝරාගත් සාමාජිකයින් තිදෙනෙකුගේ MBA පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා මූල්‍ය ආධාර ලබා දෙන ලදී.

### 7.5 සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

2018 වර්ෂයේ දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ ඒකාබද්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සියලුම ස්ථිර සේවකයින් සඳහා සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් ලබා දී ඇත.

### 7.6 සේවය අගය කිරීම හා සේවයට පිළිගැනීම

සමාලෝචිත වර්ෂය තුළ දී සේවයෙන් ඉවත්වූ සේවකයන් ඉටු කරන ලද සේවය අගය කිරීමත් සලකනු ලබන කාලයේ දි සේවයට එකතු වූ සේවකයන් පිළිගැනීමත් කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලදී.

## 8. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය

විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා මානව සම්පත් සහාය ලබා දීමේ වගකීමට අනුකූලව මානව සම්පත් අංශය 2018 දී ස්ථාවර ප්‍රගතියක් ලබා ඇත. මානව සම්පත් අංශයට පවරා ඇති කාර්යයන් යටතේ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වේ.

### 8.1 සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශ මත පදනම්ව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේදී විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා නව සේවක තනතුරු 958 ක් සඳහා අනුමැතිය ලබා දෙන ලදී. මෙම තනතුරු 958 හි විස්තර 8.1 වගුවේ දක්වා ඇත.

| සේවක කාණ්ඩය | නව සේවක තනතුරු සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 267 |
| තාවකාලික / කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය | 127 |
| පරිපාලන සහ අනෙකුත් කාර්ය මණ්ඩලය | 31 |
| අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | 57 |
| කළමනාකරණ සහකාර / තාක්ෂණික නොවන | 277 |

| | |
|---|---|
| කළමනාකරණ සහකාර / තාක්ෂණික | 76 |
| පුහුණු / අර්ධ පුහුණු / නුපුහුණු | 123 |
| එකතුව | **958** |

වගුව **8.1 2018** දී විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා අනුමත කරන ලද නව සේවක තනතුරු සංඛ්‍යාව

8.2 වගුවෙහි දක්වා ඇති පරිදි, ඉහත තනතුරු 958 පසුගිය වසර 5 තුළ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ඉහළම නව සේවක තනතුරු සංඛ්‍යාව බව ද සැලකිය යුතු ය.

| කාණ්ඩය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 8603 | 8696 | 9076 | 9187 | 9454 |
| අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | 969 | 976 | 982 | 1004 | 1061 |
| වෛද්‍ය නිලධාරීන් ඇතුළු පරිපාලන හා අනුබද්ධ කාර්ය මණ්ඩලය | 1096 | 1099 | 1117 | 1128 | 1159 |
| එකතුව (කළමනාකරණ සහකාර / තාක්ෂණික , කළමනාකරණ සහකාර / තාක්‍ෂණික නොවන / පුහුණු / අර්ධ පුහුණු / නුපුහුණු සහ තාවකාලික / කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය) | 11213 | 11266 | 11579 | 11752 | 12355 |
| එකතුව | 21881 | 22037 | 22754 | 23071 | 24029 |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද නව සේවක සංඛ්‍යා තනතුරු | 225 | 156 | 717 | 317 | 958 |

වගුව **8.2** විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා අනුමත සේවක සංඛ්‍යා තොරතුරු **(2014 සිට 2018 වර්ෂය දක්වා)**

## 8.2 පරිපාලනමය ශ්‍රේණි සඳහා පත් කිරීම / උසස් කිරීම

2009 අංක 57 විශ්වවිද්‍යාල (සංශෝධන) පනත මගින් සංශෝධිත1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71 (2) වගන්තියේ (ii) සහ (iii) ඡේද සහ විශ්වවිද්‍යාල පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන සඳහා පරිපාලන ශ්‍රේණියේ පත්වීම් / උසස්වීම් පිළිබඳ වගකීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පැවරී ඇත. ඒ අනුව, 2018 වර්ෂය තුළ සිදු කරන ලද පත්වීම් සහ උසස්වීම් පිළිවෙලින් 8.3 වගුවේ සහ 8.4 වගුවේ සාරාංශ කොට ඇත.

| පත් කරන ලද සේවක කාණ්ඩය | පත්වීම් ගණන | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුර | 11 | |
| ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුර | 6 | |
| සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී තනතුර | 23 (අභ්‍යන්තර කාණ්ඩය) | 40 (බාහිර කාණ්ඩය) |
| සහකාර ගණකාධිකාරී / සහකාර මූල්‍යාධිකාරී / සහකාර අභ්‍යන්තර විගණක තනතුර | 2 (අභ්‍යන්තර කාණ්ඩය) | 57 (බාහිර කාණ්ඩය) |

වගුව **8.3 2018** වර්ෂයේ පරිපාලන ශ්‍රේණි පත්වීම්

| උසස් කරන ලද කාණ්ඩය | උසස්වීම් ගණන |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුර (කොමිෂන් සභා චක්‍රලේඛ අංක 668 මත පදනම්ව) | 4 |

| | |
|---|---|
| නියෝජ්‍ය ලේකම් / නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුර | 12 |
| නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුර | 7 |

වගුව **8.4 2018** වර්ෂයේ පරිපාලන ශ්‍රේණි සඳහා උසස්වීම්

## 8.3 වෙනත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද පත්වීම් / උසස්වීම්

1978 අංක 16 විශ්වවිද්‍යාල පනතේ 71 (2) වගන්තියේ (iii) ඡේදයට අනුව, 2018 වර්ෂය තුළ අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා පත්වීම් හතක් (07) සහ උසස්වීම් අටක් (8) ලබා දී ඇත. මේ පිළිබඳ විස්තර 8.5 සහ 8.6 වගුවල දක්වා ඇත.

| පත් කළ තනතුර | පත්වීම් ගණන |
|---|---|
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 1 |
| පාලක (උද්‍යාන) III ශ්‍රේණිය | 2 |
| අධ්‍යක්ෂ / ශාරීරික අධ්‍යාපන | 1 |
| අධ්‍යක්ෂ / මෙහෙයුම් | 1 |
| තොරතුරු පද්ධති කළමනාකරු | 1 |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී | 1 |

වගුව **8.5** අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද පත්වීම් **- 2018**

| උසස් කරන ලද තනතුර | උසස්වීම් ගණන |
|---|---|
| චිත්‍රණ ශිල්පී I ශ්‍රේණිය | 1 |
| ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ නිලධාරී I ශ්‍රේණිය | 1 |
| ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කාර්මික නිලධාරී | 4 |
| ප්‍රධාන තාක්ෂණ නිලධාරී | 1 |
| පාලක (උද්‍යාන) I ශ්‍රේණිය | 1 |

වගුව **8.6** අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු සඳහා කරන ලද උසස්වීම් **- 2018**

## 8.4 විශ්වවිද්‍යාල අතර ස්ථාන මාරු 2018

විශ්වවිද්‍යාල පනතේ 78 වන වගන්තියට අනුව, 2018 වර්ෂය තුළ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ස්ථාන මාරුවීම් 218 ක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පහසුකම් ලබා දී ඇත.

- පරිපාලන කාර්ය මණ්ඩලය - 38
- අනධ්‍යයන / පරිපාලනමය නොවන කාර්ය මණ්ඩලය - 180

## 8.5 සහනදායී කොන්දේසි මත මෝටර් රථ වාහන බලපත්‍ර සඳහා අයදුම්පත්

2018 ජනවාරි 1 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ සහන කොන්දේසි මත මෝටර් වාහන බලපත්‍ර සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවලින් අයදුම්පත් 2102 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී තිබේ.

සංශෝධිත 2016.07.14 දිනැති අංක 01/2016 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයට අනුව මෙම අයදුම්පත් ලැබුණු අතර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කර ඇත.

# 9. විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට උසස් අධ්‍යාපනය සඳහා සහාය ලබා දීම

අධ්‍යයන මණ්ඩලයට විශේෂයෙන් ම තරුණ විද්‍යාර්ථීන්ට මෙරට මෙන් ම පිටරට උසස් අධ්‍යාපන අවස්ථා හිමිකර ගැනීමට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පර්යේෂණ පද්ධතිය තවදුරටත් පෝෂණය කිරීම සහ ශක්තිමත් කිරීම යන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිපත්තියට අනුකූලව යමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පර්යේෂණ හා අන්තර්ජාතික සහයෝගීතා අංශය මඟින් ඒ වෙනුවෙන් ඉකුත් වසර කිහිපය තුළ දැඩි උත්සාහයක් දැරුවේය;

## 9.1 පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා මූල්‍ය අනුග්‍රහය

උසස් අධ්‍යාපන ආයතනවල ස්ථිර සේවයේ නිරත ආචාර්යවරුන්ට පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මූල්‍යාධාර සපයයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මාර්ගෝපදේශවල දක්වා ඇති අවශ්‍යතා සපුරාලන්නේ නම් ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක කවර හෝ විෂය ක්ෂේත්‍රයක ආධුනික කථිකාචාර්යවරු සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු මෙම යෝජනා ක්‍රමය යටතේ අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. 2018 වර්ෂයේ සිට මෙම යෝජනා ක්‍රමය යටතේ මූල්‍ය ආධාර සඳහා උපරිම සීමාව වසරකට රු.මිලියන 2.0 ක් දක්වා ඉහළ නංවා ඇති අතර ජීවන වියදම් සඳහා උපරිම සීමාව රු. වසරකට මිලියන 1.5 කි.

2018 වර්ෂයේ දී මෙම යෝජනා ක්‍රමය සඳහාත් ඒ හා සමාන යෝජනා ක්‍රමයක් වන ලෝක බැංකුව විසින් අරමුදල් සපයන උසස් අධ්‍යාපනයේ ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) යෝජනා ක්‍රමය යටතේ ද සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබීය. පළමු වටය සඳහා වූ අයදුම්පත් 2018 අප්‍රේල් මාසයේ දී අවසන් වූ අතර ලැබුණු අයදුම්පත් 57 න් 31 ක් AHEAD අරමුදල් සඳහා වූ අතර එම අයදුම්පත් AHEAD ව්‍යාපෘති කාර්යාලයට යොමු කරන ලදී. UGC යෝජනා ක්‍රමයේ අයදුම්කරුවන් 26 දෙනා සඳහා 2018 ජූලි සහ අගෝස්තු මාසවලදී සම්මුඛ සාකච්ඡා පවත්වන ලද අතර, තේරීම් කමිටුවේ නිර්දේශය මත ප්‍රදාන 18 ක් ප්‍රදානය කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. අයදුම්පත් අධික ප්‍රමාණයක් ලැබී තිබීම හේතුවෙන් අයදුම්පත් දෙකක් (02) සලකා බැලීම සඳහා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන මධ්‍යස්ථානයට (NCAS) යවන ලදී. 2018 වර්ෂයට අදාළ දෙවන වටයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2018 දෙසැම්බර් 21 දිනට නියම කර ඇති අතර, මෙම අයදුම්පත් 2019 වසරේ පළමු කාර්තුව තුළ සලකා බැලීම සිදු කෙරේ.

## 9.2 යාවත්කාලීන කරන ලද ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාල (QUT) පශ්චාත් උපාධි යෝජනා ක්‍රමය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති උසස් අධ්‍යාපන ආයතනයන් හි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කණිෂ්ඨ සාමාජිකයින්ගේ ප්‍රයෝජනය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය (QUT) විසින් 2014 වර්ෂයේ සිට භින්න / ඒකාබද්ධ ආචාර්ය උපාධි සඳහා සම - සත්කාරක අරමුදල් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරයි. මෙම යෝජනා ක්‍රමය යටතේ අපේක්ෂකයින් අධීක්ෂකවරුන් දෙදෙනෙකු යටතේ කටයුතු කළ යුතු අතර (QUT සහ දේශීය විශ්වවිද්‍යාලය විසින් වෙන වෙනම

අධීක්ෂකවරුන් පත් කරනු ලැබේ) ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ හි උපරිම වශයෙන් අවුරුද්දක් හෝ අවුරුදු එකහමාරක කාලයක් ගත කිරීමට අවසර හිමිවනු ඇත. අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය පන්ති ගාස්තුවලින් නිදහස් කිරීමට එකඟ වූ අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අපේක්ෂකයින්ගේ විදේශීය රැඳී සිටීම සහ ඔවුන්ගේ දේශීය පන්ති ගාස්තු සඳහා ජීවන දීමනාව ගෙවන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන් හා අනෙකුත් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සමඟ භින්න/බාහිර ආචාර්ය උපාධි වැඩසටහන් අඛණ්ඩව ලබා දීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2015 ඔක්තෝම්බර් මාසයේදී ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය සමඟ නව අවබෝධතා ගිවිසුමකට එළඹුණි. තවද, ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් කරන ලද ඉල්ලීම මත පදනම්ව, තෝරාගත් අනෙකුත් ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල දෙක සමඟ 2018 ජූලි මාසයේ දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ද ඒකාබද්ධ ආචාර්ය උපාධිය ප්‍රදානය කිරීම පිළිබඳ UGC / QUT අවබෝධතා ගිවිසුමට ඇතුළත් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමැතිය ලබා දුන්නේය. කෙසේ වෙතත්, අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසු, සංශෝධිත අවබෝධතා ගිවිසුමට 2018 සැප්තැම්බර් 08 වන දින කොළඹ ෂැන්ග්‍රි-ලා හෝටලයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය අත්සන් කරන ලදී. අත්සන් තබන ලද යාවත්කාලීන කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා වාර්ෂිකව ගාස්තු රහිත පර්යේෂණ පුහුණු වැඩසටහන් 12ක් දක්වා (ජාත්‍යන්තර) අනුග්‍රාහකත්වයන් ලබා දීමට ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය එකඟ වී ඇත.

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය සමඟ අත්සන් කරන ලද වෙනම අවබෝධතා ගිවිසුමක් යටතේ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කනිෂ්ඨ සාමාජිකයන්ට ඔවුන්ගේ ආචාර්ය උපාධිය සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය හරහා පූර්ණ පන්ති ශිෂ්‍යත්ව 6 ක් ද ලබා දෙනු ඇත.

තවද, ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය සමඟ එක්ව විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් / ගුරුවරුන් සඳහා දැනුවත් කිරීමේ සැසියක් 2019 පෙබරවාරි 14 වන දින (අ) ආචාර්ය උපාධි යෝජනා ලිවීම(ආ) නිවැරදි අධීක්ෂක සොයා ගැනීම (ඇ) ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය යනාදි ක්ෂේත්‍ර තුන ආවරණය කරමින් සංවිධානය කර තිබුණි.

## 9.3 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය අතර පශ්චාත් උපාධි (ආචාර්ය/ශාස්ත්‍රපති) ශිෂ්‍යත්ව වැඩසටහන

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය සම අනුග්‍රහය දක්වන ශිෂ්‍යත්ව වැඩසටහන මගින් ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලයෙ හි උසස් අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහ පරිපාලන කාර්ය මණ්ඩලයට මූල්‍ය ආධාර ලබා දීමට අදහස්

කෙරේ. දෙපාර්ශවය විසින් අත්සන් කරන ලද ගිවිසුමට (letter of intent) අනුව, අධ්‍යාපන ගාස්තුවෙන් 50% ක් සඳහා අරමුදල් සැපයීමට ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය කටයුතු කරන අතර ඉතිරි 50% ක අධ්‍යාපන ගාස්තුව සහ අපේක්ෂකයෙකු සඳහා යෙන් 80,000ක මාසික ජීවන දීමනාවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දෙනු ඇත. කෙසේ වෙතත්, 2018 දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාන්‍ය අරමුදල් ක්‍රමය යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා අලුතින් වැඩිදියුණු කරන ලද අරමුදල් සීමාවන් හා ජපානයේ ඉහළ ජීවන වියදම සැලකිල්ලට ගනිමින්, මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රදාන ලබා දෙන්නන් සඳහා අනුමත කරන ලද ජීවන වියදම මසකට යෙන් 90,000 දක්වා වැඩි කරන ලදී. ගිවිසුමට අනුව, ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය සිය ආචාර්ය උපාධි (Ph.D.) වැඩසටහන සඳහා වාර්ෂිකව උපරිම වශයෙන් අපේක්ෂකයින් 2ක් දක්වාත් එහි ශාස්ත්‍රපති උපාධි පාඨමාලා සඳහා උපරිම වශයෙන් අපේක්ෂකයින් 10 ක් දක්වාත් මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ අවස්ථාව ලබා දෙනු ඇත. කෙසේ වෙතත්, ආචාර්ය උපාධිය සඳහා ලැබුණු අධික අයදුම්පත් සංඛ්‍යාව සලකා බලමින්, ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය ආචාර්ය උපාධිය සඳහා වාර්ෂිකව පිරිනමන අවස්ථා ගණන වැඩි කරමින් ඒ සඳහා අවස්ථා 3 ක් දක්වා ලබා දීමට කටයුතු කරන ලදී.

2018 වර්ෂය සඳහා අපේක්ෂකයින් තෝරා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය එක්ව එක් එක් ආයතනය විසින් නියම කර ඇති අවශ්‍යතා සපුරාලීම්වලට යටත්ව සිදු කරන ලදී. 2018 පෙබරවාරි මාසයේදී අයදුම්පත් කැඳවූ අතර ආචාර්ය උපාධිය සඳහා අයදුම්පත් 04 ක් සහ ශාස්ත්‍රපති උපාධිය සඳහා අයදුම්පත් 03 ක් නියමිත දිනට පෙර ලැබුණි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තේරීම් මණ්ඩලය විසින් සියළුම අයදුම්පත් පර්යේෂණ යෝජනාවල සමහර සංශෝධනයන්ට යටත්ව ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලයේ සලකා බැලීම සඳහා නිර්දේශ කරන ලද අතර ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලය විසින් සංශෝධිත පර්යේෂණ යෝජනා සලකා බලා ආචාර්ය උපාධිය සඳහා අයදුම්කරුවන් 03 දෙනෙකු සහ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන සඳහා අයදුම්කරුවන් 02 ක් තෝරා ගන්නා ලදී. කෙසේ වෙතත්, තෝරාගත් අපේක්ෂකයින්ගෙන්, මේ දක්වා ජපාන අන්තර්ජාතික විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය ආරම්භ කර ඇත්තේ එක් අයෙකු පමණක් වන අතර අනෙක් අපේක්ෂකයින් සිව්දෙනා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඔවුන්ට අදාළ අරමුදල් නිදහස් කර ගැනීම සඳහා වන නිශ්චිත අවශ්‍යතා සපුරා නොමැත.

## 9.4 ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර යෝජිත අවබෝධතා ගිවිසුම

ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය (GUQ) සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර අධ්‍යයන සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට ඔවුන්ගේ ආචාර්ය උපාධි අවශ්‍යතා (ආචාර්ය උපාධිය) GUQ හි දී සම්පූර්ණ කිරීමට පහසුකම් සැලසීම සඳහා ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත ග්‍රිෆිත් විශ්වවිද්‍යාලයේ (GUQ) නියෝජිත කණ්ඩායමක්, ඔවුන් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති සමඟ කළ මූලික සාකච්ඡාවල පසු විපරමක් ලෙස නැවතත් 2018 ඔක්තෝබර් 29 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන් හමුවිය. මෙම රැස්වීමේදී, උප සභාපති (ගෝලීය) මහාචාර්ය සාරා ටොඩ් ඇතුළු ඕස්ට්‍රේලියාවේ

ක්වීන්ස්ලන්ත ග්‍රිෆිත් විශ්වවිද්‍යාලයෙහි නිලධාරීන් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා ඔවුන් විසින් සපයනු ලබන ශිෂ්‍යත්ව වැඩසටහන් යටතේ ඔවුන්ගේ සහයෝගය ලබා දීමට ඇති හැකියාව සොයා බැලීමට එකඟ වූහ. ඒ අනුව අවබෝධතා ගිවිසුමේ කෙටුම්පතක් සකස් කරන ලද අතර මෙම අවබෝධතා ගිවිසුම ඉදිරියට ගෙන යාම සඳහා 2019 වසරේ මුල් භාගය තුළදී කොමිසමේ අනුමැතිය ලබා ගනු ඇත.

අවබෝධතා ගිවිසුමේ ප්‍රධාන අවධානය යොමු වී ඇත්තේ ශ්‍රී ලංකා ශාස්ත්‍රාලිකයින් සඳහා ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත ග්‍රිෆිත් විශ්වවිද්‍යාලයෙහි ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීම වන අතර අධ්‍යයන හා පර්යේෂණ සහයෝගීතාවයන් ද ද්විතීයික මට්ටමින් අපේක්ෂා කෙරේ.

## 9.5 ජර්මනියේ හයිඩෙල්බර්ග් විශ්වවිද්‍යාලයේ දකුණු ආසියා ආයතනයේ (SAI) ශ්‍රී ලංකා නියෝජනය

2016 පෙබරවාරි මාසයේදී ජර්මනියේ අතිගරු ජනාධිපතිවරයාගේ නිල සංචාරයේ ප්‍රතිඵලයක් ලෙස, ජර්මනියේ හයිඩෙල්බර්ග් විශ්වවිද්‍යාලයේ දකුණු ආසියා ආයතනය විසින් ශ්‍රී ලංකා රජය සහ හයිඩෙල්බර්ග් විශ්වවිද්‍යාලය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම යටතේ ශ්‍රී ලංකා අධ්‍යයන කටයුතු සඳහා 2016 දී අවස්ථාවක් නිර්මාණය කර දෙන ලදී. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මෙම අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ වගකීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පැවරුණි.

සමාලෝචිත වර්ෂය තුළ, මෙම අවබෝධතා ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් නිර්මාණය ලද අවස්ථාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තෙවරක් අයදුම්පත් කැඳවූ අතර, පෙර අධ්‍යයන වාර තුනක් සඳහා අවබෝධතා ගිවිසුම මගින් හඳුනාගෙන ඇති ක්ෂේත්‍රයන් තුළ ශ්‍රී ලාංකික අයදුම්කරුවන් අතරින් තිදෙනෙකු දකුණු ආසියා ආයතනය විසින් තෝරා ගන්නා ලදී. හයිඩෙල්බර්ග් විශ්වවිද්‍යාලයේ දකුණු ආසියා ආයතනය විසින් සිව්වන වරටත් ශ්‍රී ලංකා නියෝජනය වෙනුවෙන් දැන්වීම් පළ කරන ලද අතර අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2018 දෙසැම්බර් 12 විය. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සියළුම විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන්ට අදාළ අංශවල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අවධානය යොමු කරන ලෙස අදාළ තොරතුරු ලබා දුන් අතර අවශ්‍ය තොරතුරු සහිතව දකුණු ආසියා ආයතනය, හයිඩෙල්බර්ග් වෙත සෘජුවම අයදුම් කරන ලෙස ඉල්ලා සිටියේය. තෝරාගත් තැනැත්තාට ගුවන් ගමන් පහසුකම් සමඟ සජීත වාර්ෂික නිවාඩු සඳහා හිමිකම් ලැබෙනු ඇත.

## 9.6 එක්සත් රාජධානියේ පොදුරාජ්‍ය මණ්ඩලීය වෛද්‍ය ශිෂ්‍යත්ව - 2018

එක්සත් රාජධානියේ පොදුරාජ්‍ය මණ්ඩලීය වෛද්‍ය ශිෂ්‍යත්වය පිළිබඳව 2018 මැයි මාසයේදී දැන්වීම් පළ කරන ලද අතර පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව කොමිෂන් සභාව විසින් නියම කර ඇති මාර්ගෝපදේශයන්ට අනුව එක් නාමයෝජනා ඉදිරිපත් කරන ලෙස විශ්වවිද්‍යාලවලින් ඉල්ලා සිටියේය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අපේක්ෂකයින් සිව් දෙනෙකු කෙටි ලැයිස්තු ගත කර අදාළ බලධාරීන්ට තෝරා ගැනීම සඳහා නම් කරන ලදී.

**9.7** ලෝක බැංකුව විසින් අරමුදල් සපයන 'උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීම' (AHEAD) වැඩසටහන පිළිබඳ හඳුන්වාදීමේ වැඩමුළුව

ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ඉල්ලීමකට අනුව ලෝක බැංකුව මෙම ව්‍යාපෘතිය යටතේ මෘදු ණයක් ලබා දීමට එකඟ විය: ඒ අනුව රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ දියත් කරන ලද උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධන (AHEAD) වේගවත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 100 ක ලෝක බැංකු මූල්‍යාධාර ලබා දීමට එකඟ විය.

AHEAD ව්‍යාපෘතිය පිළිබඳ සියලුම විශ්වවිද්‍යාල දැනුවත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශ්‍රවණාගාරයේ දී ලෝක බැංකු නිලධාරීන්ගේ සහයෝගයෙන් 2018 පෙබරවාරි මාසයේදී හඳුන්වාදීමේ වැඩමුළුවක් පවත්වන ලදී. සියලුම විශ්වවිද්‍යාලවල උපකුලපතිවරු සහ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් මෙම අවස්ථාවට සහභාගී වූහ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අදාළ නිලධාරීන් ද ඊට සහභාගී වූහ.

මෙම ව්‍යාපෘතිය මගින් රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා රජය විසින් ලබා දී ඇති වැදගත්කම සංකේතවත් කරන අතර ප්‍රධාන අරමුණ වන්නේ රජයේ උසස් අධ්‍යාපන සංවර්ධන උපාය මාර්ගයට (HEDS) සහාය වීමයි. මෙම වැඩසටහන මගින් උගත් හා දැනුමැති ශ්‍රම බලකායක් බිහිකිරීමට සහ සැමට ප්‍රවේශ අවස්ථාවන් නිර්මාණය කිරීම සඳහා උසස් අධ්‍යාපන පද්ධතියට සහාය වීමට අදහස් කරයි.

AHEAD ව්‍යාපෘතිය ප්‍රධාන ප්‍රතිඵල අංශ තුනක් යටතේ සිය වැඩසටහන ක්‍රියාත්මක කරයි:

<u>ප්‍රතිඵල ක්ෂේත්‍ර 1-</u> *ආර්ථික සංවර්ධනය සඳහා වන ප්‍රමුඛතා විෂයයන් සඳහා උසස් අධ්‍යාපනයට ඇතුළත් කර ගන්නා ප්‍රමාණය වැඩි කිරීම:* මේ යටතේ වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, තොරතුරු තාක්ෂණය, තාක්‍ෂණය පදනම් කරගත් පීඨ සහ මෙම විෂයයන් සඳහා උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීම පුළුල් කිරීම අරමුණු කරගත් වැඩසටහන් සඳහා මූල්‍යාධාර සපයනු ලැබේ. ප්‍රතිඵල ක්ෂේත්‍ර 1 යටතේ විශ්වවිද්‍යාල සඳහා උපකරණ ප්‍රදාන සහ යටිතල පහසුකම් ප්‍රදාන යන දෙකම ලබා දෙනු ලැබේ.

<u>ප්‍රතිඵල ක්ෂේත්‍ර 2-</u> *උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම:* පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ විශ්වවිද්‍යාලවලට වැඩිපුර මූල්‍ය ආධාර ලබා දෙනු ලැබේ:

- ඉගැන්වීම් ඉගෙනුම් හා ඇගයීම් (ETLA) සහ ඉංග්‍රීසි භාෂා නිපුණතා වැඩි දියුණු කිරීම (ELSE)
- වෘත්තීය සංවර්ධනය - පශ්චාත් උපාධි අරමුදල්, ධාරිතා වර්ධනය සඳහා කෙටිකාලීන පුහුණුව
- තත්ත්ව සහතික කිරීමේ ප්‍රතිතන කටයුතු ශක්තිමත් කිරීම

<u>ප්‍රතිඵල ක්ෂේත්‍ර 3</u> - *පර්යේෂණ සංවර්ධනය හා නව්‍යකරණය ප්‍රවර්ධනය කිරීම:* පර්යේෂණ හා සංවර්ධන හා නවෝත්පාදන හා වාණිජකරණ සංස්කෘතියක් (RDIC) වර්ධනය කිරීමේ අරමුණින් පහත සඳහන් අංශ තුන සඳහා ප්‍රතිපාදන ලබා දෙනු ඇත.

- තරඟකාරී කාර්ය සාධනය මත පදනම් වූ පර්යේෂණ ව්‍යාපෘති පද්ධතිය
- STEMS- HEMS අන්තර් විෂය පර්යේෂණ
- විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා සංවර්ධනය කිරීම

## 9.8 Erasmus + වැඩසටහන

යුරෝපා සංගමයේ Erasmus + වැඩසටහන අධ්‍යාපනය, පුහුණුව, යෞවනය සහ ක්‍රීඩා යන ක්ෂේත්‍රවල ක්‍රියාකාරකම් සඳහා ආධාර කිරීමේ අරමුදල් යෝජනා ක්‍රමයකි. Erasmus+ වැඩසටහන සහ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අංශය අතර සහයෝගිතාවය වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා වන යුරෝපා සංගමය නියෝජනය කරමින් එහි නියෝජිතයන් 2018 දෙසැම්බර් 11 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන් හමුවිය. ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන අංශයට විශේෂයෙන් විශ්වවිද්‍යාලවලට ප්‍රතිලාභ ලබා දිය හැකි Erasmus + වැඩසටහනේ විවිධ යෝජනා ක්‍රම පිළිබඳව දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡාවේදී අවධානය යොමු විය.

2018 දෙසැම්බර් 10 වන දින මැලේසියාවේ ක්වාලාලම්පූර් හි පැවති වැඩමුළුවකට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලින් නම් කරන ලද කිහිප දෙනෙකු සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජිකයෙකු සහභාගී විය. ශ්‍රී ලංකා යුරෝපා සංගමය පිහිටි පරිශ්‍රයේදී ඔවුන් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන සහ සංවිධාන සමඟ පොකුරු රැස්වීමට ද සහභාගී විය.

Erasmus + CBHE ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකාව සම්බන්ධ කර ගැනීමේ යාන්ත්‍රණයන් පිළිබඳවත් එම ව්‍යාපෘති ශ්‍රී ලංකාවට බලපාන ආකාරය පිළිබඳවත් සාකච්ඡා කිරීම සඳහා Erasmus + වැඩසටහනේ නිලධාරීන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ රැස්වීමක් පැවැත්වන ලදී.

Erasmus + වැඩසටහනෙන් ලැබුණු උපදෙස් අනුව, මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලාංකිකයින්ට ලබා ගත හැකි යෝජනා හා ශිෂ්‍යත්ව පිළිබඳ 2019 Erasmus + කැඳවීම පිළිබඳව සියලුම විශ්වවිද්‍යාල වෙත දැනුම් දෙන ලදී. Erasmus + වැනි යුරෝපීය අරමුදල් වැඩසටහන්වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ යුරෝපා සංගමය සමඟ සමීපව කටයුතු කරනු ඇත. මෙය යුරෝපීය සංගමයේ සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවල සහයෝගීතාව වැඩි දියුණු කිරීම සහ 2019 දී විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම අරමුණු කර ගෙන ක්‍රියාත්මක විය.

## 9.9 අධිශිෂ්‍යත්ව / ශිෂ්‍යත්ව / පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණ බොහොමයක් සන්නිවේදනය කිරීම හා පහසුකම් සැපයීම

2018 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට විවිධ බලධාරීන්ගෙන් විවිධ වර්ගයේ ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් පිළිබඳව දැනුම්දීම් 26 ක් ලැබුණි. පහත දැක්වෙන ලැබී ඇති තොරතුරු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සියලුම / අදාළ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වෙත නිසි පරිදි දැනුම්දෙන ලදී.

I. ආලෝකය හා ජීව විද්‍යාත්මක කාරණා පිළිබඳ සංකීර්ණ අන්තර්ක්‍රියා පිළිබඳ සමුළුව: 21- 25 මැයි 2018, ට්‍රයිස්ටේ, ඉතාලිය
II. රුමේනියානු රජය විසින් පවත්වන ශිෂ්‍යත්ව වැඩසටහන
III. දේශගුණික ගතිකයේ න්‍යාය, යාන්ත්‍රණ හා ධූරාවලි ආකෘති නිර්මාණය පිළිබඳ ICTP ගිම්හාන පාසල, 2018 ජුනි 25 - 5 ජූලි, ට්‍රයිස්ටේ, ඉතාලිය
IV. යුනෙස්කෝ / ජාත්‍යන්තර තිරසාර බලශක්ති සංවර්ධන මධ්‍යස්ථානය (ISEDC) සම අනුග්‍රාහකත්වය දක්වන අධිශිෂ්‍යත්ව වැඩසටහන

V. 10 වන වාර්ෂික නෙල්සන් මැන්ඩෙලා ලෝක මානව හිමිකම් මූට් උසාවි තරගය ස්විට්සර්ලන්තය 2018 ජූලි 15 සිට 20 දක්වා

VI. 1 වන ව්‍යාපෘති රැස්වීම සහ වැඩමුළුව, 2018 මැයි 14 සිට 17 දක්වා, වියානා, ඔස්ට්‍රියාව

VII. විකිරණශීලී ද්‍රව්‍යවල ආරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව, 2018 දෙසැම්බර් 03- 07, වියානා, ඔස්ට්‍රියාව

VIII. න්‍යෂ්ටික ශිල්පීය ක්‍රම භාවිතා කරමින් හරිතාගාර වායු විමෝචනය පිළිබඳ පළමු සම්බන්ධීකරණ රැස්වීම සහ වැඩමුළුව, නැන්ජින්, චීනය

IX. ව්‍යාපෘති මධ්‍ය කාලීන සමාලෝචන රැස්වීම 2018 මැයි 14-17, බොලොග්නා, ඉතාලිය

X. නැගී එන කලාප සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව 2018

XI. ජැස්මින් ජියැන්ග්සු රජයේ ශිෂ්‍යත්ව කුසලතා වැඩසටහන, චීනය

XII. ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබූ දෙවන රැස්වීම - ආර්ථික, වාණිජ හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ කටාර් ඒකාබද්ධ කමිටුව: සිනමන් ලේක්සයිඩ්, කොළඹ, 2017 ඔක්තෝබර් 30-31

XIII. කොලොම්බියා රජය විසින් පිරිනමනු ලබන ශිෂ්‍යත්ව

XIV. සෞදි අරාබියේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමන ශිෂ්‍යත්ව

XV. ගුණාත්මක අධ්‍යාපනය සඳහා පාසැල්, පවුල් හා ප්‍රජා සහයෝගීතාවයේ නව්‍යකරණය සඳහා වන අධ්‍යාපනික නවෝත්පාදන 2018 සඳහා වන වෙන්හුයි සම්මානය

XVI. පර්යේෂක වැඩසටහන නැරඹීම - බිෂොප් විලියම්ස් අනුස්මරණ අරමුදල - 2018/2020

XVII. වුලාබෝන් උපාධි ආයතනය පශ්චාත් උපාධි ශිෂ්‍යත්වය

XVIII. තුන් වන බටහිර චීන ජාත්‍යන්තර අධ්‍යාපනික ප්‍රදර්ශනය සහ 2 වන සිවුවාන් වෘත්තීය අධ්‍යාපනික ප්‍රදර්ශනය, 2018 චෙංඩු, චීනය

XIX. එක්සත් රාජධානියේ විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධි අධිශිෂ්‍යත්ව සඳහා අරමුදල් සම්පාදනය කිරීමේ අවස්ථාව.

XX. සිරින්දෝර්න් ජාත්‍යන්තර තාක්ෂණ ආයතනය (SIIT), තම්මාසාත් විශ්වවිද්‍යාලය: විශිෂ්ට විදේශීය සිසුන් (EFS) සඳහා උපාධි හා උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන්

XXI. තායිලන්තයේ විශිෂ්ට විදේශීය සිසුන් සඳහා උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන (ඉංජිනේරු හා තාක්ෂණ)

XXII. 2018 ජාත්‍යන්තර ගිම්හාන පාසල, ඔස්ලෝ විශ්වවිද්‍යාලය ජූනි 24- අගෝස්තු 2, 2019

XXIII. වෘත්තීය ගිණුම්කරණ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (MP Acc) - IV වන කණ්ඩායම (2019)

XXIV. දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ (SAU) පුරප්පාඩු නිවේදනය

XXV. පාකිස්තානය විසින් ශ්‍රී ලංකාව වෙනුවෙන් "අල්ලාමා ඉක්බාල් ශිෂ්‍යත්ව වැඩසටහන" දියත් කිරීම

XXVI. ප්‍රතිපත්ති ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, විලියම්ස් විද්‍යාලයේ සංවර්ධන ආර්ථික විද්‍යා මධ්‍යස්ථානය

## 10. යටිතල පහසුකම් සංවර්ධනය

සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන 19,469 ක මුළු මුදලක් වෙන් කර ඇත. මෙම වැඩවලට නව ඉදිකිරීම් හා අඛණ්ඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති, පුනරුත්ථාපන ව්‍යාපෘති, අත් කර ගැනීම්, අලුතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාලවල යටිතල පහසුකම් ව්‍යාපෘති සහ සිසුන් සඳහා ධාරිතා වර්ධනය කිරීම ඇතුළත් වේ. කෙසේ වෙතත්, භාණ්ඩාගාරය නිර්දේශ කර ඇත්තේ රුපියල් මිලියන 17,230 ක් පමණක් වන අතර, 2018 වර්ෂය තුළ අරමුදල් නිදහස් කිරීමේදී භාණ්ඩාගාරය විසින් පනවා ඇති විවිධ සීමාවන් හේතුවෙන් වසර අවසාන වන විට

විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වෙත ලැබුනේ රු. මිලියන 14,098 කි. මෙම මුළු මුදලටම මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා වන පිරිවැය මෙන්ම පර්යේෂණ හා සංවර්ධන පිරිවැය ද ඇතුළත් වේ.

2018 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලින් නව ව්‍යාපෘති යෝජනා 48 ක් ලැබුණි. එහි සෝදිසි කිරීම් හා ඇගයීම් ක්‍රියාවලියෙන් පසුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ව්‍යාපෘති 26 * ක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට (NPD) අනුමත කර ඉදිරිපත් කරන ලදී. නව ව්‍යාපෘති 14 * සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2018 දී අනුමැතිය ලබා දුන් අතර, පෙර වර්ෂවල ක්‍රියාවට නංවන ලද ව්‍යාපෘති යෝජනා ඇතුළු ව්‍යාපෘති 19 * ක් අමාත්‍ය මණ්ඩලය විසින් වර්ෂය තුළ අනුමත කරන ලදී. 2018 දී භෞතිකව වැඩ ආරම්භ කරන ලද ව්‍යාපෘති 11 * # ක් සහ රු. මිලියන 47,783 ක වැඩ ආරම්භ කරන ලද ව්‍යාපෘති 11 * # ක් වසර අවසාන වන විට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ විවිධ සැලසුම් හා ඉදිකිරීම් අදියරයන්හි ක්‍රියාත්මක වෙමින් පවතී. ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 30,248 ක් වූ ව්‍යාපෘති 98 * # සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ සම්පූර්ණ කර විශ්වවිද්‍යාල පද්ධතියට භාර දෙන ලදී.

ඉහත විස්තර 9.1 වගුවේ සාරාංශ කොට දක්වා ඇති අතර සංසන්දනය කිරීමේ අවශ්‍යතා සඳහා පෙර වර්ෂ දෙකේ අනුරූප සංඛ්‍යා ද දක්වා ඇත.

සටහන : *පෙර වර්ෂවල ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ද ඇතුළත්ව
*# ව්‍යාපෘතියේ භෞතික තත්ත්වය පමණක් සලකනු ලැබීය.*

| අයිතම විස්තරය | **2016** | | **2017** | | **2018** | |
|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු වටිනාකම (රු.මි) | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු වටිනාකම (රු.මි) | ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු වටිනාකම (රු.මි) |
| වි.වි.ප්‍ර.කො. වෙත ලැබුණ ව්‍යාපෘති යෝජනා ගණන | 59 | 36,784.59 | 61 | 42,601.52 | 48 | 28,979.42 |
| වි.වි.ප්‍ර.කො. මගින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන | 41* | 23,566.12 | 36* | 22,680.38 | 26* | 24,719.24 |
| ජාතික ක්‍රමසම්පාදන දෙ. වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන | 43* | 25,478.28 | 34* | 21,997.38 | 26* | 24,719.24 |
| ජාතික ක්‍රමසම්පාදන දෙ. විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන | 47* | 26,106.74 | 26* | 17,799.62 | 14* | 14,213.46 |
| අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන | 49* | 28,667.67 | 40* | 15,438.45 | 19* | 22,846.03 |
| වර්ෂය තුළ දී ආරම්භ කරන ලද ව්‍යාපෘති ගණන | 10*# | 2,390.85 | 50*# | 32,353.50 | 11*# | 7,117.00 |
| දැනට සිදුකරගෙන යන ව්‍යාපෘති ගණන | 182*# | 49,148.00 | 122*# | 49,972.00 | 90*# | 47,783.00 |
| අවසන් කර ඇති ව්‍යාපෘති ගණන | 27*# | 3,470.09 | 59*# | 12,454.00 | 98*# | 30,248.00 |

වගුව **10.1** යටිතල පහසුකම් සංවර්ධන යෝජනා / ව්‍යාපෘතිවල ප්‍රගතිය **(2016 සිට 2018 දක්වා)**

10.1 2018 වසරේ ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

පහත දැක්වෙන්නේ 2018 දී ආරම්භ කරන ලද සහ ක්‍රියාත්මක වෙමින් පැවති විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වේ;

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ බහුකාර්ය ගොඩනැගිල්ල - රු.මිලියන 1,364
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ බහුකාර්ය ගොඩනැගිල්ල - රු.මිලියන 1,761
- තාක්ෂණ පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය - රු. මිලියන 2,087
- තාක්ෂණ පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - රු. මිලියන 2,640
- ද්‍රව්‍ය විද්‍යා හා ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශයේ ගොඩනැගිල්ල, මොරටුව විශ්වවිද්‍යාලය - රු. මිලියන 439
- යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව ගොඩනැගිල්ල, මොරටුව විශ්වවිද්‍යාලය - රු. මිලියන 247
- පරිගණක විද්‍යා අධ්‍යයනාංශ ගොඩනැගිල්ල, යාපනයේ විශ්වවිද්‍යාලයේ - රු.මිලියන 240
- සම සෞඛ්‍ය විද්‍යාව සඳහා නවීන ගොඩනැගිලි සංකීර්ණය, යාපනයේ විශ්වවිද්‍යාලයේ - රු.මිලියන 1,125
- වෛද්‍ය පීඨයේ මහල් 12 ක ගොඩනැගිල්ල, රුහුණ විශ්වවිද්‍යාලය - රු.මිලියන 1,179
- වෛද්‍ය පීඨය සඳහා මහල් 10 කින් යුත් වාට්ටු සංකීර්ණය, රුහුණ විශ්වවිද්‍යාලය - රු.මිලියන 1,300
- FAMS සඳහා පූර්ව සායනික ගොඩනැගිල්ල, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - රු. මිලියන 896
- අපජල හා මලාපවහන පවිත්‍රාගාරය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - රු. මිලියන 200
- වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - රු. මිලියන 3,229.4

# 11. තොරතුරු තාක්ෂණ සහාය

පවරා ඇති වගකීම්වලට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රමවත් සහ අඛණ්ඩ පරිගණක පද්ධතික් සහතික කිරීම වෙනුවෙන් තොරතුරු තාක්ෂණ අංශය කළමනාකරණ සහාය ලබාදෙන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල සමස්ත පාලනය වැඩි දියුණු කිරීම සඳහා නව තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම සහ ස්ථාපනය කිරීම, පවත්නා පද්ධති වැඩිදියුණු කිරීම, අවශ්‍යතා/පිරිවිතරයන් සකස් කිරීම, පරිගණක හා සන්නිවේදන පද්ධතිවල සමස්ත පරිපාලනය මෙන්ම දත්ත සැකසුම් ක්‍රියාකාරකම් ආදිය තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද කාර්යයන්ට ඇතුළත් වේ.

පහත දැක්වෙන්නේ 2018 වර්ෂයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයකි.

## 11.1 සාමාන්‍ය සහ නිතිපතා සිදු කරන කාර්යයන්

වෙබ් බිහිදොර , eMemo, මණ්ඩල රැස්වීම් කාමර වෙන්කිරීමේ පද්ධතිය, පිරිස් අංශයේ පැමිණීමේ හා පිටවීමේ වේලාව සටහන් වන eHRM පද්ධතිය, තොරතුරු තාක්ෂණ මාර්ගගත උපකාරක සේවා පද්ධතිය, නෛතික දත්ත සමුදායක්, ඊ-විමසුම් පද්ධතියක් මෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම වැනි ව්‍යාපාර යෙදුම් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම මෙයට ඇතුළත් ය.

තවද, තොරතුරු තාක්‍ෂණ අංශය විසින් හඳුනාගත් අංශ/ දෙපාර්තමේන්තු අවශ්‍යතා අනුව පිරිවිතරයන් ලබා දීමෙන් දෘඩාංග හා ජාල සම්බන්ධ මෙහෙයුම් කටයුතු සිදු කරන අතරම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රාදේශීය ජාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම 2018 වසරේ දී ආරම්භ කරන ලද අතර එය තවමත් ක්‍රියාත්මක වෙමින් පවතී.

ඊට අමතරව, පහත දැක්වෙන ප්‍රධාන අංශ තුන සඳහා තොරතුරු තාක්ෂණ අංශය මූලික වශයෙන් වගකිව යුතු විය;

1. වෙබ් අඩවි පරිපාලනය හා නඩත්තුව: මෙම කාලය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.ugc.ac.lk), UGC වෙබ් බිහිදොර (www.eugc.ac.lk) සහ තත්ත්ව සහතික කවුන්සිලයේ වෙබ් අඩවිය (www.eugc.ac.lk/qaa) මෙම අංශය විසින් මෙහෙයවන ලදී.

2. ඊ-පාලන අයදුම්පත් පරිපාලනය හා නඩත්තු කිරීම: කඩඉම් ඉසෙඩ් ලකුණු වෙබ් අඩවිය හරහා මුද්‍රා හැරීම, SMS, සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ රජයේ තොරතුරු මධ්‍යස්ථානයේ කටයුතු (1919 ඇමතුම් මධ්‍යස්ථානය), විශ්වවිද්‍යාල සඳහා මාර්ගගත ලියාපදිංචිය සහ සිසුන්ගේ මාර්ගගත අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලිය 2018 වර්ෂය තුළ දී හසුරුවන ලදී.

3. මාර්ගගත ගෙවීම් ද්වාරය පරිපාලනය හා නඩත්තු කිරීම: රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා මාර්ගගතව ලියාපදිංචි වීමේදී සිදු කරන ගෙවීම් පහසු කිරීමටත්, විදේශීය හා දේශීය රාජ්‍ය - නොවන සුදුසුකම් සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) ආයතනය මගින් පිරිනමන ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සුදුසුකම් සමාන සහතික සඳහා පිළිගැනීමේ ලිපි නිකුත් කිරීමේදී සිදු කරන මාර්ගගත ගෙවීම් කිරීමට ද මෙය භාවිත වේ.

තොරතුරු තාක්ෂණ අංශය ඉහත කාර්යයන් කාර්යක්ෂම හා සුමට ආකාරයකින් ඉටු කිරීමේදී, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය (LEARN), ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය (SLT), LK Domain Registry වැනි වෙනත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ ඵලදායී ලෙස සම්බන්ධීකරණය විය.

## 11.2 2018 දී හඳුන්වා දෙන ලද නව මෘදුකාංග හා වෙබ් අඩවි

### 11.2.1. ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා මාර්ගගත ගෙවීම් පද්ධතිය.

ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ / උත්සවවලට සහභාගී වීමට කැමති විදේශීය නියෝජිතයින්ට විදේශ මුදල් ගෙවීම පහසු කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා නව ගෙවීම් දොරටු මොඩියුලයක් නිර්මාණය කරන ලදී. මෙය සිදු කර ඇත්තේ 2019 සැලසුම් කළ උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතික කිරීමේ ආයතන සඳහා වන ජාත්‍යන්තර ජාලය (INQAAHE) සහ ආසියා පැසිෆික් තත්ත්ව ජාලයේ (APQN) සම්මන්ත්‍රණ ඉලක්ක කර ගෙන වුවද, එය අනාගතයේ දී පැවැත්වෙන එවැනි ඕනෑම අවස්ථාවක් සඳහා භාවිතා කළ හැකි පද්ධතියකි, මන්ද එය පරිශීලකයින් සඳහා අන්තර්ජාලය හරහා ගෙවීම් කිරීමේ ආරක්ෂිත ක්‍රමවේදයකි.

### 11.2.2. එළඹෙන 2019 වර්ෂයේ දී පැවැත්වෙන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා වෙබ් අඩවි

උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතික කිරීමේ ආයතන සඳහා වන ජාත්‍යන්තර ජාලය සමුළුව 2019 සහ ආසියා පැසිෆික් තත්ත්ව ජාලයේ සමුළුව 2019 සඳහා නව වෙබ් අඩවි දෙකක් 2018 වසරේ දී හඳුන්වා දෙන ලදී. සංවර්ධන අවධියේදී සම්බන්ධීකරණ කටයුතු මෙන්ම ඉන් පසුව පරිපාලනය හා නඩත්තු කටයුතු තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලදී.

## 11.3 අඛණ්ඩව ක්‍රියාත්මක වන මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘති

### 11.3.1. යෝජනා කළමනාකරණ පද්ධතිය (Proposal Management System)

මෙය විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අධ්‍යයන යෝජනාවල තත්ත්වය සහ තොරතුරු සොයා ගැනීමට උපකාරී වන මාර්ගගත අයදුම්පතකි. එහි සංවර්ධන කටයුතු අවසන් අදියරේ පවතින අතර 2018 වසරේ දී එහි පර්යේෂණ ක්‍රියාත්මක කිරීම් කිහිපයක් පවත්වන ලදී.

### 11.3.2. සේවක කළමනාකරණ පද්ධතිය (Cadre Management System)

මෙම මෘදුකාංගය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලුම විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු කඩිනමින් හා නිවැරදිව ලබා දීමෙන් මානව සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට සහාය වනු ඇත. මෙහි වැඩ කටයුතු 2018 දී ආරම්භ කරන ලද අතර එය සංවර්ධන ක්‍රියාවලියේ පවතී.

# 12. විශ්වවිද්‍යාල සිසුන් සඳහා මූල්‍ය ආධාර

## 12.1 මහපොළ ශිෂ්‍යත්ව සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර

මහපොල සහ ශිෂ්‍යාධාර යෝජනා ක්‍රම වෙනුවෙන් 2018 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වෙන් කරන ලද / ලැබුනු සහ ගෙවන ලද රු.මිලියන 1,803 ක් වන මුළු මුදල 12.1 වගුවේ දක්වා ඇත.

| විශ්වවිද්‍යාලය/උසස් අධ්‍යාපන ආයතන | මහපොල (රු.මිලියන) | ශිෂ්‍යාධාර (රු.මිලියන) | එකතුව (රු.මිලියන) |
|---|---|---|---|
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 159 | 14 | 173 |
| කොළඹ විශ්වවිද්‍යාලය | 196 | 0 | 196 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 167 | 30 | 197 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 166 | 32 | 198 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 76 | 8 | 84 |
| යාපනය විශ්වවිද්‍යාලය | 101 | 110 | 211 |
| රුහුණ විශ්වවිද්‍යාලය | 79 | 40 | 119 |
| සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය | 30 | 8 | 38 |
| ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 45 | 87 | 132 |
| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 67 | 53 | 120 |
| ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 43 | 19 | 62 |
| ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 43 | 40 | 83 |
| ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 39 | 12 | 51 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 16 | 22 | 38 |
| කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක විද්‍යායතනය | 5 | 1 | 6 |

| | | | |
|---|---|---|---|
| ත්‍රිකුණාමල මණ්ඩපය | 8 | 8 | 16 |
| වව්නියා මණ්ඩපය | 5 | 7 | 12 |
| ශ්‍රීපාලි මණ්ඩපය | 6 | 2 | 8 |
| දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය | 6 | 12 | 18 |
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | 2 | 2 | 4 |
| මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණ ආයතනය | 2 | 19 | 21 |
| ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 7 | 9 | 16 |
| **2018 වර්ෂය සඳහා එකතුව** | **1268** | **535** | **1803** |

ගුව **12.1 2018** වසරේ දී විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතනවල මහපොළ ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර

මෙය උසස් අධ්‍යාපනය හදාරන තෝරාගත් සිසුන්ට මූල්‍යමය ආධාර ලබා දෙන එකිනෙකට වෙනස් යෝජනා ක්‍රම දෙකකි.

මහපොල ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය සඳහා මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (MHESTF) විසින් 50% ක අරමුදල් සපයනු ලබන අතර ඉතිරි මුදල භාණ්ඩාගාරය විසින් ගෙවනු ලැබේ. භාණ්ඩාගාර අරමුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ගෙවනු ලබන අතර මහපොල උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල අදාළ විශ්වවිද්‍යාල වෙත සෘජුවම යොමු කෙරේ. කෙසේ වෙතත්, ස්ථාපිත නිර්ණායක මත පදනම්ව සෑම වසරකම මහපොල ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීම සහ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වගකීමකි.

අනෙක් අතට, විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර යෝජනා ක්‍රමය සඳහා මහා භාණ්ඩාගාරය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා පූර්ණ අරමුදල් ලබා දුන්නද, ශිෂ්‍යාධාර සඳහා සිසුන් තෝරා ගැනීම අදාළ විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන විසින් ස්වාධීනව හසුරුවනු ලැබේ.

## 12.2 දායක පරිත්‍යාගවලින් ලබා දෙන ශිෂ්‍යත්ව

ඉහත සඳහන් කළ මහපොල ශිෂ්‍යත්ව සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාරවලට අමතරව, දායක පරිත්‍යාගවලින් ලබා දෙන ශිෂ්‍යත්ව ආධාර සහිත තවත් ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම දෙකක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක විය. එකඟ වූ නිර්ණායක මත පදනම්ව මෙම යෝජනා ක්‍රම සඳහා සිසුන් තෝරා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරන ලදී.

### 12.2.1 මිට්ෂුබිෂි සමාගමේ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ මිට්සුබිෂි සමාගම අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව මෙම ශිෂ්‍යත්ව සඳහා අරමුදල් සපයනු ලබන්නේ මිට්සුබිෂි සමාගම විසිනි. කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය කළමනාකරණ පීඨයේ හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා වාණිජ පීඨයේ අධ්‍යයන පාඨමාලා හැදෑරීමට තෝරාගෙන ඇති සිසුන්ට මේවා පිරිනමනු ලැබේ.

ඒ අනුව, 2018 දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 30 දෙනෙකු

තෝරාගෙන ඇති අතර, මෙය ලබන්නන්ට මසකට රු.4,000/- ක් හිමිවන අතර එය මාස 12 ක කාලයක් සඳහා පමණක් ගෙවනු ලැබේ.

**12.2.2** පොලිස් මධ්‍යම ශුභසාධක මණ්ඩලය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකා පොලිස් සේවයේ සිටින දෙමාපියන්ගේ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා පොලිස් මධ්‍යම ශුභසාධක මණ්ඩලය විසින් මෙම ශිෂ්‍යත්ව සඳහා අරමුදල් සපයනු ලබයි. මහපොල, ශිෂ්‍යාධාර හෝ වෙනත් ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක් සඳහා සුදුසුකම් නොලත් තෝරාගත් සිසුන් තිදෙනෙකුට මෙම යෝජනා ක්‍රමය යටතේ මූල්‍යාධාර සපයනු ලැබේ.

2018 වසරේ දී මොරටුව විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා රුහුණ විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලවලින් එක් සිසුවෙකු බැගින් 2015/2016 අධ්‍යයන වර්ෂයෙන් තෝරාගත් අතර එම සෑම සිසුවෙකුටම වසරකට රු.20,000/- ක් වාරික10 කින්ගෙවනු ලබන අතර, අදාළ අධ්‍යයන පාඨමාලාවේ මුළු කාලය සඳහා වාර්ෂිකව එවැනි ගෙවීම් කරනු ලැබේ.

## 13. කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ සංවර්ධන ක්‍රියාකාරකම්

2018 සැප්තැම්බර් මාසයේ සිට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකරණ තොරතුරු පද්ධති අංශය කොරියාවේ අධ්‍යාපන සංවර්ධන ආයතනය (Korean Educational Development Institute,Korea((KEDI)) සමඟ ඉතා සමීපව කටයුතු කළේය. ගුණාත්මක අධ්‍යාපන දර්ශක සංවර්ධනය කිරීමේදී අධ්‍යාපන සංඛ්‍යාලේඛන පද්ධති පිළිබඳ කොරියාවේ අධ්‍යාපන සංවර්ධන ආයතනය දැනුම හා ප්‍රවීණතාව ලබා ගැනීම සහ අධීක්ෂණය සහ කාර්ය සාධනය මැනීම සඳහා එම දර්ශක භාවිතා කළ හැකි ආකාරය අවබෝධ කර ගැනීම මෙහි අරමුණ විය. කොරියාවේ අධ්‍යාපන සංවර්ධන ආයතනය සමඟ සම්බන්ධතාවය ආරම්භ කරන ලද්දේ 2018 සැප්තැම්බර් 9 සිට 13 දක්වා කොරියාවේ සෝල් නුවරදී ඔවුන් විසින් පවත්වන ලද අධ්‍යාපන දර්ශක සංවර්ධනය හා සංඛ්‍යානමය ධාරිතා වර්ධනය පිළිබඳ වැඩමුළුවේදීය. එයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ ප්‍රධානි සහභාගී විය. එතැන් සිට, කොරියාවේ අධ්‍යාපන සංවර්ධන ආයතනය හි ආචාර්ය බොන් යං කිම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ කළමනාකරණ තොරතුරු පද්ධති සංවර්ධනය පිළිබඳ කොරියානු අත්දැකීම් පිළිබඳ දැනුම කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ කාර්ය මණ්ඩලය සමඟ බෙදා ගැනීමට කටයුතු කළේය. 2018 නොවැම්බර් මාසයේදී ඔහු 'විශ්වවිද්‍යාල තොරතුරු සඳහා කේන්ද්‍රීය ස්ථානය' පිළිබඳ වැඩමුළුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දී පැවැත්වූ අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා මධ්‍යගත කළමනාකරණ තොරතුරු පද්ධතියේ අවශ්‍යතාවය විශ්ලේෂණය කිරීමේදී කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ කාර්ය මණ්ඩලයට මඟ පෙන්වූ අතර ඒ මත කෙටුම්පත් යෝජනාවක් සකස් කරන ලදී. තවද, කොරියානු අත්දැකීම් මත පදනම්ව විශ්වවිද්‍යාලවලින් සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම සම්බන්ධයෙන් නීතියක් සකස් කිරීමේ යෝජනාවක් ද ඉදිරිපත් කරන ලදී.

පද්ධති සංවර්ධනය පිළිබඳ කොරියානු අත්දැකීම් පිළිබඳ දැනුම කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ කාර්ය මණ්ඩලය සමඟ බෙදා ගැනීමට කටයුතු කළේය. 2018 නොවැම්බර් මාසයේදී ඔහු 'විශ්වවිද්‍යාල තොරතුරු සඳහා කේන්ද්‍රීය ස්ථානය' පිළිබඳ වැඩමුළුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දී පැවැත්වූ අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා මධ්‍යගත කළමනාකරණ තොරතුරු පද්ධතියේ අවශ්‍යතාවය විශ්ලේෂණය කිරීමේදී කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ කාර්ය මණ්ඩලයට මඟ පෙන්වූ අතර ඒ මත කෙටුම්පත් යෝජනාවක් සකස් කරන ලදී. තවද, කොරියානු අත්දැකීම මත පදනම්ව විශ්වවිද්‍යාලවලින් සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම සම්බන්ධයෙන් නීතියක් සකස් කිරීමේ යෝජනාවක් ද ඉදිරිපත් කරන ලදී.

## 14. ජාතික යහපත වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද විශේෂ පැවරුම්

2018 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ජාතික යහපත සඳහා පහත සඳහන් ව්‍යාපෘති හසුරුවමින් ජාතික සංවිධාන වෙත සිය ආධාර ලබා දුන්නේය.

- 2017 වර්ෂය සඳහා ජාතික පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය සම්පූර්ණ කිරීම සහ අදාළ දත්ත ජාතික විද්‍යා පදනමට ඉදිරිපත් කිරීම.
- 2010/2011 කාණ්ඩයේ අවසාන එම්.බී.බී.එස් (පුනර්) විභාගය මත පදනම්ව එම්.බී.බී.එස් උපාධිධාරීන්ගේ අවසාන කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව සම්පාදනය කිරීම සහ සීමාවාසික පුහුණු ස්ථානගත කිරීම් සඳහා එය සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.
- 2010/2011 කාණ්ඩයේ අවසාන එම්.බී.බී.එස් (re-repeat සහ re-re-repeat) විභාගය මත පදනම්ව එම්.බී.බී.එස් උපාධිධාරීන්ගේ අවසාන කුසලතා අනුපිළිවෙල ලැයිස්තුව සම්පාදනය කිරීම සහ සීමාවාසික පුහුණු ස්ථානගත කිරීම් සඳහා එය සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.

## 15. නීති කටයුතු

### 15.1 නව ව්‍යවස්ථා

සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් නියෝග 13 ක් සහ නියමාවලින් 3 ක් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නා ලදී.

#### 15.1.1. 2018 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කරන ලද නියමයන්

i. 2018 ජනවාරි මස 10 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2053/24 හි ප්‍රකාශයට පත් කරන ලද, විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ නව අධ්‍යයනාංශයක් එනම් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශයක් පිහිටුවමින් නිකුත් කරන ලද නියමය.

ii. 2018 ජනවාරි මස 29 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2056/5 හි ප්‍රකාශයට පත් කරන ලද, විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ නව පීඨයක් එනම් තාක්ෂණික පීඨයක් පිහිටුවමින් නිකුත් කරන ලද නියමය.

iii. 2018 මැයි මස 01 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2069/16 හි ප්‍රකාශයට පත් කරන ලද, විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ "සංස්කෘත අධ්‍යයනාංශය" "සංස්කෘත හා නැගෙනහිර අධ්‍යයන අධ්‍යයනාංශය" ලෙස නැවත නම් කරමින් නිකුත් කරන ලද නියමය.

iv. 2018 ජූනි මස 19 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2076/13 හි ප්‍රකාශයට පත් කරන ලද, විශ්වවිද්‍යාල පනතේ 20(4) වගන්තිය යටතේ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ උප කුලපති වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය උමා කුමාරස්වාමි (2018.06.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි) පත් කරමින් නිකුත් කරන ලද නියමය.

v. 2018 ජූනි මස 29 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2077/34 හි ප්‍රකාශයට පත් කරන ලද, විශ්වවිද්‍යාල පනතේ 20(4) වගන්තිය යටතේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය ප්‍රශාන්ත ගුණවර්ධන පත් කරමින් නිකුත් කරන ලද නියමය.

vi. 2018 ජූලි මස 09 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2079/10 හි ප්‍රකාශයට පත් කරන ලද, විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා රුහුණු විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය ලෙස උසස් කරමින් නිකුත් කරන ලද නියමය.

vii. 2018 ජූලි මස 09 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2079/11 හි ප්‍රකාශයට පත් කරන ලද, විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ නව සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශයක් පිහිටුවමින් නිකුත් කරන ලද නියමය.

viii. 2018 ජූලි මස 07 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2079/12 හි ප්‍රකාශයට පත් කරන ලද, විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ නව අධ්‍යයනාංශයක් එනම් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශයක් පිහිටුවමින් නිකුත් කරන ලද නියමය.

ix. 2018 ජූලි මස 09 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2079/35 හි ප්‍රකාශයට පත් කරන ලද, විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජරට විශ්වවිදලයේ කළමනාකරණ අධ්‍යයන පීඨයේ නව අධ්‍යයනාංශ දෙකක් එනම්, අලෙවිකරණ කළමනාකරණ අධ්‍යයනාංශයක් හා මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශයක් සහ ව්‍යවහාරික විද්‍යා පීඨයේ සෞඛ්‍ය ප්‍රවර්ධන අධ්‍යයනාංශ සහ ව්‍යවහාරික විද්‍යා පීඨයේ පරිගණනය අධ්‍යයනාංශයක් පිහිටුවමින් නිකුත් කරන ලද නියමය.

x. 2018 ජූනි මස 29 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2077/35 හි ප්‍රකාශයට පත් කරන ලද, විශ්වවිද්‍යාල පනතේ 20(4) වගන්තිය යටතේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය ප්‍රශාන්ත ගුණවර්ධන (2018.04.02 සිට 2018.06.30 දක්වා ක්‍රියාත්මක වන පරිදි) පත් කරමින් නිකුත් කරන ලද නියමය.

xi. 2018 අගෝස්තු මස 01 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2082/32 හි ප්‍රකාශයට පත් කරන ලද, විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ නව පීඨයක් එනම් වෛද්‍ය පීඨයක් සහ නව අධ්‍යයනාංශ 15ක් පිහිටුවමින් නිකුත් කරන ලද නියමය.

xii. 2018 ඔක්තෝම්බර් මස 01 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2091/6 හි ප්‍රකාශයට පත් කරන ලද, විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ නව බහු අවයවික විද්‍යා අධ්‍යයනාංශයක් පිහිටුවමින් නිකුත් කරන ලද නියමය.

xiii. 2018 දෙසැම්බර් මස 05 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2100/12 හි ප්‍රකාශයට පත් කරන ලද, විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ නව රසායනික විද්‍යා අධ්‍යයනාංශයක් පිහිටුවමින් නිකුත් කරන ලද නියමය

**15.1.2. 2018 දී ප්‍රකාශයට පත් කරන ලද නියමාවලීන්**

i. 2018 මැයි 30 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2073/11 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය සමඟ කියවිය යුතු, 91 වගන්තිය යටතේ සාදන ලද 2018 අංක 01 දරන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ නියමාවලියට සිදු කරන ලද සංශෝධනය.

ii. 2018 අගෝස්තු 23 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2059/53 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 140 වගන්තිය සමඟ කියවිය යුතු, 18 වගන්තිය යටතේ සාදන ලද 2018 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියට සිදු කරන ලද සංශෝධනය.

iii. 2018 අගෝස්තු 24 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2085/45 හි ප්‍රකාශයට පත් කරන ලද, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24(අ) වගන්තිය සමඟ කියවිය යුතු, 18 වගන්තිය යටතේ සාදන ලද 2018 අංක 03 දරන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන නියමාවලිය මඟින් පැවති කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන නියමාවලිය අහෝසි කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීම.

**15.2 අධිකරණ නඩු**

2018 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නීති අංශය විසින් විවිධ පාර්ශවයන් විසින් කොමිෂන් සභාවට එරෙහිව අධිකරණ හා විනිශ්චය සභාවල ගොනු කර තිබූ නඩු 96ක් මෙහෙයවන ලදී. මේවායේ විස්තර පහත පරිදි වේ;

- ශ්‍රේෂ්ඨාධිකරණය - නඩු 28
- අභියාචනාධිකරණය - නඩු 25
- විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය- නඩු 31
- දිස්ත්‍රික් අධිකරණය - නඩු 04
- බේරුම්කරණය - නඩු 02
- කම්කරු විනිශ්චය සභාව - නඩු 04
- මහාධිකරණය - නඩු 02

**15.3 වෙනත් ක්‍රියාකාරකම්**

15.3.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ සිදු කළ ක්‍රියාකාරකම්

2018 දී නීති අංශය අභ්‍යන්තර මාරුවීම් යෝජනා කමිටුව, ආයතන සංග්‍රහය සංශෝධනය කිරීමේ කමිටුව, පශ්චාත් උපාධි ආයතනවල කළමනාකරණ මණ්ඩල (BoM) ප්‍රතිව්‍යුහගත කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සුභසාධන ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීමේදී සම්බන්ධ විය. අධ්‍යයන නිවාඩු ලබා සිටින විශ්වවිද්‍යාල පද්ධතියේ ආචාර්යවරුන්/ නිලධාරීන්/ වෙනත් සේවකයින් විසින් අත්සන් කළ යුතු බැඳුම්කර හා ගිවිසුම් සම්බන්ධයෙන් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 920 සංශෝධනය කිරීමට අවශ්‍ය සහාය ද එමගින් ලබා දී ඇත.

**15.3.2** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පිටත සිදු කළ ක්‍රියාකාරකම්

මෙම අංශය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතීතන තත්ත්ව සහතිකය පිළිබඳ ස්ථාවර කාරක සභාවට (SCAQA) සහ අධ්‍යාපන හා මානව සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුවට දායක විය. තවද, තත්ත්ව සහතිකය සහ ප්‍රතීතන පනත් කෙටුම්පත සම්පාදනය කිරීම සඳහා එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයට නීති ආධාර ලබා දෙන ලදී.

## 16. විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය

2018 වර්ෂයේ දී, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය වාර 27ක් රැස් වී ඇති අතර, 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා වූ කාලය තුළ අභියාචනා මණ්ඩලයේ අභියාචනා 32ක් ලියාපදිංචි කොට ඇත. අභියාචනා 21ක් සම්බන්ධයෙන් නියෝග ලබා දෙන ලද අතර මෙයින් 14ක් නිෂ්ප්‍රභා කරන ලද අතර 05ක් පිළිගන්නා ලදී. එක් අභියාචනාවක් සමථයකට පත් කර ගන්නා ලද අතර අනෙක් නඩු අවසාන විය.

මූලික නියෝග 8ක් ලබා දී, නියෝග 9ක් ලේඛණ ගත කර ඇති අතර අභියාචනා 3ක් 2018 වර්ෂය වන විට ඉදිරිපත් කර ඇත.මෙම කාලසීමාව තුළ විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයට එරෙහිව අතුරු නියෝග හෝ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු කිසිවක් වාර්තා වී නොතිබුණ ද, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයට එරෙහිව අභියාචනාධිකරණය හමුවේ නඩු 3ක් ගොනුකර තිබුණි.

2018 වර්ෂය අවසාන වන විට අභියාචනා 31 ක් විභාග වෙමින් පැවතුණි.

## 17. මධ්‍යම අභ්‍යන්තර විගණනයේ කටයුතු

මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහයේ 3 වන වගන්තිය, 1 වන පරිච්ඡේදය මගින් පවරා ඇති බලය යටතේ ස්ථාපිත කරන ලදී. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ මූලික පරමාර්ථය වන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙන්ම අනෙකුත් රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර විගණන පැවරුම් සහ පරීක්ෂණ පැවැත්වීමයි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලන හා මෙහෙයුම් කටයුතුවල සියලු වැදගත් අංශ ආවරණය වන පරිදි කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද මුල්‍ය රෙගුලාසි 133 විගණන හා කළමනාකරණ චක්‍රලේඛයට අනුකූලව වර්ෂය සඳහා විගණන වැඩසටහන සකස් කරන ලදී. පද්ධතිය තුළ යහපාලනය පවත්වා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මධ්‍යම

අභ්‍යන්තර විගණන අංශය විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනයන් හි අභ්‍යන්තර විගණන අංශ සමඟ නිරන්තරයෙන් සම්බන්ධීකරණය විය.

## 17.1 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

විගණන හා කළමනාකරණ කමිටුව කොමිෂන් සභාවේ ප්‍රධාන අනුකමිටුවකි. මෙම කමිටුවේ සභාපතිවරයා ලෙස ස්වාධීන විධායක නොවන කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය මලික් රණසිංහ මහතා සහභාගී වූ අතර විධායක නොවන කොමිෂන් සභා සාමාජිකයින් දෙදෙනා ලෙස මහාචාර්ය හේමන්ත සේනානායක සහ වෛද්‍ය රුවයිස් හනීෆා ඇතුළත් වූ අතර ඊට අමතරව භාණ්ඩාගාර නියෝජිතයා ලෙස ආචාර්ය පී.කේ.ජී. හරිස්චන්ද්‍ර සහභාගී විය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හි විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ශාඛා කාර්යාලයේ විගණන අධිකාරීවරයකු නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී වූ අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා සහ ගණකාධිකාරීවරයා ආරාධිතයින් ලෙස රැස්වීම්වලට සහභාගී වූහ.

2018 කාලය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පහක් (05) පවත්වා ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක විසින් රැස්වීම් කැඳවා ඔහු කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කළේය.

## 17.2 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම්

මධ්‍යම විගණන අංශය විසින් විශ්වවිද්‍යාල 15 ක් සහ උසස් අධ්‍යාපන ආයතන18 ක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (කෝප්) රැස්වීම්වලට අදාළ කරුණු සම්බන්ධීකරණය කරන ලද අතර කෝප් ආයතනයට අවශ්‍ය තොරතුරු සාවද්‍ය හා පැහැදිලිව ඉදිරිපත් කිරීමට ඔවුන්ට සහාය විය.

## 17.3 පවත්වන ලද පූර්ව විගණනයන්

ගෙවීම්වල නිරවද්‍යතාවය විමර්ශනය කිරීම සහ සහතික කිරීම සඳහා 2018 දී පහත සඳහන් අංශ තුනෙහි පූර්ව විගණනය සිදු කරන ලදී;

- අර්ථසාධක අරමුදල නිදහස් කිරීම
- පාරිතෝෂික ගෙවීම
- විශ්‍රාම වැටුප් නිදහස් කිරීම

## 17.4 අභ්‍යන්තර විගණන වාර්තා

සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණන වාර්තා 19 ක් නිකුත් කරන ලදී. මෙයින් වාර්තා 10 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අදාළ වන අතර අනෙක් වාර්තා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ය. සියළුම වාර්තා අදාළ විගණන කමිටුවලදී සාකච්ඡා කරන ලද අතර වැඩිදුර අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු අවශ්‍ය උපදෙස් සඳහා කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී

## 18. ප්‍රකාශන සහ වාර්තා

2018 වර්ෂය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කළමනාකරණ තොරතුරු පද්ධති අංශයේ පහත සඳහන් වැදගත් ප්‍රකාශන සහ වාර්තා තුන මඟින් පද්ධතියට පරිපාලනමය සහාය ලබා දුන්නේය;

I. "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සංඛ්‍යාලේඛන- 2017 ප්‍රකාශන මාලාවේ දහසයවන වෙළුම", 2018 ජූනි මස ප්‍රකාශයට පත් කරන ලදී.

II. 'විශ්වවිද්‍යාලවල අධ්‍යයන වැඩසටහන්වල උපාධි අපේක්ෂකයෙකු සඳහා ඒකක පුනරාවර්තන පිරිවැය විශ්ලේෂණය - 2017' පිළිබඳ කොමිසමට ඉදිරිපත් කරන ලද වාර්තාව.

. 2017 දෙසැම්බර් 31 දින වන විට උසස් අධ්‍යාපන ආයතනයන් හි බැඳුම්කර ගිවිසුම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට ගත් ක්‍රියාමාර්ගවල ප්‍රගතිය පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට

## 19. තත්ත්ව රක්ෂණ කවුන්සිලයේ කාර්යභාරය සහ කටයුතු (QAC)

ශක්තිමත් තත්ත්ව සහතික (QA) පද්ධතියක සහාය තුළින් උසස් අධ්‍යාපනයේ විශිෂ්ටත්වය ළඟා කර ගැනීමේ අරමුණ ඇතිව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික හා ප්‍රතීතන කවුන්සිලය (QAAC) 2005 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. කොමිෂන් සභා තීරණයකට අනුව රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ වගකීම දරන මෙම ආයතනයේ නම 2018 අප්‍රේල් මාසයේදී තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය (**QAC**) ලෙස වෙනස් කරන ලදී.

2018 වර්ෂය තුළ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලයෙ හි කාර්යභාරය සහ කටයුතු පහත දැක්වේ;

### 19.1 අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකක සහ කාර්ය සාධන ලකුණු කාඩ්පත

2017 අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකක වාර්තාවලට අනුව, AHEAD වැඩසටහනේ අවශ්‍යතාවය වන රාජ්‍ය විශ්වවිද්‍යාල 10 ක් විසින් 2017 අවසානයේ දී කාර්ය සාධන ලකුණු කාඩ්පත සඳහා 60% කට වඩා වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමේ සපුරා ඇත.

තවද, 2018 පළමු කාර්තු තුන සඳහා අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකක ප්‍රගති වාර්තා තත්ත්ව ආරක්ෂණ හා ප්‍රතීතන කවුන්සලය වෙත ලැබී ඇති අතර අදාළ බලධාරීන්ගේ සහභාගීත්වයෙන් සම වයස් සමාලෝචන / සාකච්ඡා පවත්වන ලදී. වසර අවසානය වන විට රාජ්‍ය විශ්වවිද්‍යාල 15 න් 12 ක් විසින් කාර්ය සාධන ලකුණු පුවරුව සඳහා 75% ට වඩා වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමේ 2018 වර්ෂයේ ඉලක්කය සපුරා ගැනීමට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය අපේක්ෂා කරයි.

### 19.2 ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය

සමාලෝචිත වර්ෂය තුළ, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) සිතියම්කරණ යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීමට සහ ඒ අනුව රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන් සිතියම් ගත කිරීමට ගත් උත්සාහයන්හි සාධාරණ ප්‍රගතියක් ලබා ඇත.

රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ මට්ටම 05 ට අඩු වැඩසටහන් සඳහා තත්ත්ව ආරක්ෂණ හා ප්‍රතීතන කවුන්සලය වෙත අනුමැතිය අවශ්‍ය නොවන බව 2018 මැයි මාසයේදී කොමිසම තීරණය කළේය. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ඉල්ලීම මත පදනම්ව,සහතික පත්‍ර පාඨමාලා, ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා වැනි පාඨමාලා ඇතුළත් රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන SLQF මට්ටම 05 වැඩසටහන් පිළිබඳ විස්තර ලබා ගැනීමේ කටයුතු QAC විසින් ආරම්භ කරන ලදී. වැඩමුළුවක් පැවැත්වීම මඟින් පද්ධතිය තුළ එවැනි වැඩසටහන් අනුමත කිරීම සඳහා පොදු ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමට තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය පහසුකම් සපයන බව ද තීරණය විය.

## 19.3 විෂය මිණුම් සලකුණු (Subject Benchmark)

2018 පෙබරවාරි මාසයේදී ගනු ලැබූ කොමිෂන් සභා තීරණයක් මත පදනම්ව, සමාලෝචන ක්‍රියාවලියට අදාළව ඉම් ලකුණු සංවර්ධනය කිරීමේ විෂය පථය හා පරමාර්ථය හඳුනා ගැනීමට සහ විෂය ඉම් ලකුණු ප්‍රකාශ සඳහා පොදු ආකෘතියක් සංවර්ධනය කිරීමට අනුකමිටුවක් පිහිටුවන ලදී. ඒ අනුව, විෂය ඉම් ලකුණු ප්‍රකාශන (SBS) ලැයිස්තුව අවසාන කිරීමට සහ විෂය ඉම් ලකුණු ප්‍රකාශන සැකසීමේ කමිටු සඳහා විෂය පිළිබඳ විශේෂඥයින්ව තෝරා ගැනීමට, ස්ථාවර කමිටුවේ සියලුම හිටපු නිලධරයන් සහ විෂය ඉම් ලකුණු සකස් කිරීමේ මූලධර්ම පිළිබඳ ස්ථාවර කමිටුවල සභාපතිවරුන් සඳහා වැඩමුළුවක් AHEAD වැඩසටහනේ අරමුදල් යටතේ යෝජනා කරන ලද අතර එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

## 19.4 බාහිර තත්ත්ව ආරක්ෂණය

### 19.4.1. ආයතනික සමාලෝචන

2017 දී පවත්වන ලද ආයතනික සමාලෝචන 4 න් වාර්තා තුනක් 2018 වර්ෂය තුළදී අවසන් කර ඒ සඳහා එකඟත්වය ලබා ගන්න ලදී. ඒ අනුව සෞන්දර්ය හා කලා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය පිළිබඳ මෙම වාර්තා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ විය. සමාලෝචන වාර්තාවල නිර්දේශ මත පදනම්ව 2019 අප්‍රේල් 30 වන විට මෙම විශ්වවිද්‍යාලවල බලධාරීන්, ඉදිරි වසර 5 සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2018 කාලසටහනට අනුව, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සහ යාපනය විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචන පවත්වන ලදී. තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් ස්වයං ඇගයීම් වාර්තා ලේඛකයින්ගේ වැඩමුළුව 2018 ජනවාරි මාසයේදී ත්, ආයතනික සමාලෝචන මණ්ඩලයේ සිටින සමාලෝචනය කරන්නන් සඳහා පූර්ව සමාලෝචන වැඩමුළුව 2018 ජූලි මාසයේදී ත්, පූර්ව- ස්ථාන (විශ්වවිද්‍යාල) නැරඹීමේ වැඩමුළුව 2018 අගෝස්තු මාසයේදී ත් පවත්වන ලදී. මෙම වැඩමුළු සියල්ලම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පරිශ්‍රයේ දී පවත්වන ලදී. විශ්වවිද්‍යාල දෙකෙන් ලැබුණු ස්වයං ඇගයීම් වාර්තා පූර්ව සමාලෝචන වැඩමුළුවේදී සමාලෝචකයින්ට භාර දෙන ලදී. AHEAD වැඩසටහනේ අරමුදල් යටතේ අනුමැතිය ලබා දීමෙන් සහ එක් එක් ආයතනික සමාලෝචන මණ්ඩල ද්විත්වයටම ජාත්‍යන්තර

සමාලෝචකයෙකු පත් කිරීමෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ආයතනික සමාලෝචන මණ්ඩල දෙක තවදුරටත් ශක්තිමත් කළේය. 2018 වර්ෂය තුළදී, ආයතනික සමාලෝචන දෙකෙහිම කෙටුම්පත් වාර්තා ලැබී ඇති අතර, ඔවුන්ගේ අදහස් සඳහා එම වාර්තා උපකුලපතිවරුන් වෙත යවා ඇත.

2019 දී මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පැවැත්වීමට නියමිත ආයතනික සමාලෝචන සමඟ ආයතනික සමාලෝචන වඩාත් කාර්යක්ෂමව සිදු කිරීමට, සමාලෝචක සංචිතය වැඩි කිරීම සඳහා 2019 සැප්තැම්බර් මාසයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් විශ්වවිද්‍යාල 4 හි උපකුලපතිවරුන්ට, අභිප්‍රාය ලිපි සහ සුදුසු පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවීමට ඉල්ලීම් කරමින් ලිපි යවන ලදී. තවද, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් කරන ලද ඉල්ලීමක් සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කිරීම කළ යුතු ස්වයං ඇගයීම් වාර්තාව සඳහා වන අවසන් දිනය 2019 අගෝස්තු මස අවසාන සතිය දක්වා දීර්ඝ කිරීමට තීරණය විය.

**19.4.2.** වැඩසටහන් සමාලෝචන

තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් සියළුම රාජ්‍ය විශ්වවිද්‍යාලවල කලා, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨවල වැඩසටහන් සමාලෝචන 41 ක් සම්පූර්ණ කරන ලද අතර පීඨවල පීඨාධිපතිවරුන් විසින් පිළිගත් අවසන් සංස්කරණය කරන ලද සමාලෝචන වාර්තා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කිරීමෙන් පසුව 2018 ඔක්තෝම්බර් මාසයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙබ් අඩවියේ පල කරන ලදී. සමාලෝචන වාර්තාවල නිර්දේශ මත පදනම්ව 2019 අප්‍රේල් 30 දිනට පෙර සමාලෝචනය කරන ලද සෑම වැඩසටහනක් සඳහාම වසර 5 ක ක්‍රියාකාරී සැලැස්මක් ලබා දෙන ලෙස උපකුලපතිවරුන් / වගකිවයුතු බලධාරීන්ගෙන් ඉල්ලා සිටින ලදී.

ව්‍යාපාර හා මුල්‍ය, කළමනාකරණය, වාණිජ, අධ්‍යාපනය, නීතිය සහ ලලිත කලා පීඨවල 2018 වර්ෂය සඳහා සැලසුම් කර ඇති වැඩසටහන් සමාලෝචන සමඟ වැඩසටහන් සමාලෝචන සඳහා ස්වයං ඇගයීම් වාර්තා ලිවීම පිළිබඳ වැඩමුළුවක් 2018 ජනවාරි මාසයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. මෙම වැඩමුළුව සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල 9 ක ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් එකසිය නවයක් (109) සහභාගී වූ අතර, එහිදී අදාළ සියලුම පීඨ වලින් වැඩසටහන් සමාලෝචන 58 ක් යෝජනා කරන ලදී. තවද, 2018 පෙබරවාරියේදී වැඩසටහන් සමාලෝචකයින් ලෙස සේවය කිරීම සඳහා අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් හැට හතක් (67) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේදී සාර්ථකව පුහුණු කරන ලද අතර තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් මණ්ඩල සකස් කරන ලදී. පත් කරන ලද සමාලෝචකයින් සඳහා පූර්ව සමාලෝචන වැඩමුළුවක් 2018 ජුනි මාසයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපදන

කොමිෂන් සභා ශ්‍රවණාගාරයේදී පවත්වන ලද අතර එහිදී පීඨවලින් ලැබුණු ස්වයං ඇගයීම් වාර්තා ඔවුන්ට භාර දෙන ලදී. පූර්ව අධ්‍යයන නැරඹීමේ වැඩමුළුව 2018 අගෝස්තු මාසයේදී පවත්වන ලද අතර, අධ්‍යයන නැරඹීමේ කාලසටහන් සකස් කරන ලද අතර සමාලෝචන 52 ක අධ්‍යයන නැරඹීම් 2018 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුළ අවසන් කරන ලද අතර තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව 2018 දෙසැම්බර් මාසයේදී ඉතිරි අධ්‍යයන නැරඹීම 2019 ජනවාරි වන විට අවසන් කිරීමට තීරණය කළේය. පීඨවල අදහස් ඇතුළත් කිරීමෙන් පසු අවසාන වාර්තාව ඉදිරිපත් කිරීමේ කාලසීමාවන් පිළිබඳව තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය ඒ වන විටත් සමාලෝචකයින් වෙත සන්නිවේදනය කර තිබුණි.

වෛද්‍ය විද්‍යාව, දන්ත විද්‍යාව, සම සෞඛ්‍ය විද්‍යාව, දේශීය වෛද්‍ය විද්‍යාව, පශු වෛද්‍ය විද්‍යාව සහ කෘෂිකර්ම යන පීඨවල 2019 වැඩසටහන් සමාලෝචන පැවැත්වීම සඳහා 2018 මැයි මාසයේදී කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා ලදී. තවද, 2018 සැප්තැම්බර් මාසයේ පැවති රැස්වීමකදී මෙම වැඩසටහන් සමාලෝචන සඳහා කාල නියමයන් තීරණය කරන ලද අතර ආයතන සමාලෝචන සහ වැඩසටහන් සමාලෝචන යන දෙකෙහිම ස්වයං ඇගයීම් වාර්තා ලේඛකයින් සඳහා වැඩමුළුවක් 2019 ජනවාරි මාසයේදී පැවැත්වීමට නියමිතය. 2018 දෙසැම්බර් මාසයේදී තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව විසින් 2020 වර්ෂය සඳහා ඉංජිනේරු, වාස්තු විද්‍යා සහ විද්‍යා පීඨවල වැඩසටහන් සමාලෝචන පැවැත්වීම නිර්දේශ කරන ලදී.

## 19.5 අයදුම්පත් ආකෘති නැවත සකස් කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු අංශය විසින් සංවර්ධනය කරන ලද නව පීඨ සහ ආයතන අනුමත කිරීම සඳහා වන අයදුම් පත්‍රය තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. ඒ අනුව, කමිටුව විසින් ප්‍රධාන සංශෝධන කිහිපයක් නිර්දේශ කර තහවුරු කරන ලද අතර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යයන කටයුතු අංශයට ඒ පිළිබඳව දැනුම් දෙන ලදී.

## 19.6 පිළිගැනීමේ අයිතම

2018 ජනවාරි සිට 2018 දෙසැම්බර් දක්වා කාලය තුළ පිළිගැනීම සඳහා අයිතම 69 ක් ලැබී ඇති අතර, එය පිළිගැනීමේ කමිටුව විසින් සාකච්ඡා කර නිර්දේශ / නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

## 19.7 උපාධි වැඩසටහන් යෝජනා හා නව පීඨ / ආයතන යෝජනා ඇගයීම

2018 වර්ෂය තුළදී තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් උපාධි 119 ක වැඩසටහන් යෝජනා ඇගයීමට ලක් කරන ලද අතර එයට උපාධි 42 ක්, බාහිර උපාධි 6 ක් සහ පශ්චාත් උපාධි 71 ක් ඇතුළත් විය.

මීට අමතරව, සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුල ඇගයීමට ලක් කළ නව පීඨ / ආයතන යෝජනා ගණන 2 කි.

**19.8** වැඩසටහන් සමාලෝචනය සහ දුරස්ථ උසස් අධ්‍යාපන ආයතන සහ වැඩසටහන්වල ආයතනික සමාලෝචනය සඳහා අත්පොත් සංවර්ධනය / වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන වැඩසටහන් සමාලෝචනය සඳහා අවසන් සංස්කරණය කරන ලද අත්පොත එම විශ්වවිද්‍යාලයට මෙන්ම 2018 දී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ හි වැඩසටහන් සමාලෝචනය පවරා ඇති සෑම සමාලෝචකයෙකුටම යවන ලදි. තවද, 2019 දී පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචන සමඟ තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුවේ අනුමැතිය ඇතිව, ආයතනික සමාලෝචන අත්පොතේ කෙටුම්පත ද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල වෙත යවන ලදි.

**19.9** තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම්වලදී සිසුන්ගේ සහභාගීත්වය

තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා නානාපතිවරුන් ලෙස කටයුතු කිරීමට සුවිශේෂී දක්ෂතා ඇති සිසුන්ගේ සහභාගීත්වය ලබා ගැනීමට, ඔවුන්ව හඳුනා ගැනීම සඳහා මාර්ගෝපදේශ ලේඛනයක් සකස් කිරීම 2017 දී ආරම්භ කරන ලද ක්‍රියාවලිය අවසන් වූ අතර අවසාන ලේඛනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2018 ජනවාරි මාසයේදී අනුමත කරන ලදී.

**19.10** උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ **(AHEAD)** වැඩසටහන

ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන 'උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීම' (AHEAD) වැඩසටහනට අදාලව 2018 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරකම් සහ ඒවායේ ප්‍රගතිය තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් එහි අධ්‍යක්ෂක ගේ නායකත්වය යටතේ සමීපව පසු විපරම් කරන ලදී.

**19.11** අධ්‍යයනය පිළිබඳ වගවීම

2018 දී තත්ත්ව අරාක්ෂණ කවුන්සිලය විසින් අභ්‍යන්තර චක්‍රලේඛ සැකසීම සහ වගවීමේ ආකෘති සැකසීම සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල 12 කින් තොරතුරු ලබා ගන්නා ලදී. තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් රාජ්‍ය විශ්වවිද්‍යාල තුනක් තුලනය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමටත්, විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් සමඟ කළ වැඩමුළුවකදී ඉදිරිපත් කළ තොරතුරු මත 2019 දී සංවිධානය කිරීමට නියමිත විශ්වවිද්‍යාල අනුකූල වීම සඳහා යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම කිරීමටත් අපේක්ෂා කරයි.

**19.12 INQAAHE** (උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතික කිරීමේ ආයතන සඳහා වන ජාත්‍යන්තර ජාලය) **2019** සමුළුව: මාර්තු **25 -28, 2019**

ඉහත අන්තර්ජාතික සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එය පැවැත්වීමට සත්කාරකත්වය දරනු ලැබේ. ඒ අනුව 2018 මැයි මාසයේදී මොරිෂස් හි පැවති උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතික කිරීමේ ආයතන සඳහා වන ජාත්‍යන්තර ජාලය (INQAAHE) 11 වන ද්විවාර්ෂික සංසදය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නියෝජනය කරමින් කණ්ඩායමක් සහභාගී වීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමැතිය ලබා දෙන ලදී. සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් INQAAHE සමුළුවේ ප්‍රගතිය 2019 උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතික කිරීමේ ආයතන සඳහා වන ජාත්‍යන්තර ජාලය සංසදයේ මහා මණ්ඩල සැසිවාරයට සහභාගී වූවන්ට

වාර්තා කළ අතර එහිදී AHEAD වැඩසටහනේ අරමුදල් යටතේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය (IQAU) අධ්‍යක්ෂවරුන් 10 දෙනෙකු ද සහභාගී විය.

INQAAHE මහලේකම් කාර්යාලය සහ සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ ඇතිකරගත් ගිවිසුම 2018 අගෝස්තු 3 වන දින අත්සන් කරන ලද අතර INQAAHE ලේකම් කාර්යාලය සමඟ පැවති සාකච්ඡා මත පදනම්ව, 2019 INQAAHE සමුළුවට අදාළව 2018 වර්ෂය තුළ සිදු කිරීමට නියමිත ක්‍රියාකාරකම් හඳුනාගෙන ඒවා විධිමත් කරන ලදී. ඒ අනුව, INQAAHE සමුළුව 2019 සඳහා වන ප්‍රධාන තේමාව සහ උප තේමාවන් හතරක් තෝරා ගන්නා ලද අතර ඒවා පහත පරිදි වේ.

ප්‍රධාන සම්මන්ත්‍රණ තේමාව:

*'තත්ත්ව සහතික කිරීම, සුදුසුකම් සහ පිළිගැනීම: ගෝලීයකරණය වූ ලෝකයක විශ්වාසය පෝෂණය කිරීම'*

උප තේමාවන්:

I. නව තාක්ෂණයන්, නවෝත්පාදන සහ තත්ත්ව සහතික කිරීම: කඩාකප්පල්කාරී තාක්‍ෂණය හා විද්‍යායතන වෙනස්වීම් සහිත ලෝකයක තත්ත්ව ආරක්ෂණය සහ එහි ප්‍රධාන මූලධර්ම සලකා බලන ආකාරය.

II. ගෝලීයව සිතීම සහ ක්‍රියා කිරීම: යෝග්‍යතා මාර්ගෝපදේශ තුළ තත්ත්ව ආරක්ෂණයේ කාර්යභාරය සහ ශිෂ්‍යයා හා කුසලතා සංචලතාව: අභියෝග සහ අවස්ථාවන්

III. ගෝලීයකරණය වූ සන්දර්භයක් තුළ විශ්වාසය සහතික කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

IV. පිළිගැනීමේ ගැටළු සඳහා වන අභියෝග සහ විසඳුම්: ගෝලීය සංවර්ධනයේ රාමුව තුළ පිළිගැනීම සඳහා තත්ත්ව ආරක්ෂණ දායකත්වය සඳහා නව අවස්ථා

කොමිෂන් සභාවේ අනුමැතිය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ නිර්දේශය ඇතිව ප්‍රාදේශීය සංවිධායක කමිටුවක් පිහිටුවන ලදී. ඒ අනුව, නිසි ක්‍රියා පටිපාටීන් අනුගමනය කරමින්, 2019 උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතික කිරීමේ ආයතන සඳහා වන ජාත්‍යන්තර ජාලය (INQAAHE) සමුළුව පවත්වන ස්ථානය ලෙස බණ්ඩාරනායක ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාව (BMICH) තෝරා ගන්නා ලද අතර 2018 සැප්තැම්බර් මාසයේදී 2019 INQAAHE සමුළුවට අදාල වෙබ් අඩවිය ද දියත් කරන ලදී. INQAAHE සමුළුව සඳහා වෙනම ගෙවීම් දොරටුවක් ස්ථාපිත කරන ලද අතර විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව විදේශීය සහභාගීවන්නන් සඳහා නොමිලේ වීසා පහසුකම ද ලබා ගන්නා ලදී. ඒ අනුව සමුළුව සඳහා ලියාපදිංචිය 2018 දෙසැම්බර් 17 දින සිට මහජනයාට විවෘත විය.

තවද, සමුළුව සඳහා සිද්ධි කළමණාකරුවෙකුගේ සහ සංචාරක නියෝජිතයෙකුගේ සේවය ලබා ගැනීමටත්, "ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්‍රමය" පිළිබඳ වීඩියෝ පටයක් නිර්මාණය කිරීමටත් එය උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතික කිරීමේ ආයතන සඳහා වන ජාත්‍යන්තර ජාලය සමුළුවේ සමාරම්භක උළෙලේදී ඉදිරිපත් කිරීමටත් පසුව INQAAHE වෙබ් අඩවියේ උඩුගත කිරීමටත්, අනුග්‍රාහක පැකේජ 3 ක් ලබා ගැනීමටත් යෝජනා විය. මේ සියල්ල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පවත්වා කර අනුමත කරන ලදී.

**19.13** ආසියා පැසිෆික් තත්ත්ව ජාලයේ **(APQN)** අධ්‍යයන සමුළුව **(AAC)** සහ වාර්ෂික මහා රැස්වීම **(AGM) 2019: 2019** මාර්තු **28-31**

2019 මාර්තු මාසයේදී පැවැත්වීමට නියමිත INQAAHE සමුළුවෙන් පසුව APQN AAC 2019 පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවේ සත්කාරකත්වය ලබා දෙන ලෙස APQN මහලේකම් කාර්යාලයේ සභාපති විසින් 2018 පෙබරවාරි මාසයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලිඛිත ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉන්දියාවේ නාග්පූර් හි පැවති APQN සමුළුවට සහභාගී වූ අතර APQN AAC 2019 ගිවිසුමට අත්සන් තබන ලදී. APQN සමුළුවේ අයවැය ඇස්තමේන්තුවක් ලබා ගැනීමට, 2019 APQN සමුළුවේ මෙම ගිවිසුම කොමිෂන් සභාව විසින් සභාගත කර අනුමත කරන ලදී.

2019 INQAAHE සමුළුවේදී මෙන්ම, ප්‍රාදේශීය සංවිධායක කමිටුව විසින් සිදුවීම් කළමනාකරුවෙකු, සංචාරක නියෝජිතයෙකුගේ සේවය සහ එම අනුග්‍රාහක පැකේජ නිර්දේශ කළ අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ද මේ සම්බන්ධයෙන් ලබා ගන්නා ලදී. APQN සමුළුව පවත්වන ස්ථානය බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ලෙස අවසන් තීරණයකට එළැඹීමෙන් පසුව, INQAAHE සමුළුව සඳහා සංවර්ධනය කරන ලද ගෙවීම් දොරටුව භාවිතා කරමින් APQN සමුළුව සඳහා ලියාපදිංචි වීමේ අවස්ථාව 2018 දෙසැම්බර් මාසයේදී මහජනයාට ලබා දෙන ලදී. 2019 APQN සමුළුව සඳහා වන වෙබ් අඩවියේ සංවර්ධන කටයුතු 2018 දී ආරම්භ කරන ලද අතර, 2019 APQN සමුළුව සඳහා ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන ඇගයීම සඳහා තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය විසින් ඇගයීම් කමිටුවක් තීරණය කළ යුතුය.

# 20. ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානතාව/සාධාරණත්වය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල සියලුම සාමාජිකයින්ට හිතකර, ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙන් වැඩ කරන සහ ඉගෙනීමේ පරිසරයක් නිර්මාණය කිරීමේ ආයතනික හැකියාව ඇති බව සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාල සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පීඩාවන්ගෙන් හා වෙනස් කොට සැලකීමකින් තොරව තම වැඩ කටයුතු කරගෙන යාමට ඉඩ සලසන, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී විශ්වවිද්‍යාල සංස්කෘතීන් සහ විශ්වවිද්‍යාල පරිසරයන් ඇති කිරීමට පහසුකම් සැලසීම මගින් විශ්වවිද්‍යාල තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාතාව/සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම වැදගත් ය. මෙම චේතනාවට අනුකූලව, පහත දැක්වෙන්නේ 2018 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් ය.

**20.1** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙ හි මධ්‍යගත දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය.

**20.1.1.** ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමේ මාර්ගගත ද්වාරය ( www.eugc.ac.lk/sgbv)

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිදුවන ඕනෑම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන්ට මුහුණ දීම සඳහා මෙය හඳුන්වා දෙන ලදී. පැමිණිල්ලක් ගොනු කිරීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිහිටි මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ වෙත කෙටි පණිවුඩයක් මගින් ඒ පිළිබඳව දැනුම් දෙනු ලැබේ. වෙබ්

ද්වාරයෙහි මෙම මාර්ගගත පැමිණිලි, විශ්වවිද්‍යාල අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිහිටි මධ්‍යස්ථානයේ වර්ග කර ඇති අතර ඉන්පසු සුදුසු ක්‍රියාමාර්ගයක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් අදාළ උපකුලපති හෝ අධ්‍යක්ෂ වෙත එය යොමු කරනු ලැබේ. ඉදිරිපත් කරන සෑම පැමිණිල්ලකටම, විද්‍යාල විසින් ගනු ලබන සෑම ක්‍රියාමාර්ගයක්ම හා ඒවායෙහි ප්‍රගතිය පිළිබඳව උප කුලපතිවරුන් සමඟ නිරන්තරයෙන් සම්බන්ධ වෙමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා සාධාරණත්වය පිළබඳ කේන්ද්‍රය විසින් විමසීම් සිදු කරනු ලැබේ.

**20.1.2.** නවක වදය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමේ මාර්ගගත ද්වාරය **(www.ugc.ac.lk/rag)** සහ **24/7**පුරා විවෘත ඇමතුම් මධ්‍යස්ථානය **+94 112 123 700**

සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ පැමිණිලි 250 කට අධික සංඛ්‍යාවක් ලැබී ඇති අතර, ඒ සම්බන්ධයෙන් කටයුතු කර ඇත. පැමිණිලි වලින් වැඩි ප්‍රමාණයක් ඇමතුම් මධ්‍යස්ථානය හරහා ලැබී ඇති අතර එම පැමිණිලි ද පසුව වෙබ් ද්වාරයට උඩුගත කරන ලද අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාතාව/සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ වෙත දැනුම් දෙන ලදී. මීට අමතරව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභවේ සභාපති සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාතාව/සාධාරණත්වය පිළබඳ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ වෙත ලිඛිතව / පෞද්ගලිකව පැමිණිලි ද ලැබුණි.
තවද, විශ්වවිද්‍යාල සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට හදිසි අවස්ථාවකදී උපකාර ලබා ගැනීම සඳහා හදිසි ආරක්ෂිත ජංගම යෙදුමක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සහයෝගයෙන් සංවර්ධනය කරන ලද අතර එය 2018 ජූනි මාසයේදී දියත් කරන ලදී. මෙය 2018 අගෝස්තු - දෙසැම්බර් කාලය තුළ ක්‍රියාත්මක කරන ලදී.

**20.1.3.** නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දත්ත සමුදාය

නවක වදය සහ ලිංගික හිරිහැර පිළිබඳ වාර්තා සමඟ ඒවාට එරෙහිව සුදුසු දඬුවම් ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රගතිය පිළිබඳව නවක වදය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා දත්ත ගබඩාව සම්පාදනය කරන ලදී. එය යාවත්කාලීන කර වැඩි දියුණු කරන ලදි. ඉදිරියේදී, සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාලවල සහ අනුබද්ධ මණ්ඩප සහ උසස් අධ්‍යාපන ආයතනයන් හි සංවර්ධනය කිරීමට නියමිත දත්ත සමුදායන් සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මධ්‍යස්ථානයේ දත්ත සමුදාය සම්බන්ධ කිරීමට ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාතාව/සාධාරණත්වය පිළබඳ කේන්ද්‍රය සැලසුම් කරයි.

## 20.2 මුද්‍රිත / විද්‍යුත් මාධ්‍ය භාවිතා කිරීමින් නවක වදය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ප්‍රචාරය ලබා දීම

"විශ්වවිද්‍යාලයේ නවක වදය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ තොරතුරු" පිළිබඳ විශේෂ අත් පත්‍රිකාව භාෂා තුනෙන්ම මුද්‍රණය කර

2016/2017 කණ්ඩායමේ නවකයින් 29,602 ක් සඳහා මෙන්ම දෙවන වසරේ සිසුන් 25,067 ක් අතර බෙදා හරින ලදී. තවද, විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන තුළ අවශ්‍ය මට්ටමේ ප්‍රචාරයක් ලබා දීම සඳහා නවක වදය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිර්මාණය වුණු "18 x 22" පෝස්ටර් උපකුලපතිවරුන්, මණ්ඩපාධිපතිවරුන් සහ අධ්‍යක්ෂවරුන් වෙත යොමු කරන ලදී.

පත් කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන් සහ බලධාරීන් නවක වදය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල වල දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අමතරව, මාධ්‍ය හමුවීම් සහ මාධ්‍ය සම්මුඛ සාකච්ඡා ද පවත්වන ලදී.

## 20.3 "විශ්වවිද්‍යාල තුළ නවක වදය වැළැක්වීම සහ තුරන් කිරීම" සඳහා වන කාර්ය සාධක බලකාය

නිශ්චිත හා පැහැදිලි අරමුණක් ඇතිව 2017 දී පිහිටුවන ලද ඉහළ බලැති බහු ආංශික කාර්ය සාධක බලකාය එහි අරමුණු ඉටු කර ගැනීම සඳහා 2018 දී නිතිපතා ද්වි-මාසික රැස්වීම් පැවැත්විය.

## 20.4 විශ්වවිද්‍යාල තුළ ව්‍යුහයන්

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම වූ විශේෂිත කේන්ද්‍රීය ස්ථාන (මධ්‍යස්ථාන, කුටි, කමිටු ආදියෙන් සමන්විත) ජාලයක්, ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් ප්‍රධානීන් ලෙස පත් කර විශ්වවිද්‍යාල 15 තුළ ස්ථාපිත කරන ලදී. ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාතාව/සාධාරණත්වය පිළබඳ ස්ථාවර කාරක සභාවේ හිටපු නිලධාරි සාමාජිකයින් ලෙස මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය කේන්ද්‍රීය ස්ථාන ප්‍රධානීන් පත් කරන ලදී.

## 20.5 ස්ත්‍රී පුරුෂ භාවය සංවේදී කිරීම සහ සවිබල ගැන්වීම

ස්ත්‍රී පුරුෂ භාවය සංවේදී කිරීම සහ සවිබල ගැන්වීම සහතික කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- විවිධ විශ්වවිද්‍යාල නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, සංවේදීකරණ වැඩසටහන්, පුහුණු වැඩමුළු සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් යනාදිය පවත්වන ලදී.
- ඔවුන්ගේ ඉල්ලීම මත විශ්වවිද්‍යාල පහක වැඩමුළු පැවැත්වීම.
- *"ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාතාව/සාධාරණත්වය කරා : අන්තර් විශ්වවිද්‍යාල ස්ත්‍රී පුරුෂ සමජභාවයේ පිළිබඳ උළෙල"* යන මාතෘකාව යටතේ 2017 දී ආරම්භ කර 2018 දී නිම කරන ලද කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා නව්‍ය නායකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතා ප්‍රවර්ධන වැඩසටහන්.

මෙම වැඩසටහනේ පරමාර්ථය වූයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා අවකාශය පිළිබඳ ගැටළුව සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා අවකාශයන් ලබා දීම සහ එමගින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයේ විවිධ අංශ පිළිබඳව ඉගෙනීමේ අවස්ථා ලබා දීමටත්, නිර්මාණාත්මක ක්‍රියාකාරකම් තුළින් වෙනසක් ඇති කිරීමට සඳහා අදහස් ප්‍රකාශ කිරීම අවස්ථාව ලබා දීමත්ය.

## 20.6 ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාතාව/සාධාරණත්වය, නවක වදය හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රතිපත්ති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාතාව/සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය විසින් , ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාතාව/සාධාරණත්වය පිළිබඳ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාලවලට පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2018 දී තවත් විශ්වවිද්‍යාල දෙකක ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාතාව/සාධාරණත්වය පිළිබඳ ප්‍රතිපත්ති වෙබ් අඩවියට එක් කරන ලදී. මීට අමතරව, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාතාව/සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය, විශ්වවිද්‍යාලවලට ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ අතුරු නීති සංවර්ධනය කිරීමට දිරිගැන් වූ අතර 2018 දී එක් අතිරේක විශ්වවිද්‍යාලයක් අතුරු නීති සහ මාර්ගෝපදේශ සංවර්ධනය කරන ලදී.

## 20.7 පර්යේෂණ අධ්‍යයන

2018 වර්ෂයේ දී සිදු කරන ලද ප්‍රගතිය පහත දැක් වේ.

- යුනිසෙෆ් සමඟ සහයෝගයෙන්, විශ්වවිද්‍යාල තුළ පවතින නවක වදය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට මූල හේතු හඳුනා ගැනීමට සහ ඊට එරෙහිව සටන් කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණ ස්ථාපිත කිරීමට, විශ්වවිද්‍යාල ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම සඳහා නවක වදය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණ කටයුතු සිදු කරන ලදී. පර්යේෂණයේ පළමු කොටස 'නවක වදය, හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම වූ ප්‍රචණ්ඩත්වය පැතිරීම හා බලපෑම, එවැනි සිදුවීම් සහ විශ්වවිද්‍යාල සිසුන් අතර පවත්නා වාර්ගීකරණ පද්ධති පිළිබඳ ප්‍රමාණාත්මක හා ගුණාත්මක අධ්‍යයන' ක්‍රියාත්මක වෙමින් පවතී.

- හඳුනාගත් අඩුපාඩු සඳහා සැලසුම් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල හතක ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක්, පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් සම්මේලනය (COL) සමඟ සහයෝගයෙන් 2018 ජූනි මාසයේ දී පවත්වන ලදී.

- "උසස් අධ්‍යාපනය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය" පිළිබඳ දෙදින ජාතික සම්මන්ත්‍රණය 2018 අගෝස්තු මාසයේ දී පවත්වන ලද අතර එය සමකාලීන උසස් අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ ප්‍රධාන කරුණු කිහිපයක් සාකච්ඡා කිරීමට හා විවාද කිරීමට සංසදයක් සපයන ලදී. පර්යේෂණ

පත්‍රිකා එකොළහක් ඉදිරිපත් කර තිබූ අතර ප්‍රධාන දේශනා දෙකක් ප්‍රකාශනය සඳහා කර්තෘ/විස්ටාස් වෙත යවන ලදි.

## 21. 2018 වර්ෂය තුළ දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ ලිපි

සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් පවරා ඇති බලතල, රාජකාරි හා කාර්යයන් තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ රජයේ ආයතන විසින් කරන ලද නියෝගයන් සමඟ සමාලෝචිත කාල සීමාව තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල සුමට ක්‍රියාකාරිත්වය සඳහා කොමිෂන් සභාව ගත් තීරණ හා ප්‍රතිපත්තිවලට අදාළ උපදෙස් හා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීම සඳහා කොමිෂන් සභා චක්‍රලේඛ 26 ක් සහ ආයතන චක්‍රලේඛ ලිපි 18 ක් නිකුත් කර ඇත.

මේවා පිළිබඳ විස්තර 21.1 වගුවේ සහ 21.2 වගුවේ දක්වා ඇත;

| අංකය | චක්‍රලේඛ අංක | විෂය | චක්‍රලේඛයේ දිනය |
|---|---|---|---|
| 1 | 01/2018 | ස්කයිප් / වීඩියෝ සම්මන්ත්‍රනය හරහා සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටීමට අපේක්ෂකයින්ට අවස්ථාව ලබා දීම. | 23.01.2018 |
| 2 | 01/2015(ii) | බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් ගාස්තු සහ ගමන් වියදම් | 02.02.2018 |
| 3 | 02/2018 | වෘත්තීය සමිති ක්‍රියාමාර්ග | 12.04.2018 |
| 4 | 03/2018 | විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට මාසික හිලවු දීමනාව (MCA) ගෙවීම | 27.04.2018 |
| 5 | 18/2017(i) | නව බඳවා ගැනීමේ පරිපාටි යටතේ, විනයාරක්ෂක II සහ I ශ්‍රේණිවල තනතුරු දරන්නන්, විනයාරක්ෂක තනතුරේ අදාළ ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කිරීම. | 08.05.2018 |
| 6 | 17/2016(v) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය කිරීම - 2016 | 01.06.2018 |
| 7 | 17/2016(vi) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය කිරීම වැටුප් සංශෝධනය කිරීම -2016 | 14.06.2018 |
| 8 | 04/2018 | උපකුලපති තනතුරට පත් කිරීම | 28.06.2018 |
| 9 | 05/2018 | විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිටින පර්යේෂකයන් හඳුනාගැනීම සඳහා වන විනිවිදභාවයෙන් යුතු පර්යේෂණ කාර්යසාධන පටිපාටිය | 05.07.2018 |
| 10 | 06/2018 | කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය | 16.07.2018 |
| 11 | 07/2018 | කථිකාචාර්ය (ස්ථිර නොකළ) (වෛද්‍ය / දන්ත) සහ කථිකාචාර්ය (ස්ථිර නොකළ) [(වෛද්‍ය / දන්ත වෛද්‍ය )-නොවන] තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි | 02.08.2018 |
| 12 | 08/2018 | අන්තර්ජාතික ප්‍රමිතීන් සමඟ පෙළගැස්වීම සඳහා පරිගණක උපාධි වර්ගීකරණය | 28.08.2018 |
| 13 | 09/2018 | කාර්ය මණ්ඩල පාලිකා සහ දන්ත වෛද්‍ය විද්‍යාල/දන්ත වෛද්‍ය පීඨයේ කාර්ය මණ්ඩල පාලිකා තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කිරීම. | 28.08.2018 |
| 14 | 10/2018 | නිදර්ශක එකතු කරන්නා තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය | 03.10.2018 |
| 15 | 11/2018 | ශිෂ්‍යාධාර යෝජනා ක්‍රමය සහ ශිෂ්‍යාධාර ගෙවීම | 11.10.2018 |
| 16 | 12/2018 | කළමනාකරණ සහකාර (පොත් තබන්නා)/කළමනාකරණ සහකාර (සරප්)/කළමනාකරණ සහකාර (ගබඩා පාලක) තනතුරුවල බඳවා ගැනීමේ පරිපාටි | 17.10.2018 |

| | | | |
|---|---|---|---|
| 17 | 13/2018 | හෙද උපදේශක තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය | 26.10.2018 |
| 18 | 14/2018 | තේරීම් කමිටු සාමාජිකයින් සඳහා ගාස්තු ගෙවීම | 09.11.2018 |
| 19 | 15/2018 | විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනයන් හි සේවකයින් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය | 26.11.2018 |
| 20 | 05/2018(i) | විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිටින පර්යේෂකයන් හඳුනාගැනීම සඳහා වන විනිවිදභාවයෙන් යුතු පර්යේෂණ කාර්යසාධන පටිපාටිය | 04.12.2018 |
| 21 | 16/2018 | සාමාන්‍ය උසස්වීම් මගින් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය [(වෛද්‍ය / දන්ත වෛද්‍ය)-නොවන] තනතුර සඳහා බඳවා ගැනීමේ ගැනීමේ පරිපාටිය | 11.12.2018 |
| 22 | 17/2018 | භාරකරු සහ අරක්කැමි තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය | 13.12.2018 |
| 23 | 18/2018 | අධ්‍යක්ෂ / ශාරීරික අධ්‍යාපනය තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය සම්බන්ධ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 922 ට සංශෝධනයක් | 12.12.2018 |
| 24 | 19/2018 | මාෂල් II ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම | 17.12.2018 |
| 25 | 20/2018 | තාක්ෂණ නිලධාරී_II ශ්‍රේණිය "ඒ" කොටස තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය | 18.12.2018 |
| 26 | 21/2018 | තාක්ෂණ නිලධාරී_(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය), තාක්ෂණ නිලධාරී_(සිවිල්), තාක්ෂණ නිලධාරී_(විදුලි), තාක්ෂණ නිලධාරී_(යාන්ත්‍රික) තාක්ෂණ නිලධාරී_(රසායනික) යන තනතුරු සඳහා බඳවා ගැනීමේ බඳවා ගැනීමේ පරිපාටිය | 26.12.2018 |

**වගුව 21.1 2018 දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි**

| අංකය | ආයතන චක්‍රලේඛ ලිපි අංක | විෂය | චක්‍රලේඛ ලිපියේ දිනය |
|---|---|---|---|
| 1 | 01/2018 | ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක 01/2018 අදාළ කර ගැනීම | 29.01.2018 |
| 2 | 02/2018 | විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයන්ගේ මාරුවීම් | 09.02.2018 |
| 3 | 03/2018 | කථිකාචාර්ය (ආධුනික) – (වෛද්‍ය/ දන්ත වෛද්‍ය) සහ (වෛද්‍ය/ දන්ත වෛද්‍ය)-නොවන තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි | 20.02.2018 |
| 4 | 04/2018 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 31/(2001)(XIII) අදාළ කර ගැනීම - විනය පරීක්ෂණ නිලධර නාම ලේඛණය | 26.02.2018 |
| 5 | 05/2018 | බඳවා ගැනීමේ කාර්යය සඳහා සෑම තේරීම් කමිටුවක් සඳහාම වන ලකුණු ලබා දීමේ ක්‍රමවේදය | 02.04.2018 |
| 6 | 06/2018 | විශ්වවිද්‍යාල පරිපාලන හා මූල්‍ය නිලධාරීන් සඳහා වන හඳුන්වාදීමේ පුහුණු වැඩසටහන | 05.04.2018 |
| 7 | 07/2018 | 2018 මැයි දිනය වෙනුවෙන් විශේෂ නිවාඩු ලබා දීම | 20.04.2018 |
| 8 | 08/2018 | 2018 රාමලාන්(රාමසාන්) සමයේ දී විශේෂ නිවාඩු ලබා දීම | 15.05.2018 |
| 9 | 09/2018 | සහනදායි කොන්දේසි මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම | 19.06.2018 |
| 10 | 10/2018 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන රසායනාගාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 03.08.2018 |
| 11 | 11/2018 | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සහතික කිරීමේ මණ්ඩලයේ සහතිකය හෝ ආචාර්ය උපාධිය ඉදිරිපත් කිරීමට යටත්ව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ (වෛද්‍ය/දන්ත වෛද්‍ය) සහ [(වෛද්‍ය/දන්ත වෛද්‍ය)-නොවන] සහ කථිකාචාර්ය (ස්ථිර නොකළ) [(වෛද්‍ය/දන්ත වෛද්‍ය)- නොවන] තනතුරු සඳහා අයදුම් කිරීමට අපේක්ෂකයන්ට අවස්ථාව ලබා දීම. | 11.09.2018 |
| 12 | 03/2018(i) | කථිකාචාර්ය (ආධුනික) (වෛද්‍ය / දන්ත) සහ [(වෛද්‍ය / දන්ත වෛද්‍ය)- නොවන] තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි | 26.10.2018 |
| 13 | 12/2018 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ විශ්වවිද්‍යාලවල රජයේ විගණන ශාඛාවේ විගණන අධිකාරීවරු සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දීම | 29.10.2018 |
| 14 | 13/2018 | රාජ්‍ය අංශයේ ආයතනවලට සිදු කරන බඳවා ගැනීම් සහ වැටුප් හා දීමනා වැඩි කිරීම | 30.11.2018 |
| 15 | 14/2018 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ තනතුරට උසස් කිරීමේ දිනය තීරණය කිරීම | 11.12.2018 |
| 16 | 15/2018 | 2019 වසර - රාජකාරී කටයුතු ඇරඹීම - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2018 අදාළ කර ගැනීම. | 26.12.2018 |

| | | | |
|---|---|---|---|
| 17 | 16/2018 | විශ්වවිද්‍යාල පද්ධතියේ සේවකයින්ගේ ස්ථාන මාරුවීම් | 26.12.2018 |
| 18 | 17/2018 | රාජ්‍ය නිලධරයන්ට විශේෂ අත්තිකාරම් -2019 වසර - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/2018 අදාළ කර ගැනීම | 28.12.2018 |

වගුව **21.2 2018** දී නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ ලිපි

## 22. වඩාත් හොඳ සේවාවක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පහසුකම් වැඩි දියුණු කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාන්‍ය නඩත්තු හා අළුත්වැඩියා කටයුතුවලට අමතරව, පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති 2018 දී ක්‍රියාත්මක කරන ලද්දේ එහි පාර්ශවකරුවන්ට වඩා හොඳ සේවාවන් සැපයීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් ය.

- මහජන සම්බන්ධතා කාර්යාලය සහ පොදු රැඳී සිටීමේ ස්ථානය සඳහා වන නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර, 2018 අවසන් වන විට එහි වැඩවලින් 60% ක් අවසන් කර තිබුණි.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සියලුම ඇනලොග් දුරකථන ඩිජිටල් දුරකථන පද්ධතියකට පරිවර්තනය කිරීම.
- ටේලර් සහ ෆ්‍රැන්සිස්, ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාල මුද්‍රණාලය සහ එමරල්ඩ් සමූහයට ප්‍රවේශය ඇතිව UGC-2018-2020 අනුග්‍රහය යටතේ ජාතික ඩිජිටල් පුස්තකාල සම්මේලනයක් පිහිටුවීම.
- සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියටම භාවිතා කිරීම සඳහා ප්‍රති-රචනා චෞරත්ව මෘදුකාංගයක් (Anti-Plagiarism software ) මිලදී ගැනීම.

ඉහත කරුණු වලට අමතරව, මුදල් අංශය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විසින් භාවිතා කරන ලද ලේඛනවල ඩිජිටල් අධිලේඛනකරණය සහ භෞතික ලේඛනකරණය යන දෙකම 2018 දී rඅවසන් කරන ලදී.

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 2018 දෙසැම්බර් 31 දිනට

රු

| | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම වත්කම් | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 3,227,738 | 372,420,542 |
| ලැබිය යුතු ගිණුම් | 2 | 215,144,092 | 74,072,707 |
| තොග | | 32,743,543 | 7,264,430 |
| ඉදිරියට කල ගෙවීම්/තැන්පතු | 3 | 4,840,103 | 26,697,460 |
| මුලු ජංගම වත්කම් | | **255,955,475** | **480,455,139** |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 4 | 86,117,594 | 87,218,238 |
| ඉඩම් හා ගොඩනැගිලි | 4 | 605,338,236 | 516,256,227 |
| අස්පශ්‍යාර් වත්කම් - පරිගණක මෘදුකාංග | | 9,408,128 | 7,426,856 |
| කරගෙන යන වැඩ - ඉදිකිරීම් | | 21,694,419 | 89,043,481 |
| කරගෙන යන වැඩ-පරිගණක මෘදුකාංග | | 10,253,750 | - |
| ආයෝජන | 5 | 49,504,686 | 56,168,243 |
| බැදුම්කර අයිම්ල | 6 | 6,085,131 | 7,011,686 |
| පරිත්‍යාග/ශිෂ්‍යත්ව අරමුදල් ආයෝජන | 7 | 31,386,516 | 18,968,838 |
| මුලු ජංගම නොවන වත්කම් | | **819,788,459** | **782,093,568** |
| මුලු වත්කම් | | **1,075,743,934** | **1,262,548,708** |
| ස්කන්ධය හා වගකීම | | | |
| ජංගම වගකීම් | | | |
| ගෙවිය යුතු ගිණුම් | 8 | 112,639,024 | 129,196,581 |
| ඉදිරියට ලද ගෙවීම්/තැන්පතු | 9 | 10,697,221 | 8,702,354 |
| මුලු ජංගම වගකීම් | | **123,336,245** | **137,898,935** |
| ජංගම නොවන වගකීම් | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | 10 | 56,391,991 | 50,040,039 |
| පරිත්‍යාග අරමුදල් | 11 | 32,182,065 | 27,612,185 |
| පර්යේෂණ අරමුදල් | 12 | 5,234,758 | 12,806,260 |
| විශේෂ අරමුදල් | 13 | 31,371,393 | 32,421,435 |
| මුලු ජංගම නොවන වගකීම් | | **125,180,207** | **122,879,919** |
| මුලු වගකීම් | | **248,516,452** | **260,778,854** |
| ශුද්ධ වත්කම් | | **827,227,482** | **1,001,769,853** |
| ඒකාබද්ධ අරමුදල් සහ සංචිත | | | |
| විලම්භිත ප්‍රාග්ධන ලැබීම් | 14 | 205,192,250 | 193,111,003 |
| වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | 15 | 42,297 | 25,949,273 |
| වියදම් නොකළ පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් ප්‍රදාන | 16 | - | 1,659,639 |
| වියදම් නොකළ මානව සම්පත් සංවර්ධන ප්‍රදාන | 17 | - | 9,792,378 |
| වියදම් නොකළ 2017 අයවැය යෝජනා ප්‍රදාන | 18 | - | 125,300,000 |
| ත්‍යාග සහ ප්‍රදාන | | 1,127,957 | - |
| සේවක සංවර්ධන අරමුදල | | 30,031,067 | 35,546,482 |
| UGC සංවර්ධන අරමුදල | | 69,770,159 | 101,097,310 |
| නැවත අගය කිරීමේ අතිරික්තය | | 509,313,767 | 509,313,767 |
| සමුච්චිත අතිරික්තය/(ඌනතාවය) | | 11,749,985 | - |
| මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය | | 827,227,482 | 1,001,769,853 |

මූල්‍ය ප්‍රකාශ වල පිටු අංක 05 සිට 11 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 12 සිට 22 දක්වා ගිණුම් සඳහා වන සටහන් දක්වා ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමෂන් සභා සාමාජිකයින් වගකීමෙන් බැඳී සිටී.මෙම මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සාමාජිකයින් විසින් අනුමත කොට කරන ලද අතර කොමිෂන් සභාව වෙනුවෙන් අත්සෑ

| | | |
|---|---|---|
| මහාචාර්ය මොහාන් ද සිල්වා | මහාචාර්ය මලික් රණසිංහ | ආර්.ඒ.යූ රණවීර |
| සභාපති | කොමිෂන් සභා සාමාජික | ගණකාධිකාරී |

# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2018 | 2017 |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ලැබීම් | | |
| අතිරික්තය/(ඌනතාවය) | 74,704,144 | 72,658,248 |
| ගැලපීම් | | |
| පෙර වර්ෂ සඳහා ගැලපීම් | 249,583 | 871,200 |
| UGC සංවර්ධන අරමුදල වෙත මාරු කිරීම | (63,203,742) | (85,996,810) |
| කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල වෙත මාරු කිරීම් | - | (6,000,000) |
| හොඳම විශ්වවිද්‍යාල ශිෂ්‍යයා සඳහා වන ශිෂ්‍යත්ව ගිණුම් ශීර්ෂය වෙත මාරු කිරීම | - | (2,000,000) |
| ක්ෂය වීම | 35,347,401 | 26,304,119 |
| ක්‍රමක්ෂය | (37,173,810) | (28,834,479) |
| බැදුම්කර අධිමිල | 361,786 | 361,786 |
| තොගවල වැඩිවීම් | (25,479,113) | (4,423,644) |
| ගෙවීම්වල අඩුවීම් | (14,562,690) | (487,842,115) |
| පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම | 6,939,452 | 7,854,955 |
| පාරිතෝෂිකය සඳහා පොළිය | 3,568,116 | 3,568,116 |
| දේපල, පිරියත හා උපකරණ විකිණීම් (ලාභ)/අලාභ | - | 114,868 |
| ඉදිරියට කළ ගෙවීම්/තැන්පතු වල අඩුවීම් | 21,857,357 | (5,918,566) |
| අයවීම්වල වැඩිවීම් | (141,071,385) | 52,202,860 |
| පාරිතෝෂික ගෙවීම් | (3,590,848) | (2,824,949) |
| පෙර වර්ෂ සඳහා ගැලපීම් - ස්ථාවර වත්කම් ප්‍රශ්ධනීකරණය | 24,808,991 | 5,335,845 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ලැබීම්** | **(117,244,757)** | **(454,568,565)** |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| දේපළ පිරියත උපකරණ මිලට ගැනීම | (125,174,663) | (60,704,218) |
| පිරියත හා උපකරණ විකුණුම් | - | 1,126,500 |
| ස්ථාවර තැන්පතු /භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය | (5,754,120) | (276,359) |
| කරගෙන යන වැඩවල වැඩිවීම - UGC ගොඩනැගිල්ල සහ UGC මූල්‍ය අංශය, මෘදුකාංග | 57,095,312 | (70,339,491) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(73,833,471)** | **(130,193,569)** |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| මූලධන ආධාර ලැබීම් | 9,500,000 | 84,400,000 |
| පුනරුත්ථාපන ආධාර ලැබීම් | 1,000,000 | 14,000,000 |
| පර්යේෂණ අරමුදල්වල අඩුවීම් | (7,571,502) | 182,017 |
| විශේෂ අරමුදල් අඩුවීම | (1,050,043) | 419,124 |
| මූලධන ආධාර (අඩුවීම්)/වැඩිවීම් | (12,627,967) | - |
| ශිෂ්‍යත්ව අරමුදල් ලැබීම්/(ගෙවීම්) | 4,569,880 | 3,712,553 |
| කාර්යය මණ්ඩල සංවර්ධන අරමුදලේ / UGC සංවර්ධන අරමුදලේ වැඩිවීම | (36,842,567) | 89,988,402 |
| වියදම් නොකළ මානව සම්පත් සංවර්ධන අරමුදලේ වැඩිවීම්/(අඩුවීම්) | (9,792,378) | 9,792,378 |
| 2017 අයවැය යෝජනා අඩුවීම | (125,300,000) | (283,754,248) |
| **මූල්‍ය ක්‍රියාකාරම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(178,114,576)** | **(81,259,774)** |
| | | |
| මුදල් සහ මුදල් සමාන වත්කම් වල වැඩිවීම්/(අඩුවීම) | (369,192,804) | (666,021,908) |
| වර්ෂය මුල මුදල් සහ මුදල් නොවන වත්කම් | 372,420,543 | 1,038,442,451 |
| වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් නොවන වත්කම් | 3,227,739 | 372,420,543 |

සටහන-1

| | | |
|---|---|---|
| UGC A/C 2323284 - ලංකා බැංකුව | (17,886,590) | (16,707,725) |
| ලංකා බැංකුව-විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව අරමුදල | 697,771 | 8,898,672 |
| රාත්‍රී කාලීන තැන්පතු | 9,000,000 | 356,000,000 |
| අරමුදල් කළමනාකරණ ගිණුම | 11,416,557 | 24,229,595 |
| | 3,227,739 | 372,420,543 |

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| විස්තරය | විලම්භිත ප්‍රදාන | වියදම් නොකළ ප්‍රදාන | රඳවාගත් ලාභ/අලාභ | UGC සංවර්ධන අරමුදල | නැවත අගය කිරීමේ අතිරික්තය | කාර්යය මණ්ඩල සංවර්ධන අරමුදල | ත්‍යාග සහ ප්‍රදාන | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 2018.01.01 දිනට ශේෂය | 193,111,003 | 162,701,290 | - | 101,097,310 | 509,313,767 | 35,546,482 | - | 1,001,769,853 |
| පෙරවර්ෂ සඳහා ගැලපීම් | | | 249,583 | | | | | 249,583 |
| 2017.01.01 දිනට ශේෂය | 193,111,003 | 162,701,290 | 249,583 | 101,097,310 | 509,313,767 | 35,546,482 | | 1,002,019,436 |
| මූලධන ප්‍රතිපාදන වැඩිවීම | 12,081,247 | | | | | | | 12,081,247 |
| අතිරික්තය/ඌනතාවය | | | 74,704,144 | | | | | 74,704,144 |
| වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන වැඩිවීම | | (162,658,993) | | | | | | (162,658,993) |
| UGC සංවර්ධන අරමුදලට/කාර්යය මණ්ඩල සංවර්ධන අරමුදල අඩුවීම | | | | | | (5,515,415) | | (5,515,415) |
| UGC සංවර්ධන අරමුදල වෙත මාරු කිරීම (15%ක් වැඩසටහන් සමාලෝචනයෙන් සහ ආයතනික සමාලෝචනයෙන් මාරු කිරීම) | | | (3,203,742) | 3,203,742 | | | | - |
| වර්ෂය තුළ ලද ත්‍යාග සහ ප්‍රදාන | | | | | | | 1,170,254 | 1,170,254 |
| ත්‍යාග සහ ප්‍රදාන ක්‍රමක්ෂය | | | | | | | (42,297) | (42,297) |
| ආදායම් වෙත මාරු කිරීම් | | | | (94,530,894) | | | | (94,530,894) |
| කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල වෙත මාරු කිරීම | | | | | | | | - |
| UGC සංවර්ධන අරමුදල වෙත මාරු කිරීම | | | (60,000,000) | 60,000,000 | | | | - |
| 2018.12.30 දිනට ශේෂය | 205,192,250 | 42,297 | 11,749,985 | 69,770,158 | 509,313,767 | 30,031,067 | 1,127,957 | 827,227,482 |

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## මුල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

රු

| | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| ආදායම් | | | |
| රජයේ ප්‍රදාන | 19 | 2,386,682,655 | 1,992,731,010 |
| සංවර්ධන අරමුදල් දායකත්වය | | 80,023,316 | - |
| වෙනත් ආදායම් | 20 | 65,098,289 | 64,077,113 |
| | | | |
| මුලු ආදායම් | | **2,531,804,260** | **2,056,808,123** |
| | | | |
| වියදම් | | | |
| පඩිනඩි, වේතන, සහ සේවක සුභසාධන | 21 | 249,692,407 | 220,322,248 |
| සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ | 22 | 109,098,237 | 102,662,446 |
| ප්‍රදාන හා වෙනත් මාරුකිරීම් | 23 | 2,020,023,111 | 1,594,700,603 |
| ක්ෂය වෙන් කිරීම් හා ක්‍රමක්ෂය | 24 | 35,347,400 | 26,304,120 |
| පුනරුත්ථාපන වියදම් | 25 | 2,440,711 | 2,068,012 |
| වෙනත් වියදම් | 26 | 40,498,250 | 38,092,444 |
| මුළු වියදම් | | 2,457,100,115 | 1,984,149,873 |
| | | | |
| අතිරික්තය/(ඌනතාවය) | | 74,704,144 | 72,658,248 |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/A/UGC/FA/18 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019 මැයි 31 දින

04 JUN 2019

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :-

1. ලේකම් - නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | HED/A/UGC/FA/18 | මබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2019 මැයි 31 දින |

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) කොමිෂන් සභාවට අයත් රැස්කිරීමේ ගිණුමක (Collection Account) සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.1,609,500 ක ශේෂය හා සම්බන්ධිත ලැබීම් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) කොමිෂන් සභාවේ සංවර්ධන අරමුදලින් කාර්යසාධන ප්‍රකාශනයට සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස රු.80,023,316 ක් මාරුකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන වාර්තාවට අනුව තිබිය යුතු සත්‍ය ඌනතාවය වූ රු.5,319,171 ක් ගිණුම් මගින් අනාවරණය නොකර රු.74,704,144 ක අතිරික්තයක් නිරූපණය කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනය අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇතිබව.

2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල වන ලෙස ක්‍රියා කර ඇති බව.

2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සඳහන් නිරීක්ෂණයන් හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 08 හි 6.2.2 වගන්තිය ප්‍රකාරව වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ හදිසි ප්‍රසම්පාදනයන් හැර සෙසු ලංසු කැඳවීමේ අවම කාලසීමාව දින 07 ක් ලෙස දක්වා ඇත. එසේ වුවද කොමිෂන් සභාව රු.762,805 ක් වටිනා ලිපිද්‍රව්‍ය අවස්ථා 02 කදී මිලදී ගැනීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 08 හි 2.14.1 වගන්තිය ප්‍රකාරව රු.973,365 ක් වූ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් වෙනුවෙන් ප්‍රසිද්ධ ලංසු කැඳවීමකින් තොරව 2018 පෙබරවාරි 02 දින ආයතන 10 ක් වෙත අවස්ථා 03 කදී මිල කැඳවීම් ලිපි නිකුත් කර තිබුණි.

(ඇ) ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 08 හි 7.4.1 වගන්තිය ප්‍රකාරව අවශ්‍ය විධිමත් අනුමැතියක් ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් සැලසෙන පරිදි ලංසු ඇගයීම හැකිතාක් ඉක්මනින් සිදුකළ යුතු අතර ප්‍රසම්පාදන කාලසටහනේ සඳහන් කාලපරිච්ඡේදය ඇතුළත ලංසු ඇගයීමට ලක්කළ යුතුය. එසේ වුවද 2018/2019 වර්ෂය සඳහා පවිත්‍රතා සේවා සපයා ගැනීමට අදාළව කැඳවා තිබූ මිල ගණන් විවෘත කිරීම 2018 පෙබරවාරි 14 දින සිදුකර තිබුණ ද එසේ විවෘත කරන ලද මිල ගණන් ඇගයීමට ලක්කොට තාක්ෂණ ඇගයීම් කමිටු තීරණය ලබාදීමට දින 100 කට ආසන්න කාලයක් ප්‍රමාද කොට තිබුණි.

(ඈ) නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ පරිදි 2018/2019 වර්ෂයන්හි පවිත්‍රතා සේවා සපයා ගැනීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරවීම්, ලංසුකැඳවීම්, ලංසු විවෘත කිරීම්, ඇගයීමට ලක්කිරීම් යන ප්‍රසම්පාදන ක්‍රියාවලියේ

දුර්වලතා පැවති අතර සුදුසුකම් ලැබූ කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමට කටයුතු නොකිරීම නිසා රු.1,812,873 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) 2017 වර්ෂයේදී මිල ගණන් කැඳවා, සමාලෝචිත වර්ෂයේදී තාක්ෂණික ඇගයීම් කටයුතු සිදුකර පරිගනක මිලදී ගැනීමට කටයුතු කර තිබුණ ද ප්‍රසම්පාදන කමිටුව විසින් තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය සැලකිල්ලට නොගෙන එම කමිටුවේ සාමූහිකව එළඹි තීරණයකින් තොරව එක් සාමාජිකයෙකු ඉදිරිපත් කර තිබූ තාක්ෂණික ගැටළුවක් මත අවම ලංසුව ප්‍රතික්ෂේප කිරීමත්, ප්‍රසම්පාදන කමිටුව නැවත මිල ගණන් කැඳවීමට දී තිබූ නිර්දේශය ක්‍රියාත්මක නොකිරීමත් හේතුවෙන් පරිගනක 05 ක් මිලට ගැනීම වෙනුවට රු.මිලියන 1.2 ක් වැය කර මාස 10 ක් සඳහා කුලී පදනම මත පරිගනක ලබාගැනීම සිදුකර තිබුණි.

## 3. වෙනත් නිරීක්ෂණ

(අ) 2014/2015 අධ්‍යයන වර්ෂයට සාපේක්ෂව 2017/2018 අධ්‍යයන වර්ෂය තුළ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා අයදුම්කළ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම සඳහා තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 43.7 සිට සියයට 39 දක්වා පහළයාමක් නිරීක්ෂණය වූ අතර 2017/2018 අධ්‍යයන වර්ෂය තුළ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබූ සිසුන්ගෙන් විශ්වවිද්‍යාල සඳහා තෝරා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 19 ක් බව ද නිරීක්ෂණය විය. එසේම පසුගිය ආසන්න අධ්‍යයන වර්ෂ 03 කදී විශ්වවිද්‍යාලවලට වාර්ෂිකව ඇතුළත් කර ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ වෙනස්වීම 3,434 සිට 783 දක්වා පහළයාමක් පැවතුණි.

(ආ) විශ්වවිද්‍යාල සඳහා වාර්ෂිකව සිසුන් ඇතුළත් කිරීමේදී විවිධ පාඨමාලා සඳහා සුදුසුකම් ලබන සිසුන් එම පාඨමාලා යටතේ ලියාපදිංචි නොවීම, වෙනත් පාඨමාලාවලට මාරුවීම, වෙනත් රජයේ උසස් අධ්‍යාපන ආයතනවල පාඨමාලා හැදෑරීම නිසා ලියාපදිංචිය අවලංගු කර ගැනීම සහ තවදුරටත් පුරප්පාඩු පිරවීමට කටයුතු නොකරන ලෙස විශ්වවිද්‍යාලවලින් දැනුම්දීම යන හේතූන් මත 2017/2018 ආසන්නම අධ්‍යයන වර්ෂයේදී සහ පසුගිය අධ්‍යයන වර්ෂ 03 කදී පුරප්පාඩු පැවතුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ පුරප්පාඩු 897 ක් ද පසුගිය අධ්‍යයන වර්ෂ 03ක පිළිවෙළින් 738 ක් 2,226 ක් හා 1,455 ක් වශයෙන් පුරප්පාඩු පැවතුණි.

(ඇ) 2011 ජනවාරි 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දේශීය විශ්වවිද්‍යාල සඳහා විදේශ සුදුසුකම් සහිත සිසුන් ඇතුළත් කර ගැනීමේදී යෝජිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 0.5 ක සිසුන් බඳවා ගැනීමට කටයුතු කළ හැකි අතර ඒ අනුව ආසන්න වර්ෂ 05

ක යෝජිත හා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සැලකීමේදී යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බඳවාගත් ප්‍රතිශතය 09 ත් 50 ත් අතර පරාසයක පැවතුණි.

(ඈ) යෝජිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 4.5 ක් මුදල් ගෙවීමේ පදනම මත විදේශ සිසුන් දේශීය විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත හැකි වුවත් 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බඳවා ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 1,377 ක් වුවත් එයින් සියයට 0.9 ක් පමණක් බඳවා ගැනීමට කටයුතු කර තිබුණි.

(ඉ) 2012 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබූ ප්‍රවේශ ප්‍රතිපත්තියට පරිබාහිරව රාජ්‍ය විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 13 කට අදාළව පවත්වා ගෙන යනු ලබන පාඨමාලා 25 ක් වෙනුවෙන්, දීප ව්‍යාප්තව පවත්වනු ලබන උසස් පෙළ විභාගයේ ප්‍රතිඵලවලට අමතරව යෝග්‍යතා පරීක්ෂණයේ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල වෙත සිසුන් ඇතුළත් කිරීමට කටයුතු කිරීම ආරම්භ කර තිබුණි. එම ප්‍රතිපත්තිය කැලණිය විශ්වවිද්‍යාලයේ කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාව සඳහා ක්‍රියාත්මක කිරීම නිසා එම පාඨමාලාව සඳහා තෝරා ගත් සිසුන්ගේ "Z" අගයට වඩා වැඩි "Z" අගයක් ලබා ගත් සිසුන් යෝග්‍යතා පරීක්ෂණයේ ලකුණු 70 -82 ත් අතර පරාසයේ සිටිය ද එවැනි සිසුන් 09 දෙනෙකුට මෙම පාඨමාලාව සඳහා ඇතුළත්වීමට අවස්ථාව අහිමි වී තිබුණි.

(ඊ) 2014/2015 අධ්‍යයන වර්ෂයේදී පළමුවරට අන්තර්ජාලය හරහා මෙන්ම සාමාන්‍ය ක්‍රමය යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට අවස්ථාව සලසා දී තිබුණි. 2017/2018 අධ්‍යයන වර්ෂයේදී මෙම මාර්ගගත පද්ධතිය වෙනුවෙන් වර්ෂය අවසානය දක්වා රු.9,347,750 ක් හා සමාලෝචිත වර්ෂයේ සිට රු.700,000 ක නඩත්තු වියදම් දරා තිබුණි.එසේ තිබියදී සාමාන්‍ය ක්‍රමය සහ මාර්ගගත පද්ධතිය යන දෙකම ක්‍රියාත්මක වූ 2015/2016 අධ්‍යයන වර්ෂයේ සිසුන් ලියාපදිංචි කිරීමේදී සිසුන්ගෙන් ඉදිරිපත්ව තිබූ ගැටළු සංඛ්‍යාව 1081 සිට 2018/2019 අධ්‍යයන වර්ෂය වනවිට එය 5602 දක්වා වැඩිවී තිබුණි.

(උ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දැනුවත් වී තිබුණු නමුත්, එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක ළඟාවීමේ වැඩ පිළිවෙළ සැලසුම්වලට ඇතුළත් කර එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර ඇති බව අනාවරණය නොවීය

(ඌ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවත්වාගෙන යනු ලබන එකතුව රු.මිලියන 39.2 ක් වූ අරමුදල් ශේෂ වර්ෂ කිහිපයක සිට අක්‍රියව පැවතුණි.

(එ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වූ එකතුව රු.මිලියන 68.8 ක් වූ අරමුදල් 21 කින් ආයෝජනය කර තිබූ මුදල රු.මිලියන 34.12 ක් පමණක් විය. ඒ අනුව එම අරමුදල් වටිනාකමින් රු.මිලියන 34.17 ක් හෙවත් සියයට 49 ක් ඵලදායිලෙස ආයෝජනය කර නොතිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න

විගණකාධිපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු | | | |
| (අ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් රැස්කිරීමේ ගිණුමක (Collection Account) සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.1,609,500/- ක ශේෂය හා සම්බන්ධිත ලැබීම් ගිණුම්ගත කර නොතිබුණි | සභාවේ අය කිරීම් ගිණුමක් වන මෙම ගිණුමේ ශේෂය සෑම මසකම අවසාන දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 2323284 දරණ ජංගම ගිණුමට මාරු කරනු ලැබේ. එහෙත්, මෙසේ මුදල් මාරු කිරීමේ දී 2018.12.31 දිනට අවසාන බැංකු ශේෂය මාරු වී ඇත්තේ 2019.01:01 දින වන විට වේ. ඒ අනුව අදාළ මුදල් 2019.01.01 දිනට ගිණුම් ගත කර ඇත. | ගිණුම් කාල පරිච්ඡේදයට අදාළ සියළු ගිණුම් ශේෂ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කළ යුතු වේ. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අය කිරීමේ ගිණුමෙහි (Collection Account) මුදල් වර්ෂය අවසාන දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පොදු ගිණුම වෙත මාරු කිරීම සඳහා පියවර ගෙන ඇත. |
| (ආ)කොමිෂන් සභාවේ සංවර්ධන අරමුදලින් කාර්යසාධන ප්‍රකාශනයට සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස රු.80,023,316/- ක් මාරුකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන වාර්ථාවේ සත්‍ය ඌනතාවය වූ රු.5,319,171/- ක් ගිණුම් මගින් අනාවරණය නොකර රු. 74,704,144/- ක අතිරික්තයක් නිරූපණය කර තිබුණි. | 1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනතේ අංක 10 (1) වගන්තිය අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව උපයන ආදායම් මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සංවර්ධන අරමුදල පිහිටුවා ඇති අතර විශ්වවිද්‍යාල පනතෙන් පැවරී තිබෙන කාර්යභාර කරගෙන යෑම සඳහා රජයේ අරමුදල් ප්‍රමාණවත් නොවන විට, එම අරමුදල කොමිෂන් සභාවේ අනුමැතිය මත භාවිතා කරනු ලැබේ. ඒ සඳහා විශ්වවිද්‍යාල පනතේ අංක 10 (3) වගන්තිය හා මුදල් අමාත්‍යාංශයේ 2004.04.30 වන දිනැති ලිපිය මගින් කොමිෂන් සභාව වෙත බලතල පැවරී ඇත. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය මගින් වර්ෂයට අදාළ පුනරාවර්තන ආදායම් හා වියදම් පමණක් හඳුනා ගත යුතු අතර ඒ අනුව ඇති වන අතිරික්තය හෝ ඌනතාවය අනාවරණය කළ යුතුය. | 1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනතේ අංක 10 (1) වගන්තිය අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සංවර්ධන අරමුදල පිහිටුවා ඇති අතර අංක 2016/04 දරණ 01.03.2016 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛය අනුව එම අරමුදලට ආදායම් බැර කරනු ලැබේ.<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2018 වසරේ වියදම් පියවීම සඳහා රාජ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් එම සංවර්ධන වැය ශීර්ෂයන් රු. මිලියන 80 ක මුදලක් භාවිතා කරන ලදී.<br><br>එහෙත් විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති පරිදි ඉදිරි වර්ෂයේ දී වර්ෂයට අදාළ ඌනතාවය මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය මගින් පිළිඹිබු වන ලෙස 2016/04 දරන කොමිෂන් සභා චක්‍රලේඛන ප්‍රතිපාදන සංශෝධනය කරනු ලැබේ. |

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| **2.මූල්‍ය සමාලෝචනය**<br><br>**2.1 මූල්‍ය ප්‍රතිඵල**<br><br>සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.74,704,144/- ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.72,658,248/- ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,045,896/- ක වර්ධනයක් විය. මෙම වර්ධනයට සංවර්ධන අරමුදලින් සාවද්‍ය ලෙස මාරු කරන ලද රු.80,023,316/- ක් ආදායමට ගෙන තිබීම හා ප්‍රදාන හා වෙනත් හුවමාරු ගෙවීම් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. | වර්ෂයට අනුමත ප්‍රතිපාදන අනුව මහාභාණ්ඩාගාරයෙන් මුදල් නිදහස් නොකරන ලද බැවින් සංවර්ධන අරමුදලින් රු. 80,023,316/- ආදායමට ගන්නා ලදී. එය 1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනතට හා දැනට තිබෙන 2016/04 චක්‍රලේඛන ප්‍රතිපාදන වලට යටත්ව කොමිෂන් සභා අනුමැතිය යටතේ සිදු කර ඇත. | — | 1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනතේ අංක 10 (1) වගන්තිය අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සංවර්ධන අරමුදල පිහිටුවා ඇති අතර අංක 2016/04 දරණ 01.03.2016 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛය අනුව එම අරමුදලට ආදායම් බැර කරනු ලැබේ.<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2018 වසරේ වියදම් පියවීම සඳහා රාජ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් එම සංවර්ධන වැය ශීර්ෂයන් රු. මිලියන 80 ක මුදලක් භාවිතා කරන ලදී.<br><br>එහෙත් විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති පරිදි ඉදිරි වර්ෂයේ දී වර්ෂයට අදාළ ඌනතාවය මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය මගින් පිළිබිඹු වන ලෙස 2016/04 දරන කොමිෂන් සභා චක්‍රලේඛන ප්‍රතිපාදන සංශෝධනය කරනු ලැබේ. |
| **2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**<br><br>සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම වූ රු.2,457,100,115 පෙර වර්ෂයේ මෙහෙයුම් වියදම වූ රු.1,984,149,873 සමඟ සැසඳීමේදී රු.472,950,242 ක් හෙවත් සියයට 23 ක ඉහළයාමක් නිරීක්ෂණය විය. මෙසේ වියදමේ ඉහළ යාමට මහපොළ ශිෂ්‍යාධාර වියදම රු. 410,512,250/- කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | එකඟ වේ. | — | |
| **2.3 අනුපාත විශ්ලේෂණය**<br><br>සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 2.07:1 ක් වූ අතර පසුගිය වර්ෂය හා සැසඳීමේදී සියයට 40 ක පහළයාමක් නිරීක්ෂණය විය. | එකඟ වේ. | — | |

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| 3.මෙහෙයුම් සමාලෝචනය<br>3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා | | | |
| (අ)2017/2018 අධ්‍යයන වර්ෂය තුල විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලත් සිසුන්ගෙන් විශ්වවිද්‍යාලවලට ඇතුලත් කිරීම සඳහා තෝරා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 18 ක් වූ අතර පසුගිය අධ්‍යයන වර්ෂ 03 කදී විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 3,434 සිට 118 දක්වා අඩු මට්ටමක පැවතුණි. මේ අනුව අධ්‍යයනය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන්ගේ වැඩි වීමට සාපේක්ෂව විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාවේ අඩු වීමක් දක්නට තිබුණි. | 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා තෝරා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 2016/2017 අධ්‍යයන වර්ෂයට සාපේක්ෂව 118 කින් අඩු වී ඇති ලෙස සටහන් වීම වෙනුවට 783 කින් වැඩි වී ඇති ලෙස නිවැරදි විය යුතුය.<br>එමෙන්ම, 2017/2018 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලත් සිසුන්ගෙන් විශ්වවිද්‍යාලවලට ඇතුලත් කිරීම සඳහා තෝරා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 18 ලෙස සඳහන්ව ඇති ප්‍රමාණය සියයට 19 ලෙස නිවැරදි විය යුතුය.<br>2017/2018 වර්ෂයේදී 2016/2017 වර්ෂයට (17,106) සාපේක්ෂව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වැඩි සිසුන් ප්‍රමාණයක් ඉල්ලුම් කර ඇති නිසා 2017/2018 (78,894) වර්ෂයේදී එම ප්‍රතිශතය අඩුවී ඇති ලෙස පෙන්නුම් කරයි. | රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුලත් කර ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව පෙර වර්ෂයේ ඇතුළත් කර ගත් ප්‍රමාණයේ වැඩි වීමට සාපේක්ෂව වැඩි ප්‍රමාණයකින් ඉහළ දැමීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | 2017/2018 අධ්‍යයන වර්ෂයේදි තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව ඊට පෙර වර්ෂයට (2016/2017) වඩා 783 ක ප්‍රමාණයකින් වැඩිකර තිබුණි. විශ්වවිද්‍යාල සඳහා තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස ගත් කල එම වැඩිවීම (2017/2018 – 19.28%) පසුගිය වර්ෂයට වඩා වැඩිය (2016/2017 – 19.11%). නව පාඨමාල හඳුන්වාදීම සහ දැනට පවතින පාඨමාලාවක ශිෂ්‍යයන් ප්‍රමාණය වැඩිකිරීම ඒ සඳහා ඇති සම්පත් වල ප්‍රමාණාත්මක බව හා රැකියා අවස්ථා සඳහා වන විභවය ආදී කරුණු පදනම් කරගෙන විශ්වවිද්‍යාල විසින් සිදුකල යුතුය. |
| (ආ)විශ්වවිද්‍යාල සඳහා වාර්ෂිකව සිසුන් අතුළත් කිරීමේ දී විවිධ පාඨමාලා සඳහා සුදුසුකම් ලබන සිසුන් එම පාඨමාලා යටතේ ලියාපදිංචි නොවීම, ලියාපදිංචි වූ සිසුන් වෙනත් පාඨමාලා වලට මාරුවීම, වෙනත් රජයේ උසස් අධ්‍යාපන ආයතනවල පාඨමාලා හැදෑරීම නිසා ලියාපදිංචිය අවලංගු කර ගැනීම සහ තවදුරටත් පුරප්පාඩු පිරවීමට කටයුතු නොකරන ලෙස විශ්වවිද්‍යාලවලින් දැනුම් දීම යන හේතුන් මත 2017/2018 ආසන්නම අධ්‍යයන වර්ෂයේ දී පුරප්පාඩු 897 ක් සහ 2014/2015, 2015/2016, 2016/2017 යන අධ්‍යයන වර්ෂ 03කදී පිළිවෙලින් 738 ක් 2226 ක් හා 1455 ක් වශයෙන් පුරප්පාඩු පැවතුණි. | 2017/2018 අධ්‍යයන වර්ෂයේදී සාමාන්‍ය ප්‍රවේශය සහ පුරප්පාඩු පිරවීම් වට අටක් වශයෙන් වට නවයක් (09) ක්‍රියාත්මක කර ඇත.<br>පුරප්පාඩු පිරවීම් වටවල දී පවතින පුරප්පාඩු මුළු ප්‍රමාණයටමසිසුන් තේරීම සිදු කරන නමුත්, එසේ තේරීපත්වන සමහර සිසුන් නොයෙකුත් හේතු නිසා තේරීපත් වූ පාඨමාලාවල ලියාපදිංචි නොවෙති. | විශ්වවිද්‍යාලවල පවත්වා ගෙන යනු ලබන අධ්‍යයන පාඨමාලා රැකියා වෙළඳපල අවශ්‍යතාවයට ඉලක්ක වන පරිදි සංශෝධනය කළ යුතු අතර රාජ්‍ය විශ්වවිද්‍යාල හැරයාම, ශිෂ්‍යයින් ලියාපදිංචි නොවී සිටීම යනාදිය අවම කිරීමට හැකි වන පරිදි ප්‍රමාදයකින් තොරව උසස් පෙළ ප්‍රතිඵල හා විශ්වවිද්‍යාල ප්‍රවේශ කඩඉම් ලකුණු නිකුත් කිරීමට කටයුතු කල යුතුය. | 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 2016/2017අධ්‍යයන වර්ෂයට සාපේක්ෂව 118 ප්‍රමාණයකින් අඩු වී ඇති ලෙස සටහන් වීම වෙනුවට 783 ප්‍රමාණයකින් වැඩි වී ඇති ලෙස නිවැරදි විය යුතුය.<br>එමෙන්ම, 2017/2018 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම්ලත් සිසුන්ගෙන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම සඳහා තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 18 ලෙස සඳහන්ව ඇති ප්‍රමාණය සියයට 19 ලෙස නිවැරදි විය යුතුය. |

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| (ඇ) 2011 ජනවාරි 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව දේශීය විශ්වවිද්‍යාල සඳහා විදේශී සුදුසුකම් සහිත සිසුන් යෝජිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 0.5 ක සිසුන් බඳවා ගැනීමට හැකි වුවද පසුගිය වර්ෂ 05 ක කාලය තුළදී යෝජිත හා බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව සැලකීමේදී යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 09 ත් සියයට 50 ත් අතර පරාසයක පැවතුණි. | ඇතැම් පාඨමාලා සඳහා යෝජිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා තෝරා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීම සඳහා අයදුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීම, බොහෝමයක් පාඨමාලාවලට කිසිදු අයදුම්පත්‍රයක් නොලැබීම, අවම සුදුසුකම් සපුරා නොමැති සිසුන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදු වීම, තේරීම් කමිටු සහ අදාළ පීඨමණ්ඩල සෑහීමකට පත්වන ප්‍රතිඵල අයදුකරුවන් විසින් ලබා නොගැනීම නිසා අයදුම්පත් ප්‍රතික්ෂේප වීම සහ යෝජිත මුළු ස්ථාන සංඛ්‍යාවට ඇතුළත් වන කොළඹ නගරයෙන් පිටත පිහිටි විශ්වවිද්‍යාලවලට ප්‍රවේශය ලැබීමට විදේශීය සුදුසුකම්ලත් සිසුන් කැමැත්ත නොදැක්වීම යනාදි කරුණු හේතු විය. | විදේශීය සිසුන් සඳහා වෙන් කර ඇති සියයට 0.5 සඳහා සිසුන් බඳවා ගැනීමෙන් පසු තවදුරටත් පවතින පුරප්පාඩු සඳහා දේශීය සිසුන්ට ඇතුළත් වීමට අවස්ථාව ලබා දිය යුතුය. | විදේශ සිසුන් සඳහා වෙන්කර ඇති 0.5% පංගුවෙන්, විදේශ සිසුන් බඳවාගෙන තවදුරටත් පවතින පුරප්පාඩු සඳහා දේශීය සිසුන්ගෙන් පිරවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත. |
| (ඈ)2012 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල වලට සිසුන් ඇතුළත් කිරීමේ අනුමැතිය ලබා දී තිබූ විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තියට පරිබාහිරව කොමිෂන් සභාවේ තීරණයක් මත රාජ්‍ය විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 13 ක පවත්වා ගෙන යනු ලබන පාඨමාලා 25 ක් වෙනුවෙන්, උසස් පෙළ විභාගයේ ප්‍රතිඵලවලට අමතරව යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වා එම ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල වෙත සිසුන් ඇතුළත් කිරීමට කටයුතු කිරීම ආරම්භ කර තිබුණි. එම ප්‍රතිපත්තිය කැළණි විශ්වවිද්‍යාලයේ කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාව සඳහා ක්‍රියාත්මක කිරීම නිසා එම පාඨමාලාව සඳහා තෝරා ගත් අයගේ "Z" අගයට වඩා වැඩි "Z" අගයක් ලබා ගත් සිසුන් යෝග්‍යතා පරීක්ෂණයේ ලකුණු 70 – 82 අතර පරාසයේ සිටිය ද එවැනි සිසුන් 09 දෙනෙකුට මෙම පාඨමාලාව සඳහා ඇතුළත්වීමට අවස්ථාව අහිමි වී තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමන් විසින් කරන ලද ඉල්ලීමට පිළිතුරු වශයෙන් කැළණි විශ්වවිද්‍යාලය 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා පවත්වන ලද කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාවෙහි ශිෂ්‍ය ලැයිස්තුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලබා දෙන ලදී. ඒ අනුව, එම ලැයිස්තුවෙහි සඳහන් සිසුන්ගේ Z ලකුණු අනුපිළිවෙල, ඔවුන් පාඨමාලා සඳහා දක්වා ඇති කැමැත්තේ අනුපිළිවෙල සහ එක් එක් දිස්ත්‍රික්කයෙන් කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාව සඳහා වෙන් කර ඇති ස්ථාන සංඛ්‍යාව අනුව 2017/2018 අධ්‍යයන වර්ෂයේ කැළණි විශ්වවිද්‍යාලයෙහි කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාව සඳහා සිසුන් තෝරා ගැනීම සිදු කරන ලදී.<br>කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාවෙහි ප්‍රායෝගික/යෝග්‍යතා පරීක්ෂණයෙන් ලකුණු 70% හෝ ඊට වැඩියෙන් ලබා ගත් සිසුන් පමණක් පරීක්ෂණය සමත් සිසුන් වශයෙන් සලකා බලන ලෙස කැළණි විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත සෘජු දැනුම් දීමක් කර නොතිබූ හෙයින්ද, 2018 අගෝස්තු මස 9 වන දින පැවති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 992 වන සභා වාරයේදී 2017/2018 අධ්‍යයන වර්ෂයේ කැළණි විශ්වවිද්‍යාලයෙහි කථන හා ශ්‍රවණ විද්‍යා පාඨමාලාව සඳහා තෝරා ගත් සියළුම සිසුන්ට එම පාඨමාලාව හැදෑරීමට අවසර දෙන ලදී. | දීප ව්‍යාප්තව පවත්වන අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් ලබා ගන්නා ප්‍රතිඵල සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගත යුතුය. | විශ්වවිද්‍යාල විසින් වෙන් වෙන් වශයෙන් පවත්වනු ලබන යෝග්‍යතා / ප්‍රායෝගික පරීක්ෂණ නොපවත්වා දීප ව්‍යාප්තව පවත්වනු ලබන අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් ලබා ගනු ලබන Z අගය මත 2019/2020 අධ්‍යයන වර්ෂයේ සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තේරීමට විශ්වවිද්‍යාල ප්‍රවේශ කමිටුවේ නිර්දේශය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත. ඉහත තීරණය මෙම වාර්තාවේ අංක 3.4.1 (ඇ) යටතේ දක්වා ඇති නිර්දේශයට අනුකූල වේ. |

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරීත්වය |
|---|---|---|---|
| (ඉ) අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කිරීමේ ක්‍රමවේදය ආරම්භ වූ 2014/2015 අධ්‍යයන වර්ෂයේදී අන්තර්ජාලය හරහා මෙන්ම සාමාන්‍ය ක්‍රමය යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට අවස්ථාව සලසා තිබුණි. එසේ වුවද 2017/2018 අධ්‍යයන වර්ෂය වන විට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් යොමු කිරීමට මෙන් ම තෝරිපත් වූ පාඨමාලා සහ විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාලය හරහා ලියාපදිංචි වීම ද අනිවාර්ය අවශ්‍යතාවක් බවට පත්කොට ඇත.මෙම පද්ධතිය සඳහා සමාලෝචිත වර්ෂය දක්වා රු. 9,347,750 ක් වැය කර තිබූ අතර 2018 වර්ෂයේ සිට වසරකට රු. 700,000 ක නඩත්තු වියදමක් වැය කිරීමට සිදුව තිබෙන බව නිරීක්ෂණය විය.මෙම ක්‍රමවේදය යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේ දී 2015/2016 අධ්‍යයන වර්ෂයේ දී 1081 ක්ව පැවති හැටළු ප්‍රමාණය2018/2019 අධ්‍යයන වර්ෂය වන විට 5602ක් දක්වා වැඩි වී තිබුණි. | අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීම සඳහා 2014/2015 අධ්‍යයන වර්ෂයට වඩා 2015/2016 අධ්‍යයන වර්ෂයේදී ප්‍රවණතාවක් සිසුන් විසින් දක්වා තිබූ නිසා ඒ තත්වය සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් කැඳවීම අන්තර්ජාලය හරහා පමණක් සිදු කිරීමට තීරණය කරන ලදී.<br><br>2015/2016 අධ්‍යයන වර්ෂයේ සිට සිසුන් විශ්වවිද්‍යාල සඳහා ලියාපදිංචි කර ගැනීමේ කටයුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අන්තර්ජාලය හරහා පමණක් සිදු කරන ලදී. එහි දී සිසුන් පාඨමාලාවන්හි ලියාපදිංචි නොවීමෙන් සිදුවන පුරප්පාඩු ඉතා ඉක්මනින් ලබා ගත හැකි වූ අතර එමගින් පුරප්පාඩු ඉතා ඉක්මනින් වරවීමට හැකි විය. | මාර්ගගත පද්ධතිය භාවිතා කරමින් අන්තර්ජාලය හරහා විශ්වවිද්‍යාල ප්‍රවේශය අයදුම් කිරීමේදී අයදුම්කරුවන් මුහුණ දෙන ගැටළු අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මාර්ගගත පද්ධතිය හරහා අයදුම් කිරීමේදී ඇතිවන තාක්ෂණික ගැටළු අවම කිරීමට සහ දුරකථන පද්ධතිය වැඩිදියුණු කිරීමට කටයුතු සිදුකරමින් පවතී. |
| **3.2 අරමුදල් ඌන උපයෝජනය**<br><br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවත්වාගෙන යනු ලබන එකතුව රු. මිලියන 39.2 ක් වූ අරමුදල් ශේෂ වර්ෂ කිහිපයක සිට අක්‍රියව පැවතුණි. | පර්යේෂණ අරමුදල් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.<br><br>* ත්‍යාග අරමුදල යටතේ ශිෂ්‍යත්ව පිරිනමන අරමුදල් 14ක් ඇත. 2018 වර්ෂය තුල දී ඒ යටතේ ශිෂ්‍යත්ව 30ක් පිරිනමා ඇති අතර අධ්‍යයන අංශය විසින් තව දුරටත් ශිෂ්‍යත්ව ලබා දීම සඳහා විශ්වවිද්‍යාලය ශිෂ්‍යයන්ගෙන් අයදුම්පත් කැඳවා ඇත. | අරමුදලට අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | • ත්‍යාග අරමුදල්<br><br>අධ්‍යයන අංශය විසින් මේ වන විට පහත සඳහන් පරිත්‍යාග ශිෂ්‍යත්ව අරමුදල් ලබා දීම සඳහා අවශ්‍යය අයදුම්පත් 2016/2017 අධ්‍යයන වර්ෂයට අදාළව කැඳවන ලදී.<br><br>1. UGC Scholarship Fund<br>2. Kathalin Doris Weerasuriya Scholarship Fund<br>3. Sri Lanka America Society Scholarship Fund<br>4. Nalini Madugalle Scholarship Fund<br>5. Magee Mendis Scholarship Fund |

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | යොජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| | *මධ්‍යම පර්යේෂණ අරමුදල වර්ෂ කිහිපයක සිට ම අක්‍රියව පැවති බැවින් 2018.04.05 දින පැවති 984 වන සභා වාරයේ දී එහි ශේෂය පශ්චාත් උපාධි හැදෑරීම වෙනුවෙන් මූල්‍ය ආධාර ලබා දෙන වැය ශීර්ෂයට මාරු කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.<br><br>*සුනාමි අරමුදල පිහිටු වන ලද අතර එම ශිෂ්‍යත්ව පිරිනැමී ම මේ වන විට අවසන් වී ඇත. ඒ අනුව 2018.07.12 වන දින පැවති 990 වන සභා වාරයේ දී මෙම අරමුදලෙහි ශේෂය විශ්වවිද්‍යාලය ශිෂ්‍යත්ව අරමුදලට මාරු කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. | | • එම අයදුම්පත් අතුරින් UGC Scholarship Fund ශිෂ්‍යත්ව අරමුදල යටතේ ශිෂ්‍යත්ව ලාභීන් 14 දෙනෙකුට අධ්‍යයන කාල සීමාව සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමට 2019.09.18 දින පැවති 1018 වන කොමිෂන් සභා සැසිවාරයේ දී තීරණය කරන ලදී.<br><br>මෙයට අමතරව 2017/2018 වර්ෂයට අදාළව UGC Scholarship Fund ශිෂ්‍යත්ව අරමුදල යටතේද, 2016/2017 අධ්‍යයන වර්ෂයට අදාළව Police C.W.C. Benefits Scheme ශිෂ්‍යත්ව අරමුදල යටතේද, 2019 අගෝස්තු මස 01වන දින සිට 2020 ජූලි මස 31 වන දින දක්වා වූ අධ්‍යයන කාලයට අදාළව Mitsubishi Corporation International Scholarship Fund ශිෂ්‍යත්ව අරමුදල යටතේද අයදුම්පත් කැඳවා ඇත.<br><br>• පර්යේෂණ අරමුදල්<br><br>කොමිෂන් සභා තීරණ 984.3.2. අනුව මෙම ශේෂය 2019 වර්ෂය තුල දී පශ්චාත් උපාධි වැය ශීර්ෂය (Doctoral Projects) වෙත මාරු කර ඇත.<br><br>• සුනාමි අරමුදල<br>කොමිෂන් සභා තීරණ 990.3.2. අනුව මෙම අරමුදලේ ශේෂය UGC ශිෂ්‍යත්ව අරමුදල වෙත මාරු කර ඇත. |

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| (ආ)අරමුදල් ගිණුම් 20 ක එකතුව රු.මිලියන 33.6 ක් ඌන උපයෝජිතව පැවතුණි. | Central Research අරමුදලෙහි ශේෂය 2018 වර්ෂයේ දී පශ්චාත් උපාධි ලබා දෙන වැය ශීර්ෂයට මාරු කිරීමට කොමිෂන් සභා අනුමැතිය ලබා දෙන ලදී. එබැවින් එම අරමුදලෙහි ශේෂය ආයෝජනය නොකල අතර ස්ථාවර තැන්පතුව 2019.01.17 දින කල් පිරුණු පසු එම වැය ශීර්ෂයට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ.<br>Bond Violation අරමුදලෙහි ශේෂයෙන් 90% ක මුදලක් ආයෝජනය කොට ඇත.<br>Flood Relief අරමුදල ගංවතුර සහ නාය යෑම් වැනි ස්වභාවික ආපදා සඳහා දෙන ලද අරමුදල් ආපසු ගෙවන වාරිකවල එකතුව වේ. මේ පිළිබඳව මහා භාණ්ඩාගාරයෙන් විමසීමෙන් පසු ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ.<br>දැනට මෙම මුදල් දෛනිකව Overnight Investment ලෙස ආයෝජනය කරනු ලැබේ.<br>ජාතික විද්‍යා පදනම සමඟ ඒකාබද්ධව UNESCO ආයතනය විසින් සකස් කොට ඇති මාර්ගෝපදේශයන්ට අනුව උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සම්බන්ධව දර්ශකයන් සකස් කිරීම සඳහා National Science Fund පිහිටුවා ඇත. මෙය ජාතික විද්‍යා පදනම සමඟ එක්ව කරන ව්‍යාපෘතියක් බැවින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එහි මුදල් ආයෝජනය කරනු නොලැබේ. | අරමුදලේ ඇති ශේෂයන් අදාළ අරමුණු වෙනුවෙන් යෙදවීමට ක්‍රියා කළ යුතුය. | මෙම අරමුදල් ඇමුණුම 01 හි දක්වා ඇති පරිදි ආයෝජනය /උපයෝජනය කර ඇත. |

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| 3.3 ප්‍රසම්පාදන කළමණාකරනය | | | |
| (අ) ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 08 හි 6.2.2. වගන්තිය ප්‍රකාරව වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ හදිසි ප්‍රසම්පාදනයන් හැර සෙසු ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 07ක් ලෙස දක්වා ඇත.එසේ වුවද කොමිෂන් සභාව රු. 762,805 ක් වටිනා ලිපි ද්‍රව්‍ය අවස්ථා දෙකක දී මිලදී ගැනීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි | 2018.06.25 දාතමින් ලිපි ද්‍රව්‍ය (A 4 කඩදාසි) මිලදී ගැනීම සිදු කරනු ලැබුවේ 2018.06.21 දාතමින් රේඛීය අමාත්‍යාංශය මඟින් වාර්ෂික වාර්තාව සහ ගිණුම් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට සූදානම්ව තබන ලෙස කරන ලද ලිඛිත දැනුම් දීම මත එම වාර්තාවල පිටපත් සකස් කර තැබීම සඳහාය. මෙම කටයුත්ත හදිසි අවශ්‍යතාවයක් වූ බැවින් ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටුවල ලියාපදිංචි සැපයුම්කරුවන් තුන්දෙනෙකුගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් ලබා ගෙන මෙම කාර්යය ඉටු කරන ලදී. 2018.10.03 දාතමින් ලිපි ද්‍රව්‍ය (A 4 කඩදාසි) මිලදී ගැනීම සිදු කරනු ලැබුවේ අප ආයතනය යටතේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමානතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය විසින් පවත්වා ගෙන යන " Study on ragging and sexual and Gender based on violence in the Sri Lankan University System" ව්‍යාපෘතියේ මූල්‍ය දායකත්වය ලබා දුන් යුනිසෙෆ් ආයතනයේ දැනුම් දීම මත මුල්‍යමය පියවීමේ කටයුතු 2018 ඔක්තෝම්බර් 09 දිනට ප්‍රථමයෙන් සිදු කළ යුතු බැවිනි. | හදිසි කටයුතු සඳහා භාවිතා කිරීමට අවශ්‍ය වන තොග මට්ටම පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. | හැමවිටම හදිසි මිල දී ගැනීම් අවම කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රශස්ථ තොග මට්ටම පවත්වා ගෙන යාමට කටයුතු කළ ද ඇතැම් විශේෂිත අධ්‍යාපනික වැඩමුළු අධ්‍යාපනික වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ දී හදිසි මිල දී ගැනීම් කිරීමට සිදුවිය. මෙම තත්ත්වය තව දුරටත් අඩු කර ගැනීමට කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| (ආ)ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 08 හි 2.14.1 වගන්තිය ප්‍රකාරව රු.500,000කට වඩා වැඩි වටිනාකමකින් යුතු භාණ්ඩ මිල දී ගැනීම වෙනුවෙන් වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ ප්‍රදේශීය ප්‍රසම්පාදන කමිටුවක් හරහා ප්‍රසිද්ධ ලංසු විවෘත කිරීමක් සිදුකර 05 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවීමක් මඟින් සිදු කළ යුතුය.එසේ වුවද රු. 973,365ක් වූ ලිපිද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් ප්‍රසිද්ධ ලංසු කැඳවීමකින් තොරව 2018 පෙබරවාරි 02 වන දින අවස්ථා 03කදී ආයතන 10ක් වෙත මිල කැඳවීම් ලිපි නිකුත්කර තිබුණි. | විගණන වාර්තාවේ දක්වා ඇති රු.973,365 ක් වටිනා ලිපි ද්‍රව්‍ය මිල දී ගැනීම අවස්ථා 03කදී වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ මුද්‍රා තබන ලද මිල ගණන් ලබාගෙන ප්‍රසම්පාදන අත්පොතේ අතිරේක 34 ප්‍රකාශනයේ අධිකාරී සීමාවන්ට යටත්ව මෙම කාර්යය ඉටු කරන ලද කාර්යයන්ය. මෙහිදී මෙම ප්‍රසම්පාදන කාර්ය සඳහා ආයතන 10ක් වෙත මිල ගණන් කැඳවීම යවා ආයතන 08කින් මුද්‍රා තැබූ මිල ගණන් ලැබී ඇත.මෙහිදී අදාළ මිලදී ගැනීම් හැමවිටම සිදු කර ඇත්තේ අවම මිල ගණන් සැපයුම් කරුවන්ගෙනි. මෙම ප්‍රසම්පාදන කාර්යයන් තුනක් ලෙස අදාළ අධිකාරී සීමාවන් තුල අදාළ අනුමැතීන් යටතේ සිදු කර ඇත. | එකම වර්ගයේ ප්‍රසම්පාදනයන් සිදු කිරීමේ දී වෙන් වෙන්ව ලංසු කැඳවීමට කටයුතු කිරීමකින් තොරව එකම ප්‍රසම්පාදන කටයුත්තක් සේ සලකා කටයුතු කළ යුතුය. | විගණකාධිපති වාර්තා මඟින් පෙන්වා දී ඇති පරිදි එකම වර්ගයේ ප්‍රසම්පාදනයන් සිදු කිරීමේ දී එකම කටයුත්තක් සේ සලකා ප්‍රසම්පාදන කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. |

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| (ඇ)ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 08 හි 7.4.1 වගන්තිය ප්‍රකාරව අවශ්‍ය විධිමත් අනුමැතියක් ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් සැලසෙන පරිදි ලංසු ඇගයීම හැකිතාක් ඉක්මනින් සිදුකළ යුතු අතර ප්‍රසම්පාදන කාලසටහනේ සඳහන් කාලපරිච්ඡේදය ඇතුළත ලංසු ඇගයීමට ලක්කළ යුතුය. එසේ වුවද 2018/2019 වර්ෂය සඳහා පවිත්‍රතා සේවා සපයා ගැනීමට අදාළව කැඳවා තිබූ මිල ගණන් විවෘත කිරීම 2018 පෙබරවාරි 14 දින සිදුකර තිබුණ ද එසේ විවෘත කරන ලද මිල ගණන් ඇගයීමට ලක්කොට තාක්ෂණ ඇගයීම් කමිටු තීරණය ලබාදීමට දින 100 කට ආසන්න කාලයක් ප්‍රමාද කොට තිබුණි. | 2018 පෙබරවාරි 14 දින මෙම ප්‍රසම්පාදනයේ මිල ගණන් විවෘත කළ ද 2018 පෙබරවාරි අවසන් සතියේ සිට අනධ්‍යයන කාර්ය මණ්ඩලය දින 60 කට වැඩි කාලයක් වැඩ වර්ජනයකට සහභාගීවීම හේතුවෙන් අදාල විෂයභාර ලිපිකරුවන්ගේ ලේඛන සහාය ලබා ගැනීමේ නොහැකිතාව මත මෙන්ම අදාළ මිල ගණන් කරුවන් පිළිබඳව සේවා පිළිබඳ රහස්‍ය වාර්තා ලබා ගැනීමට ඇතිවූ ප්‍රමාදයන් මෙන්ම සෙසු සම්පාදන කටයුතු ද වැඩවර්ජනයෙන් අනතුරුව එකවර කිරීමට සිදුවීම යන ප්‍රායෝගික හේතු මත මෙම ඇගයීම් ප්‍රමාදය සිදු ව ඇත. | කොමිෂන් සභාවට ආර්ථික වශයෙන් පිරිවැය අවම වන ආකාරයෙන් ප්‍රසම්පාදන කටයුතු සිදු කළ හැකි වන පිරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාල පමාවකින් තොරව සිදුකර අදාළ කමිටු තීරණ ලබාදිය යුතුය. | 2018 පෙබරවාරි 14 දින මෙම ප්‍රසම්පාදනයේ මිල ගණන් විවෘත කළ ද 2018 පෙබරවාරි අවසන් සතියේ සිට අනධ්‍යයන කාර්ය මණ්ඩලය දින 60 කට වැඩි කාලයක් වැඩ වර්ජනයකට සහභාගීවීම හේතුවෙන් අදාල විෂයභාර ලිපිකරුවන්ගේ ලේඛන සහාය ලබා ගැනීමේ නොහැකිතාව මත මෙන්ම අදාළ මිල ගණන් කරුවන් පිළිබඳව සේවා පිළිබඳ රහස්‍ය වාර්තා ලබා ගැනීමට ඇතිවූ ප්‍රමාදයන් මෙන්ම සෙසු සම්පාදන කටයුතු ද වැඩවර්ජනයෙන් අනතුරුව එකවර කිරීමට සිදුවීම යන ප්‍රායෝගික හේතු මත මෙම ඇගයීම් ප්‍රමාදය සිදු ව ඇත.<br>තව දුරටත් ප්‍රසම්පාදන කටයුතු කාල පමාවකින් තොරව සිදු කර අදාළ කමිටු තීරණ ලබා දීම කඩිනම් කිරීමට පියවර ගෙන ඇත. |
| (ඈ)නියැදි පරීක්ෂණයේ දී අනාවරණය වූ පරිදි 2018/2019 වර්ෂයන්හි පවිත්‍රතා සේවා සපයා ගැනීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරවීම, ලංසු කැඳවීම, ලංසු විවෘත කිරීම, ඇගයීමට ලක් කිරීම යන ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා පැවතුණි.එබැවින් නැවත ලංසු කැඳවා තුන්වන අවම මිල ඉදිරිපත් කර තිබූ ලංසුකරු වෙත ලංසුව ප්‍රදානය කිරීම නිසා පවිත්‍රතා සේවා කටයුතු සඳහා රු.1,812,873 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | 2018 වර්ෂයේ පවිත්‍රතා කටයුතු සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ලංසු කැඳවා තෝරා ගන්නා ලද ලංසුකරු ගිවිසුම් ප්‍රකාරව සතුටුදායක සේවයක් නොසැපයීම මත එම කොන්ත්‍රාත්කරුගේ කොන්ත්‍රාත්තුව කොමිෂන් සභාවේ අනුමැතියෙන් අවසන් කරන ලදී. | ලංසු මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුවන් අතරින් සාර්ථක ලංසුකරු තෝරා ගැනීමේදී ඉදිරිපත් කරන ලද ලංසු මිලට අමතරව සමාන ආයතනවලට සපයන ලද සේවාවේ ඵලදායිබව, සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් සාර්ථක තීරණ ලබාදීමට කටයුතු කළ යුතුය. | විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයෙන් යුතුව සහ ආර්ථික වශයෙන් ඵලදායි ලෙස පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. |
| (ඉ) පරිගණක 05 ක් මිලට ගැනීම සඳහා 2017 වර්ෂයේදී මිල ගණන් කැඳවා, සමාලෝචිත වර්ෂයේ දී තාක්‍ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබා දී තිබුණ ද ප්‍රසම්පාදන කමිටුව විසින් එම නිරිදේශය සැලකිල්ලට නොගෙන තාක්‍ෂණික ඇගයීම් කමිටුවේ එක් සාමාජිකයෙකු ඉදිරිපත් කර තිබූ තාක්‍ෂණික හැටළුවක් මත අවම ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. ප්‍රසම්පාදන කමිටුව විසින් නැවත මිල ගණන් කැඳවීමට දී තිබූ නිර්දේශය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.මිලියන 1.2 ක් වැය කර මාස 10ක් සඳහා කුලී පදනම මත පරිගණක ලබාගැනීම සිදුකර තිබුණි. | විගණන වාර්තාවේ සඳහන් කර ඇති පරිදි දෙවන අවම මිල ගණන්කරු ගෙන් කුලී පදනම මත පරිගණක ලබා ගෙන නොමැත. පරිගණක කුලී පදනම මත ලබාගෙන ඇත්තේ අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ Data Core Lanka (Pvt) Ltd.මගිනි. මෙම සියළු විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. | තාක්‍ෂණික ඇගයීම කමිටු නිර්දේශ මත ප්‍රසම්පාදන කටයුතු සිදුකල යුතුය. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කුලී පදනම මත පරිගණක ලබා ගැනීමට කටයුතු කරන ලද්දේ- එම අවස්ථාවේ මුදල් අංශය මගින් හඳුන්වා දෙන ලද ගිණුම්කරණ පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු අඛණ්ඩව කරගෙන යාමේ අවශ්‍යතාවය මතය. ගිණුම්කරණ පද්ධතිය හඳුන්වා දෙන ලද ආයතනය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර ගිවිසුම අනුව එම කාර්යය ප්‍රමාද කිරීමට පද්ධතිය හඳුන්වා දීමට අදළ වූ ප්‍රසම්පාදන තීරණය අනුව කල නොහැකි විය.<br>ඒ අනුව වඩාත් ප්‍රශස්ථ තීරණය ක්‍රියාත්මක කර ඇත. |

| අරමුදලේ නම | අරමුදල් ශේෂය රු. | ආයෝජන ශේෂය රු. | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| Central Research | 5,234,758 | 2,157,131 | 1.) 984.3.2. දරණ කොමිෂන් සභා තීරණයට අනුව රු. 3,077,627/- ක ප්‍රමාණයක් පශ්චාත් උපාධි ප්‍රදාන ( Doctoral Projects) වැය ශීර්ෂය වෙත මාරු කර ඇත.<br>2.)2019 නොවැම්බර් 10 වන දින කල් පිරුණු රු. 2,157,131/- ක මුදලද අදාළ අරමුදලට මාරු කර ඇත. |
| Bond Violation | 1,432,246 | 1,281,705 | ආයෝජනය කිරිම සඳහා ලංසු මිල ගණන් කැඳවීමට ඉදිරිපත් කර ඇත. |
| Tsunami Scholarship | 1,752,477 | 1,211,988 | 990.3.2 දරණ කොමිෂන් සභා තීරණයට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශිෂ්‍යත්ව අරමුදල වෙත මාරු කර ඇත. |
| Universities Scholarship | 1,509,217 | 1,502,612 | මෙම අරමුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශිෂ්‍යත්ව අරමුදල වෙත මාරු කර ඇත. |
| S L Police CWE | 2,364,992 | 2,134,000 | |
| Kathalin Doris | 1,057,277 | 800,000 | මෙම අරමුදලෙන් ප්‍රදානය කර ඇති ශිෂ්‍යත්වවලට ගෙවීම සඳහා මෙම මුදල් ගිණුමේ රඳවා ගෙන ඇති අතර එම මුදල් දෛනිකව Sweeper Account ක්‍රමය යටතේ ආයෝජනය කරනු ලැබේ. |
| Maharaja Trust | 569,602 | 500,000 | |
| S L American Society | 442,595 | 250,000 | |
| Inamura Memorial | 1,191,684 | 1,000,000 | රු.155,292.22 ආයෝජනය කිරිම සඳහා ලංසු මිල ගණන් කැඳවීමට ඉදිරිපත් කර ඇත. |
| Nalani Madugalle | 616,880 | 500,000 | මෙම අරමුදලෙන් ප්‍රදානය කර ඇති ශිෂ්‍යත්වවලට ගෙවීම සඳහා මෙම මුදල් ගිණුමේ රඳවා ගෙන ඇති අතර එම මුදල් දෛනිකව Sweeper Account ක්‍රමය යටතේ ආයෝජනය කරනු ලැබේ. |
| UGC Open Scholarships | 47,382 | 576,426 | මෙම අරමුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ශිෂ්‍යත්ව අරමුදල වෙත මාරු කර ඇත. |
| Flood Relief | 26,566,369 | - | 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 100(2) වගන්තියේ බලතල අනුව මෙම මුදල් 2019 වර්ෂයේ පුනරාවර්තන වියදම් වෙත මාරු කර ඇත. |
| Magu Mends Scholars | 505,814 | 409,255 | මෙම අරමුදලෙන් ප්‍රදානය කර ඇති ශිෂ්‍යත්වවලට ගෙවීම සඳහා මෙම මුදල් ගිණුමේ රඳවා ගෙන ඇති අතර එම මුදල් දෛනිකව Sweeper Account ක්‍රමය යටතේ ආයෝජනය කරනු ලැබේ. |
| raganathna cholars | 1,110,512 | 750,000 | රු. 299,398.99 ක මුදල ආයෝජනය සඳහා ලංසු කැඳවීමට ඉදිරිපත් කර ඇත. |
| ijaya Ialaselcer | 320,550 | | රු.320,550/- ක මුදල ආයෝජනය සඳහා ලංසු කැඳවීමට ඉදිරිපත් කර ඇත. |
| GC cholarships | 16,763,666 | 17,752,232 | - |
| est University | 2,160,958 | 2,000,000 | |
| itsubishi orporate | 3,521,000 | 2,000,000 | රු. 1,521,000/- මුදල විශ්වවිද්‍යාල වෙත ගෙවිය යුතු මුදලක් වන අතර එයින් කොළඹ විශ්වවිද්‍යාලට රු.600,000/- ක මුදලක් ප්‍රතිපූර්ණය සඳහා ඉල්ලුම් කර ඇති අතර අදාළ මුදල් ප්‍රතිපූර්ණය කර ගන්නා මෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලටද ලිඛිතව දැනුම් දී ඇත. |
| itional ience Fund | 1,620,300 | - | 295.03.22 දරණ කොමිෂන් සභා තීරණයට අනුව මෙම මුදල සේවක සංවර්ධන අරමුදල වෙත මාරු කර ඇත. |
| a sandimah holars | | 70,228 | - |
| otal | 68,788,279 | 34,895,577 | - |

# විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

## 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| | සටහන් | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමාන අයිතම | 5 | 20,482,140 | 72,156,016 |
| ලැබිය යුතු ආයෝජන ආදායම | 6 | 236,873,136 | 196,809,752 |
| ලැබිය යුතු දායක මුදල් | 7 | 50,791,661 | 37,698,050 |
| ආයෝජන | 8 | 1,340,000,000 | 675,000,000 |
| | | 1,648,146,938 | 981,663,817 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ආයෝජන | 8 | 7,716,321,550 | 6,218,100,783 |
| ලැබිය යුතු ආයෝජන ආදායම | 6 | 183,965,280 | 612,953,294 |
| | | 7,900,286,830 | 6,831,054,077 |
| මුළු වත්කම් | | 9,548,433,768 | 7,812,717,895 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| විවිධ ණයහිමියෝ | 9 | 1,007,211 | 507,828 |
| සාමාජිකයන්ට ගෙවිය යුතු මුදල් | 10 | 4,797,356 | 2,163,317 |
| අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු මුදල් | 11 | 155,889 | 4,683,124 |
| ගෙවිය යුතු ජීවන වියදම් දීමනාව | 12 | 31,618 | 31,618 |
| ගෙවිය යුතු ආදායම් බදු | 13 | 75,789,629 | 52,087,411 |
| | | 81,781,703 | 59,473,298 |
| මුළු ශුද්ධ වත්කම් | | **9,466,652,065** | **7,753,244,597** |
| සාමාජික අරමුදල හා සංචිත | | | |
| දායක අරමුදල | | 8,722,324,383 | 7,043,473,263 |
| විශ්‍රාම අරමුදල | | 281,196,642 | 248,332,702 |
| සමුච්චිත ආදායම | | 463,131,040 | 461,438,632 |
| අරමුදලේ ශුද්ධ අගය | | **9,466,652,065** | **7,753,244,597** |

අත්සන් කළේ
ආර් ජී.යු රණවීර
ගණකාධිකාරී

අත්සන් කළේ
ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර
ලේකම්

අත්සන් කළේ
මහාචාර්ය මොහාන් ද සිල්වා

අත්සන් කළේ
මහාචාර්ය මලික් රණසිංහ

## විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහාවන හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය

| | දායකයන්ගේ අරමුදල (රුපියල්) | විශ්‍රාමිකයන්ගේ අරමුදල (රුපියල්) | සමුච්චිත අරමුදල (රුපියල්) | එකතුව (රුපියල්) |
|---|---|---|---|---|
| 2017.01.01 දිනට ශේෂය | 5,804,727,361 | 198,242,140 | 390,253,357 | 6,393,222,859 |
| 2017 වර්ෂය සඳහා අතිරික්තය | - | - | 702,289,420 | 702,289,420 |
| ආදායමට ගැළපීම් | (950,242) | - | 950,242 | - |
| වැරදි දායක මුදල් නිවැරදි කිරීම | (11,950) | - | - | (11,950) |
| හිඟ/නොලැබූ දායක මුදල් | 2,364,522 | - | - | 2,364,522 |
| පවත්නා වර්ෂයයේ ආදායමෙන් වන හුවමාරු | - | 8,329,529 | - | 8,329,529 |
| විශ්‍රාමිකයන්ට අදාල දායක මුදල් ලැබීම් | - | 76,269 | - | 76,269 |
| පවත්නා වර්ෂයේ දායකත්ව අරමුදල් | 769,784,377 | - | - | 769,784,377 |
| සම්පූර්ණ දායක මුදල් ආපසු ලබාදීම | (32,102,375) | - | - | (32,102,375) |
| දායක අරමුදල්/විශ්‍රාම අරමුදල වෙත මාරු කිරීම් | (72,739,982) | 72,739,982 | - | - |
| අර්ථ සාධක අරමුදලට මාරු කිරීම් | (40,110,697) | - | - | (40,110,697) |
| 2017 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් ගෙවීම | - | (50,597,359) | - | (50,597,359) |
| විශ්‍රාම අරමුදලේ / දායක අරමුදලේ පොළිය | 612,512,249 | 19,542,140 | (632,054,389) | - |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | 7,043,473,263 | 248,332,702 | 461,438,632 | 7,753,244,597 |
| 2018 වර්ෂය සඳහා අතිරික්තය | - | - | 775,591,633 | 775,591,633 |
| ආදායමට ගැළපීම් | (938,326) | - | 938,326 | - |
| වැරදි දායක මුදල් නිවැරදි කිරීම | (21,762) | - | - | (21,762) |
| හිඟ/නොලැබූ දායක මුදල් | 4,211,133 | - | - | 4,211,133 |
| පවත්නා වර්ෂයයේ ආදායමෙන් වන හුවමාරු | - | 9,601,246 | - | 9,601,246 |
| විශ්‍රාමිකයන්ට අදාල දායක මුදල් ලැබීම් | - | 5,660 | - | 5,660 |
| පවත්නා වර්ෂයයේ දායකත්ව අරමුදල | 1,049,908,010 | - | - | 1,049,908,010 |
| සම්පූර්ණ දායක මුදල් ආපසු ලබාදීම | (50,471,342) | - | - | (50,471,342) |
| දායක අරමුදල/විශ්‍රාම අරමුදල වෙත මාරු කිරීම් | (59,042,755) | 59,042,755 | - | - |
| ව.වි. අර්ථසාධක අරමුදල වෙත මාරු කිරීම් | (17,287,279) | - | - | (17,287,279) |
| 2018 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් ගෙවීම | - | (58,129,830) | - | (58,129,830) |
| විශ්‍රාම අරමුදලේ / දායක අරමුදලේ පොළිය | 752,493,441 | 22,344,110 | (774,837,551) | - |
| | 1,678,851,120 | 32,863,941 | 1,692,408 | 1,713,407,469 |
| 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය | 8,722,324,383 | 281,196,642 | 463,131,040 | 9,466,652,065 |

## විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | | සටහන | 2018 | 2017 |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| ආදායම | | | | |
| ආයෝජන ආදායම | | 14 | 923,990,432 | 733,205,736 |
| අඩු කළා ; | ආදායම් බදු වෙන්කිරීම | | (137,921,120) | (22,039,603) |
| බදු පසු ශුද්ධ ආදායම | | | 786,069,312 | 711,166,133 |
| අඩු කළා: | **වියදම්** | | | |
| | විශ්‍රාම අරමුදලේ ගැලපීම | 15 | 9,601,246 | 8,329,530 |
| | මෙහෙයුම් වියදම් | 16 | 876,433 | 547,183 |
| | | | 10,477,679 | 8,876,713 |
| වියදම් අඩුකල පසු ශුද්ධ ආදායම | | | **775,591,633** | **702,289,420** |
| එකතු කළා: | ආදායමට ගැළපීම් | | **938,326** | **950,242** |
| | ඉදිරියට ගෙනා රඳවා ගත් ලාභය | | 461,438,632 | 390,253,359 |
| බෙදිය හැකි ශුද්ධ ආදායම | | | **1,237,968,590** | **1,093,493,021** |
| අඩු කළා: | සාමාජික පොළී | | | |
| | දායක අරමුදල් සඳහා පොළිය | | 752,493,441 | 612,512,249 |
| | විශ්‍රාම අරමුදල් සඳහා පොළිය | | 22,344,110 | 19,542,140 |
| | | | 774,837,551 | 632,054,389 |
| ඉදිරියට ගෙන ගිය රඳවා ගත් ලාභය | | | **463,131,040** | **461,438,632** |

## විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය | | |
| බදු හා වියදම් පසු ශුද්ධ ආදායම | 775,591,633 | 702,289,420 |
| එකතු කළා/ (අඩු කළා) : | | |
| භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම්/ අයිමිල | 16,224,048 | 14,729,100 |
| විකුණූ භාණ්ඩාගාර බැඳුම්කර මත ලාභය/ අලාභය | - | (190,811) |
| විශ්‍රාම අරමුදලේ ගැලපීම | 9,601,246 | 8,329,530 |
| ආදායම් බදු වෙන් කිරීම් | 137,921,120 | 22,039,603 |
| | 939,338,047 | 747,196,843 |
| කාරක ප්‍රාග්ධනය ක්‍රියාකාරී අරමුදල් වෙනස්වීම් | | |
| ලැබිය යුතු ආයෝජන ආදායම් (වැඩිවීම )/අඩුවීම | 388,924,629 | (139,263,113) |
| විවිධ ණයහිමියන්ගේ වැඩිවීම/ (අඩුවීම) | 499,383 | 57,568 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල්** | **1,328,762,058** | **607,991,297** |
| අඩු කළා ආදායම් බදු ගෙවීම් | (114,218,902) | (12,511,047) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,214,543,157** | **595,480,250** |
| ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය | | |
| ස්ථාවර තැන්පත් කල්පිරීම් | 3,463,000,000 | 150,000,000 |
| ස්ථාවර තැන්පත් වල ආයෝජනය | (4,810,000,000) | (900,000,000) |
| විකුණුම්- භාණ්ඩාගාර බැඳුම්කර | - | 49,544,130 |
| ණයකර මිලදී ගැනීම් | (500,000,000) | - |
| භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීම් | (332,444,815) | (562,303,612) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(2,179,444,815)** | **(1,262,759,482)** |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය | | |
| දායක මුදල් ලැබීම් | 1,041,009,429 | 805,363,096 |
| දායක මුදල් ආපසු ගෙවීම් | (69,651,817) | (72,192,977) |
| ජීවන වියදම් දීමනා ගෙවීම් | - | (44,306) |
| විශ්‍රාම වැටුප් ගෙවීම් | (58,129,830) | (50,597,359) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **913,227,782** | **682,528,454** |
| මුදල් සහ මුදල් සමාන අයිතම වල ශුද්ධ වැඩිවීම | (51,673,876) | 15,249,223 |
| ආරම්භක මුදල් සහ මුදල් සමාන අයිතම | 72,156,016 | 56,906,793 |
| අවසාන මුදල් සහ මුදල් සමාන අයිතම | **20,482,141** | **72,156,016** |
| බැංකු මුදල් | (1,576,849) | (3,917,862) |
| එකතු කළා- අරමුදල් කළමණාකරන ගිණුම් ශේෂ | | |
| කෙටිකාලීන තැන්පතු ආයෝජන | - | 60,000,000 |
| එක් දින රාත්‍රී ආයෝජන | 16,000,000 | 8,000,000 |
| අරමුදල් කළමණාකරන ගිණුම | 6,058,990 | 8,073,878 |
| | **20,482,141** | **72,156,016** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/A/PNF/FA/01/18    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2019 මැයි

ලේකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නීති, රීති හා විධිවිධාන වලට අනුකූල නොවීම

1996 ජනවාරි 03 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පාලනය වන විශ්‍රාම වැටුප් ක්‍රමයක් පිහිටුවිය යුතුය යන යෝජනාව මත මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය 1999 ජුනි 10 දිනැති අංක 747 දරන කොමිෂන් සභා චක්‍රලේඛය පදනම් කර ගෙන ආරම්භ කර පවත්වා ගෙන ගොස් තිබුණි.

එසේ වුවද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 97 වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමනාකාරිත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලියක් සාදනු ලැබිය හැකිව තිබුණ ද මේ දක්වා එසේ නියමාවලියක් සකස් කර ප්‍රකාශයට පත්කර නොතිබුණි.

### 3.2 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්‍රාම වැටුප් ලබන සාමාජික සංඛ්‍යාව 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා 172 ක සිට 279 ක් දක්වා වර්ධනය වී තිබූ අතර, ඔවුන්ට ගෙවන විශ්‍රාම වැටුප්වල වටිනාකම රු.මිලියන 28 ක සිට රු.මිලියන 58 ක් දක්වා වැඩි වී තිබුණි. මේ අනුව විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අරමුදලේ දායකත්වය දිගින් දිගටම වැඩිවන ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය.

(ආ) 2014 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂය අවසාන වනවිට ප්‍රතිලාභීන් නමින් ඇති පෞද්ගලික ගිණුම්වල ශේෂයක් නොමැති වුවද විශ්‍රාම වැටුප් අරමුදලින් විශ්‍රාමවැටුප් ගෙවන සාමාජික සංඛ්‍යාව 33 සිට 60 දක්වා වර්ධනය වී තිබූ අතර ඔවුන් වෙත ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම රු.මිලියන 4.4 ක සිට රු.මිලියන 9.1ක් දක්වා වර්ධනය වී තිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් අරමුදලේ ඉදිරි පැවැත්ම හා සුරක්ෂිතභාවය සඳහා අරමුදලේ සාමාජිකයින්ගේ ජීවන ගණක ඇගයීමක්, (Actuarial Valuation) 2014 වර්ෂයේ සිදුකර තිබුණි. එසේ වුවද ඒ මත පදනම්ව අරමුදලට කළ යුතු ගැලපීම් සිදුකර නොතිබූ අතර 2014 වර්ෂයෙන් පසුව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ජීවන ගණක ඇගයීමක් සිදුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම<br><br>1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 97 වන වගන්තිය<br><br>1999 ජුනි 10 දිනැති අංක 747 දරණ කොමිෂන් සභා චක්‍ර ලේඛය අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පාලනය වන විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කර පවත්වා ගෙන ගොස් තිබුණද පනත ප්‍රකාරව විශ්‍රාම වැටුප් අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමණාකාරිත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලියක් සාදනු ලැබිය හැකිව තිබුණද විගණිත දිනය වූ 2019 මැයි 31 දක්වා නියමාවලියක් සකස් කර ප්‍රකාශයට පත් කර නොතිබුණි. | කෙටුම්පත් විශ්‍රාම වැටුප් නියමාවලිය 2019 මාර්තු 05 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිරීක්ෂනය සඳහා එවන ලදී. එම සංශෝධන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නීති හා ප්‍රලේඛන අංශයේ සහ විශ්‍රාම වැටුප් අංශයේ නිරීක්ෂණ සමඟ නැවත 2019 අප්‍රේල් 01 වන දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවා ඇති අතර නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුවේ අවසාන අනුමැතිය ලැබීමෙන් පසු විශ්‍රාම වැටුප් නියමාවලිය ප්‍රකාශයට පත්කරනු ලැබේ. | අරමුදල විධිමත් කිරීම පරිපාලනය කිරීම සහ එහි ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍යවන නියමාවලිය නොපමාව ප්‍රකාශයට පත් කළ යුතුය | විශ්‍රාම වැටුප් නියමාවලියේ අවසාන කෙටුම්පත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නීති හා ප්‍රලේඛණ අංශයේ නිරීක්ෂණ සමඟ 2019 අප්‍රේල් 01 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවා ඇති අතර, ඒ සඳහා අවසාන අනුමැතිය ලැබීමෙන් පසු ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සලසනු ලැබේ. |

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැ⸺ර් 31 දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශ⸺ සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

| විගණන නිරීක්ෂණය | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | නිර්දේශය | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| 2. මූල්‍ය සමාලෝචනය<br>2.1 මූල්‍ය ප්‍රතිඵල | සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 775,591,633 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.702,289,420 ක් විය.ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 73,302,213 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන ආදායමේ ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | - | විගණන වාර්තාවේ සඳහන් පරිදි වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵල අනුව වර්ෂයේ අතිරික්තය පසුගිය වසරේ අතිරික්තයට වඩා වර්ධනය වීමට ආයෝජන ආදායම් ඉහල යාම ප්‍රධාන වශයෙන්ම හේතු විය. |
| 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය | සමාලෝචිත වර්ෂයේ ආයෝජන ආදායම වූ රු. 923,990,432 ක් පෙර වර්ෂයේ ආයෝජන ආදායම වූ රු. 733,205,736 ක් හා සැසඳීමේ දී රු. 190,784,696 ක් හෙවත් සියයට 26 ක ඉහළ යාමක් නිරීක්ෂණය විය. භාණ්ඩාගාර බැඳුම්කර හා ස්ථාවර තැන්පතු පොලී ආදායම ඉහළ යාම මෙම තත්ත්වය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ වියදම වූ රු.10,477,679 පෙර වර්ෂයේ වියදම වූ රු. 8,876,713 සමඟ සැසඳීමේ දී රු. 1,600,966 ක් හෙවත් සියයට 18 ක වැඩි වීමක් නිරීක්ෂණය විය. විශ්‍රාමිකයන්ගේ අරමුදල් ගිණුම්වලට අදාළව සමාලෝචිත වර්ෂයේ සිදු කර තිබූ ගැලපීම් වටිනාකම ඉහළ යාම මෙම තත්ත්වය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | - | විගණන වාර්තාවේ සඳහන් පරිදි වර්ෂයේ ආයෝජන ආදායම පසුගිය වසරට වඩා 26 % කින් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර හා ස්ථාවර තැන්පතු පොළී ආදායම ඉහළ යාම හේතු වී ඇත. එසේම වර්ෂයේ වියදම් පසුගිය වසරට වඩා 18% කින් වැඩි වීමට විශ්‍රාමිකයන්ගේ ගිණුම් වලට මෙම වසරේ සිදු කර තිබූ ගැලපීම් ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. |
| 2.3 අනුපාත විශ්ලේෂණය | ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ 20.2:1 ක් වූ අතර පසුගිය වර්ෂය හා සැසඳීමේ දී සියයට 22 ක වැඩි වීමක් නිරීක්ෂණය විය. | - | විගණන වාර්තාවේ සඳහන් පරිදි ජංගම අනුපාතය පසුගිය වසරට සාපේක්ෂව 22%කින් ඉහල ගොස් ඇත. |

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
| 3.මෙහෙයුම් සමාලෝචනය<br><br>3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා<br><br>(අ) සේවයෙන් විශ්‍රාම ලබා විශ්‍රාම වැටුප් ලබන සාමාජික සංඛ්‍යාව 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා 172 සිට 279 තෙක් වර්ධනය වී තිබූ අතර ඔවුන්ට ගෙවන විශ්‍රාම වැටුප්වල වටිනාකම ද රු. මිලියන 28 සිට රු. මිලියන 58 දක්වා වැඩි වී තිබුණි. මේ අනුව විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අරමුදලින් දරන ලද ප්‍රමාණය දිගින් දිගටම වැඩිවන ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. | වාර්ෂිකව විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කර විශ්‍රාම යන විශ්‍රාමිකයින් සංඛ්‍යාව වර්ධනය වන නිසා ඔවුන් හට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් මුදල ද වාර්ෂිකව වර්ධනය වී ඇත. | අරමුදලේ සාමාජිකයිගේ ආයු ගණනයක් සිදු කර විශ්‍රාමික ප්‍රතිලාභීන්ගේ ආයු අපේක්ෂණයට අනුව අරමුදලට සිදු කළ යුතු ගැලපීම් සිදු කොට අරමුදලේ සුරක්ෂිතභාවය තහවුරු කළ යුතුය. | (1) වාර්ෂිකව විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කර විශ්‍රාම යන විශ්‍රාමිකයින් සංඛ්‍යාව වර්ධනය වන නිසා ඔවුන් හට ගෙවනු ලබන විශ්‍රාම වැටුප් මුදල ද වාර්ෂිකව වර්ධනය වේ.<br>(2) 2018 දෙසැම්බර් 31 දිනට පවතින සාමාජිකයන්ගේ දත්ත උපයෝගී කරගෙන ජීව දත්ත ගණක ඇගයීමක් මේ වසරේදී කරනු ලබන අතර එම වාර්තාවේ උපදෙස් පදනම් කරගෙන අරමුදලට අවශ්‍ය ගැලපීම් කරනු ලැබේ. |

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | යෝජිත පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය |
|---|---|---|---|
